වී අලෙවි මණ්ඩලය

நெல் சந்தைப்படுத்தல் சபை

PADDY MARKETING BOARD



2018

වාර්ෂික වාර්තාව

ஆண்டறிக்கை

ANNUAL REPORT

වී අලෙවි මණ්ඩලය

நெல் சந்தைப்படுத்தல் சபை

PADDY MARKETING BOARD

වාර්ෂික වාර්තාව

ஆண்டறிக்கை

ANNUAL REPORT
2018

CM 35959 - 20 (2022/03) රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව

1971 අංක 14 දරන වී අලෙවි මණ්ඩල පනතේ, 31(1) වගන්තිය ප්‍රකාර 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය තුළදී ස්වකීය බලතල, වගකීම්, කාර්යභාරයන්, ප්‍රතිපත්ති හා වැඩසටහන් ක්‍රියාත්මක කිරීම හා ඉටුකිරීම සම්බන්ධයෙන් ගරු කෘෂිකර්ම අමාත්‍යතුමා වෙත ඉදිරිපත් කරනු ලබන වාර්තාවයි.



පටුන පිටුව

- වී අලෙවි මණ්ඩලයේ දැක්ම, මෙහෙවර 1
- 2018 වර්ෂයේ අධ්‍යක්ෂ මණ්ඩලය සහ ජ්‍යෙෂ්ඨ කළමනාකාරීත්වය 2-4
- වී අලෙවි මණ්ඩලයේ සංවිධාන ව්‍යුහය හා කාර්ය මණ්ඩලය පිළිබඳ විස්තරය 5-6
- සභාපතිවරයාගේ සමාලෝචනය 7-9
- වී අලෙවි මණ්ඩලයේ ප්‍රාදේශීය කාර්යාලවල ව්‍යාප්තිය හා ප්‍රාදේශීය කාර්යාලවල ලිපිනයන් 10-11
- වී අලෙවි මණ්ඩලයට අයත් කලාප හැඳින්වීම 12-33
- වී මිලදී ගැනීමේ ප්‍රගතිය හා වී අලෙවි මණ්ඩලය සතු වී තොග තත්ත්වය 34-36
- වී අලෙවි මණ්ඩලය මඟින් සිදු කරන ලද වී තොග විකුණුම් පිළිබඳ තොරතුරු 37
- මූල්‍ය විශේෂතා (2011- 2018) 38
- වී අලෙවි මණ්ඩලය මඟින් වී මිලදී ගැනීම සඳහා ලබා ගත් ණය හා පොලී මුදල් පිළිබඳ විස්තර 39-40
- වී සඳහා වන සහතික මිල (2001 - 2018) 41
- 2018 වර්ෂයේ වී අලෙවි මණ්ඩලය විසින් ඉදිකරන ලද නව ඉදිකිරීම්/ අලුත්වැඩියා කිරීම් 42-43
- 2018 වර්ෂයේ වී අලෙවි මණ්ඩල අධ්‍යක්ෂ මණ්ඩලයේ කාර්යභාරය හා 2018 අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් වාර්තා පිළිබඳ සාරාංශය 44-46
- 2018 වර්ෂයේ ක්‍රියාකාරීත්වය සම්බන්ධයෙන් අභ්‍යන්තර විගණකගේ වාර්තාව 47-61
- තිරසාර සංවර්ධන ඉලක්ක අත්කර ගැනීමේ ප්‍රගතිය 62
- 2018 වී අලෙවි මණ්ඩලයේ වාර්ෂික ගිණුම් 63-91
- විගණකාධිපති වාර්තාව 92-101



දැක්ම

වී සහ සහල් මිලට ගැනීම, ගබඩා කිරීම, සැකසීම හා අලෙවි කිරීම පිළිබඳ ප්‍රමුඛ රාජ්‍ය මැදිහත්කරු වශයෙන් කටයුතු කිරීම

මෙහෙවර

නිෂ්පාදකයා හා පාරිභෝගිකයා යන දෙපාර්ශ්වයම තෘප්තිමත් වන අයුරින් වී සහ සහල් මිලට ගැනීමේ, ගබඩා කිරීමේ, සැකසීමේ හා අලෙවි කිරීමේ ක්‍රියාවලිය දැනුමෙන් හා කුසලතාවයෙන් පරිපූර්ණ වූ කාර්යය මණ්ඩලයක් තුළින් සාර්ථකව ඉටු කිරීම

2. 2018 වර්ෂයේ අධ්‍යක්ෂ මණ්ඩලය සහ ජ්‍යෙෂ්ඨ කළමනාකාරීත්වය

2.1 2018 වර්ෂයේ වී අලෙවි මණ්ඩලයේ අධ්‍යක්ෂ මණ්ඩලය පහත නම් සඳහන් සාමාජික මහත්ම මහත්මීන්ගෙන් සමන්විත විය.

1. එම්. බී. දිසානායක මහතා (86 අධ්‍යක්ෂ මණ්ඩලය - 2018.02.22 සිට 88 අධ්‍යක්ෂ මණ්ඩලය - 2018.05.30 දක්වා)	- සභාපති වී අලෙවි මණ්ඩලය
2 උපාලි මොහොට්ටි මහතා (89 අධ්‍යක්ෂ මණ්ඩලය - 2018.06.29 සිට)	- සභාපති වී අලෙවි මණ්ඩලය
3. එම්. එස්. එම් යූසුෆ් මහතා (89 අධ්‍යක්ෂ මණ්ඩලය - 2018.06.29 සිට)	- උප සභාපති වී අලෙවි මණ්ඩලය
4. එස්. එල්. නසීර් මහතා (86 අධ්‍යක්ෂ මණ්ඩලය - 2018.02.22 සිට)	- සමූපකාර සංවර්ධන කොමසාරිස්, සමූපකාර සංවර්ධන දෙපාර්තමේන්තුව
5. බී. කේ. ආර්. බාලසූරිය මහතා (86 අධ්‍යක්ෂ මණ්ඩලය - 2018.02.22 සිට)	- අධ්‍යක්ෂ, භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුව
6. ජේ. ක්‍රිෂ්ණමූර්ති මහත්මිය (86 අධ්‍යක්ෂ මණ්ඩලය - 2018.02.22 සිට)	- ආහාර කොමසාරිස්, ආහාර කොමසාරිස් දෙපාර්තමේන්තුව
7. ඩී. එම්. එස්. බී. විජේකෝන් මහතා (86 අධ්‍යක්ෂ මණ්ඩලය - 2018.02.22 සිට 88 අධ්‍යක්ෂ මණ්ඩලය - 2018.05.30 දක්වා)	- අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික
8. එච්. එල්. තිසේරා මහතා (86 අධ්‍යක්ෂ මණ්ඩලය - 2018.02.22 සිට 87 අධ්‍යක්ෂ මණ්ඩලය - 2018.03.28 දක්වා)	- අමාත්‍යතුමාගේ උපදේශක
9. ඩී. වී. බන්දුලසේන මහතා (86 අධ්‍යක්ෂ මණ්ඩලය - 2018.02.22 දක්වා පමණි)	- ගොවිජන සංවර්ධන කොමසාරිස් ජනරාල් ගොවිජන සේවා දෙපාර්තමේන්තුව
10. ඩබ්. එම්. එම්. බී. වීරසේකර මහතා (87 අධ්‍යක්ෂ මණ්ඩලය - 2018.03.28 සිට)	- ගොවිජන සංවර්ධන කොමසාරිස් ජනරාල් ගොවිජන සේවා දෙපාර්තමේන්තුව
11. නීතිඥ නොයෙල් පල්ලියගුරු මහතා (92 අධ්‍යක්ෂ මණ්ඩලය - 2018.11.02 සිට)	- අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික

2018 වර්ෂය තුළ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් 10 ක් පවත්වන ලදී. 2018 වර්ෂයේ ද අධ්‍යක්ෂ මණ්ඩලයේ ලේකම් ලෙස නීති නිලධාරි කේ. නිසංසලා දිල්හානි මහත්මිය කටයුතු කරන ලදී.

2.2 2018 වර්ෂයේ වී අලෙවි මණ්ඩලයේ ජ්‍යෙෂ්ඨ කළමනාකාරීත්වය



එස්. එම්. සමන් පාලිත බණ්ඩාර මහතා
නියෝජ්‍ය සාමාන්‍යාධිකාරි (මෙහෙයුම්)



ජේ.පී.එම්.එම්.කේ. ජයවීර මහතා
නියෝජ්‍ය සාමාන්‍යාධිකාරි (මුදල්)



සී.කේ. උඩකුඹුර මහතා
නියෝජ්‍ය සාමාන්‍යාධිකාරි (පරිපාලන)



ඒ. එම්. ජයසිංහ මිය
ගණකාධිකාරි



ඒ.එම්.යූ.එන්. අතපත්තු මහතා
අභ්‍යන්තර විගණක



කේ.එන්. දිල්හානි මිය
නීති නිලධාරි



ආර්.එම්.ඒ. රත්නායක මහතා
ප්‍රාදේශීය කළමනාකරු, පොළොන්නරුව



නිමල් ඒකනායක මහතා
ප්‍රාදේශීය කළමනාකරු, අම්පාර



ඩබ්.ආර්.ඒ. ශාන්ත කුමාර මහතා
ප්‍රාදේශීය කළමනාකරු, උතුර



සුරංග සේනානායක මහතා
ප්‍රාදේශීය කළමනාකරු, දකුණ



ඩබ්.එම්.එන්.ආර්. වීරසේකර මහතා
ප්‍රාදේශීය කළමනාකරු, නැගෙනහිර



ටී.එම්. නිමල් තෙන්නකෝන් මහතා
වැඩබලන ප්‍රාදේශීය කළමනාකරු,
අනුරාධපුර
(2018.01.10 සිට 2018.08.01දක්වා
ප්‍රාදේශීය කළමනාකරු, අනුරාධපුර
(2018.08.01සිට 2018.12.31 දක්වා)

3. 2018 වර්ෂයේ සංවිධාන ව්‍යුහය



3.1 කාර්යය මණ්ඩලය පිළිබඳ විස්තර 2018.12.31 දිනට

අනු අංකය	තනතුරු නාමය	පන්තිය/ ශ්‍රේණිය	වැටුප් කේතය	අනුමත කාර්ය මණ්ඩලය	තත්‍ය කාර්ය මණ්ඩලය	පුරප්පාඩු
ජ්‍යෙෂ්ඨ මට්ටම						
01	සාමාන්‍යාධිකාරී	11 ශ්‍රේණිය	HM 2-2016	01	-	01
02	නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (මෙහෙයුම්)	11 ශ්‍රේණිය	HM 1-1-2016	01	01	-
03	නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (මුදල්)	11 ශ්‍රේණිය	HM 1-1-2016	01	01	-
04	නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (පරිපාලන)	11 ශ්‍රේණිය	HM 1-1-2016	01	01	-
තෘතීය මට්ටම						
05	නීති නිලධාරි	11 ශ්‍රේණිය	MM 1-1-2016	01	01	-
06	අභ්‍යන්තර විගණක	11 ශ්‍රේණිය	MM 1-1-2016	01	01	-
07	ගණකාධිකාරි	11 ශ්‍රේණිය	MM 1-1-2016	01	01	-
08	ප්‍රාදේශීය කළමනාකරු	11 ශ්‍රේණිය	MM 1-1-2016	07	07	-
09	සහකාර ගණකාධිකාරි	11 ශ්‍රේණිය	JM 1-1-2016	07	07	-
10	පද්ධති පරිපාලක	11 ශ්‍රේණිය	JM 1-1-2016	01	01	-
ද්විතීය මට්ටම						
11	සහකාර ප්‍රාදේශීය කළමනාකරු	111 ශ්‍රේණිය	MA 3-2016	120	119	01
12	සභාපතිගේ පුද්ගලික සහකාර	111 ශ්‍රේණිය	MA 2-1-2016	01	01	-
13	ගිණුම් සහකාර	111 ශ්‍රේණිය	MA 2-1-2016	02	02	-
14	කළමනාකරණ සහකාර	111 ශ්‍රේණිය	MA 1-1-2016	64	49	-
15	ගබඩා සහකාර		PL 3- 2016		15	-
ප්‍රාථමික මට්ටම						
16	රියැදුරු	111 ශ්‍රේණිය	PL 3- 2016	08	08	-
17	කාර්යාල කාර්ය සහායක	111 ශ්‍රේණිය	PL 1- 2016	13	13	-
එකතුව				230	228	02

4. සභාපතිවරයාගේ සමාලෝචනය

1971 අංක 14 දරන වී අලෙවි මණ්ඩල පනත යටතේ ස්ථාපිත වී අලෙවි මණ්ඩලයේ ප්‍රධාන කාර්යභාරය පහත සඳහන් පරිදි වේ.

1. වී සහ සහල් මිලදී ගැනීමේ, අලෙවි කිරීමේ, සැපයීමේ සහ බෙදාහැරීමේ ව්‍යාපාරයක් පවත්වා ගෙන යාම.

2. වී සහ සහල් කෙටීමේ, පැහීමේ සහ සකස් කිරීමේ ව්‍යාපාරයක් පවත්වාගෙන යාම.

3. (1) සහ (2) ඡේදයන්හි සඳහන් අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා ආනුෂංගික වන හෝ ඉවහල් විය හැකි වෙනත් යම් ව්‍යාපාරික කටයුත්තක් පවත්වාගෙන යාම; සහ

4. මණ්ඩලය අදහස් කරන පරිදි ව්‍යාපාරික කටයුතු නියමිත ආකාරයෙන් පවත්වාගෙන යාමට අවශ්‍ය යැයි හැඟෙන සියලුම කාර්යයන් ඉෂ්ඨ සිද්ධ කිරීම.

2007 ජූලි 15 වැනි දින අමාත්‍ය මණ්ඩලය විසින් ගනු ලැබූ තීරණයකට අනුව නැවත ස්ථාපිත කරන ලද වී අලෙවි මණ්ඩලය වී මිලදී ගැනීමේ, ගබඩා කිරීමේ, අලෙවි කිරීමේ කාර්යය සඳහා සක්‍රීය ලෙස දායකත්වය සැපයීමට නැවත ආරම්භ කරන ලදී.

2018 වර්ෂයේ සහතික මිල අනුව නිසි ප්‍රමිතියට අනුව සකස් කළ සම්බා හා කීරි සම්බා වී කිලෝවක් රු. 41.00 මිලකට හා නාඩු වී කිලෝවක් රු. 38.00 ක මිලකට වී අලෙවි මණ්ඩලය විසින් මිලදී ගන්නා ලදි. වී අලෙවි මණ්ඩලයට වී ලැබීම අඩු වූවත් නිෂ්පාදන වෙනුවන් ගොවි ජනතාවට හොඳ මිලක් ලබා දීමට හැකි විය. 2018 වර්ෂයේ ශ්‍රී ලංකාවේ වාර්ෂික වී නිෂ්පාදනය මෙ.ටො 3,929,831 ක් පමණ වූ අතර 2018 වර්ෂයේ වී අලෙවි මණ්ඩලය විසින් වී මෙ.ටො. 6,687 ක ප්‍රමාණයක් මිලදී ගන්නා ලදි.

වී මිලදී ගැනීම සඳහා 2008 වර්ෂයේ සිට 2018 වර්ෂය දක්වා මහා භාණ්ඩාගාරයෙන්, ලංකා බැංකුවෙන්, මහජන බැංකුවෙන් හා ජාතික ඉතිරි කිරීමේ බැංකුවෙන් ලබා ගෙන ඇති ණය මුදල රු.මි. 37,205.5 වන අතර 2018 වර්ෂය වන විට ගෙවා ඇති ණය මුදල රු.මි. 19,100.9 ක මුදලකි. 2018.12.31 දිනට ගෙවිය යුතු ණය ප්‍රමාණය වන්නේ රු.මි. 18,104.7 කි.

ආසන්න වසර 06 තුළ වී අලෙවි මණ්ඩලය විසින් මිලදී ගත් වී තොග ප්‍රමාණයන් පහත පරිදි වේ.

කන්නය	මිලදී ගත් වී ප්‍රමාණය (මෙ. ටො.)						
	2012	2013	2014	2015	2016	2017	2018
මහ	115,786	138,650	4,576	148,369	131,981	-	4,605
යල	10,476	94,376	-	175,266	25,447	-	2,082
එකතුව	126,262	233,026	4,576	323,635	157,428	-	6,687



බාධක හා අභියෝග

වී වේලා ගැනීම සඳහාත් වී ප්‍රවාහනය කිරීම සඳහාත් ගොවීන්ට පහසුකම් නොතිබීම, ගබඩා හිස්කර ගැනීමේ පරමාර්ථය සඳහා වී තොග අඩු මිලට වී මෝල් හිමියන් වෙත අලෙවි කිරීමට සිදු වීම, ඇතැම් ගබඩා නිසි ප්‍රමිතියෙන් යුක්ත නොවීම, පුහුණු නිලධාරීන්ගේ හිඟය ආදිය මෙම වර්ෂය තුළ වී අලෙවි මණ්ඩලයට මුහුණ දීමට සිදු වූ බාධක හා අභියෝග ලෙස හඳුන්වා දිය හැකිය.

අනාගත සැලසුම් සකස් කිරීමේදී ගොවි සංවිධාන වල නියෝජිතයින් හා මෝල් හිමියන් සමඟ සාකච්ඡා කර ඔවුන්ගේ අදහස් ද ලබා ගනිමින් එකී සැලසුම් සකස් කිරීමට වී අලෙවි මණ්ඩලය විසින් දැනට පියවර ගෙන ඇත. මීට අමතරව වී අලෙවි මණ්ඩලය ප්‍රධාන වශයෙන් සාක්ෂාත් කර ගැනීමට බලාපොරොත්තු වන අනාගත සැලසුම් පහත පරිදි හඳුන්වාදිය හැකිය.

1. නව නිලධාරීන් බඳවා ගැනීම

වී අලෙවි මණ්ඩලය 2008 වර්ෂයේදී නැවත ස්ථාපිත කිරීමෙන් පසු ක්‍රමිකව ව්‍යුහාත්මක වෙනස්කම් සිදුකරමින් පවතියි. ඒ අනුව මූලික වශයෙන් පරිපාලන අංශයක් ස්ථාපිත කිරීමත්, පද්ධති පරිපාලක තනතුරක් සහ කලාප 07 ආවරණය වන පරිදි සහකාර ගණකාධිකාරි තනතුරු 07ක් ඇති කිරීම හා ඒ සඳහා අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතිය ඇතිව බඳවා ගැනීම් සිදුකර ඇත. තවද, මූලිකව සිදුවිය යුතු ව්‍යුහාත්මක වෙනස්කම් හඳුනා ගනිමින් සුදුසු පරිදි ප්‍රතිව්‍යුහගත කරන යෝජනා සැකසීමට ඇවැසි කටයුතුත් මෙම වර්ෂයේදී අරඹන ලදි.

තවද, කාර්යාල ක්‍රමවේද සහ විධිමත් කළමනාකරණ ක්‍රමවේද හඳුන්වා දීම සහ ක්‍රියාත්මක කිරීම ද මෙම වසර තුළ අවධානය යොමු කරන ලදි.

2. ප්‍රාදේශීය කාර්යාල හා ගබඩා කාර්යාල ඉදි කිරීම

වී අලෙවි මණ්ඩල ගබඩා නවීකරණය සහ නව ගබඩා ඉදි කිරීම සඳහා ප්‍රතිපාදන සීමාසහිතව භාණ්ඩාගාරයෙන් ලබා දෙන බැවින් ප්‍රාදේශීය අවශ්‍යතාවයන් අනුව ප්‍රමුඛතාවය ලබා දෙමින් වී තොග ගබඩා කිරීමට සුදුසු තත්ත්වයට ගබඩා නවීකරණය කරමින් පවති. එමෙන්ම ගොවි ජනතාවට වඩාත්

පහසුවන ආකාරයෙන් වී විකිණීමට අවශ්‍ය වන ස්ථානවල නව වී ගබඩා ඉදිකිරීමට ද සැලසුම් කරමින් පවතී. කලාප තුළ ගබඩා සහ අනෙකුත් ගොඩනැගිලි අලුත්වැඩියා කිරීම් 23 ක් සිදු කරමින් පවතින අතර 2018 වර්ෂයේදී ඒ සඳහා වැය කර ඇති මුදල රු.මි. 14.5 කි.

3. කමත් ඉදිකිරීම

ගොවි මහතුන්ගේ දැඩි ඉල්ලීමක් වූ වී තොග වියළා ගැනීමට අවශ්‍ය කමත් ඉදිකිරීම ද මෙම වර්ෂයේ සිදු වූ තවත් වැදගත් සිදු වීමකි. වී අලෙවි මණ්ඩලයේ ඉඩකඩ පවතින තෝරාගත් ගබඩා භූමි තුළ සියලුම කලාප ආවරණය වන පරිදි කමත් ඉදිකිරීමේ වැඩපිලිවෙළ යටතේ ප්‍රථම අදියර දකුණු කලාපයේ කමත් 04ක් පල්ලේමලල, වීරවිල, කච්චිගල්ආර, කුට්ටිගල යන ගබඩා ආශ්‍රිතව ඉදිකර ඇත. මෙමඟින් වී අලෙවි මණ්ඩලය වෙත වී තොග අලෙවි කිරීමට පැමිණෙන ගොවි මහතුන්ට තම වී අවශ්‍ය ප්‍රමාණයට වියළී නොතිබීම නිසා ගැටලුවක් ඇති වුවහොත් ගබඩා භූමිය තුළම වී තොග වියළීම් සිදුකර අපහසුතාවයකින් තොරව එම වී තොග අලෙවි කර ගැනීමේ හැකියාව ලැබෙනු ඇත.

4. විද්‍යාත්මක ක්‍රම අනුව තොග ගබඩා කිරීම

වී තොග ගබඩා කිරීමේදී 3% කට ආසන්න ප්‍රමාණයක් තොග හානි ලෙස වාර්තා වන බැවින් විද්‍යාත්මක ක්‍රමවේදයන්වලට අනුව වී තොග ගබඩා කිරීමෙන් එම තොග හානිය අවම කර ගැනීමටත්, වාර්ෂික තොග සත්‍යාපන කටයුතු සිදු කිරීමට හැකිවන පරිදි වී තොග නියමු ව්‍යාපෘතියක් ලෙස අට්ටි ගැසීම සිදු කර ඇති බැවින් එම ක්‍රමයට ක්‍රමානුකූලව ඉදිරියේ දී සියලු ගබඩා වල ක්‍රියාත්මක කිරීමටත් බලාපොරොත්තු වේ. එමඟින් සමස්ත තොග හානිය අවම කිරීමට සැලසුම් කර ඇත.

තොග කළමනාකරණය

වී අලෙවි මණ්ඩලය හුදු වාණිජමය ආයතනයක් ලෙස ලාභය උපරිම කර ගැනීමේ අරමුණින් ම කටයුතු නොකෙරෙන අතර, වී ගොවීන් ආරක්ෂා කරමින් ඔවුන්ගේ වී සඳහා ස්ථාවර ඉහළ මිලක් පවත්වා ගැනීම, ආහාර සුරක්ෂිතතාවය තහවුරු කිරීම හා පාරිභෝගිකයින් සඳහා සහනදායී මිලක් ස්ථාපිත කිරීම යන අරමුණු වලට මුල් තැන දී ක්‍රියාත්මක වේ. කෙසේ වුවද, ගබඩා නවීකරණය කොට ගබඩාකරණය විධිමත් කරමින් වී තොග පිළිබඳ සියලු තොරතුරු පරිගණක ජාලගත කර යාවත්කාලීන දත්ත පද්ධතියක් පවත්වා ගනිමින්, රජයට අවම පිරිවැයක් දැරීමට හැකි වන පරිදි සැලසුම්ගත ව්‍යාපාර සැලැස්මකට අනුව ඉදිරි වී තොග බැහැර කිරීමේ ක්‍රමවේදයක් වෙත මණ්ඩලයේ අවධානය යොමු වී ඇත.

සභාපති
වී අලෙවි මණ්ඩලය

5. වී අලෙවි මණ්ඩලයේ ප්‍රාදේශීය කාර්යාලවල ව්‍යාප්තිය



5.1 ප්‍රාදේශීය කාර්යාලවල ලිපිනයන්

01. ප්‍රාදේශීය කළමනාකරු,
වී අලෙවි මණ්ඩලය
උතුරු කලාප කාර්යාලය,
කරඳපොක්කු හන්දිය,
කිලිනොච්චිය.

02. ප්‍රාදේශීය කළමනාකරු,
වී අලෙවි මණ්ඩලය,
පොළොන්නරු කලාප කාර්යාලය,
කදුරුවෙල,
පොළොන්නරුව.

03. ප්‍රාදේශීය කළමනාකරු,
වී අලෙවි මණ්ඩලය,
අනුරාධපුර කලාප කාර්යාලය,
පුරහල පෙදෙස,
2 වන පටුමඟ,
අනුරාධපුර.

04. ප්‍රාදේශීය කළමනාකරු,
වී අලෙවි මණ්ඩලය,
වයඹ කලාප කාර්යාලය,
මිල්ලගොඩ,
නිකවැරටිය.

05. ප්‍රාදේශීය කළමනාකරු,
වී අලෙවි මණ්ඩලය
නැගෙනහිර කලාප කාර්යාලය,
දිස්ත්‍රික් මහලේකම් කාර්යාල පරිශ්‍රය,
ත්‍රිකුණාමලය.

06. ප්‍රාදේශීය කළමනාකරු,
වී අලෙවි මණ්ඩලය,
අම්පාර කලාප කාර්යාලය,
ඉගිණියාගල පාර,
අම්පාර.

07. ප්‍රාදේශීය කළමනාකරු,
වී අලෙවි මණ්ඩලය,
දකුණු කලාප කාර්යාලය,
දෙහිගහලන්ද,
දකුණ.

6. වී අලෙවි මණ්ඩලයට අයත් කලාප හැඳින්වීම

6.1 අනුරාධපුර කලාපය



අනුරාධපුර කලාප කාර්යාලය

අනුරාධපුර දිස්ත්‍රික්කය සහ මාතලේ දිස්ත්‍රික්කයට අයත් දඹුල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය අනුරාධපුර කලාපයට අයත් වේ. මෙම කලාපයට ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස 23ක් සහ ගොවිජන සේවා බලප්‍රදේශ 45 ක් අයත් වේ. කලාවැව, නුවරවැව, නාච්චාදූව, රාජාංගනය, තිසාවැව, වාහල්කඩ, පදවිය, හුරුලුවැව, අභයවැව, මහකනදරාව, මහවිලච්චිය, අංගමුවැව, තුරුවිල, මානන්කට්ටිය, කණ්ඩලම වැනි විශාල ජල ධාරිතාවයකින් යුත් වැව් 15 කින් පමණ අනුරාධපුර කලාපය පෝෂණය වනු ලබයි. මෙම කලාපයේ දළ වශයෙන් කුඹුරු හෙක්ටයාර් 133,984 ක ප්‍රමාණයක් වී වගාව සඳහා යොදා ගනී.

මීට අමතරව ඓතිහාසික අනුරාධපුර පුදබිම කේන්ද්‍ර කර ගනිමින් සංචාරක බංගලාවක් පවත්වාගෙන යනු ලබයි.

- 2018 වර්ෂයේ සිදු වූ වෙනත් විශේෂ වැඩසටහන්

1. වී අලෙවි මණ්ඩලයේ නිලධාරීන් සඳහා ජාතික පසු අස්වනු හා තාක්ෂණ ආයතනයේ පුහුණු වැඩමුළුවක් පැවැත්වීම.
2. 2018 වර්ෂයේ වී අලෙවි මණ්ඩලයේ වාර්ෂික බක්මහ උළෙල පැවැත්වීම.
3. අනුරාධපුර සංචාරක නිවාසය සහ ප්‍රාදේශීය කාර්යාලය අලුත්වැඩියා කිරීම.

2018 වර්ෂයේ වගා කළ භූමි ප්‍රමාණය පිළිබඳ විස්තරය

දිස්ත්‍රික්කය	කන්නය	වී වගා කළ කුඹුරු ඉඩම් ප්‍රමාණය (හෙක්ටයාර්)
අනුරාධපුර	2017/18 මහ	117,872
	2018 යල	50,040
මාතලේ	2017/18 මහ	39,452
	2018 යල	19,058
එකතුව		226,422

අනුරාධපුර කලාපය මඟින් භාවිතා කරන ගබඩාවල හිමිකාරිත්වය පිළිබඳ විස්තර - 2018 වර්ෂය

අනු. අංකය	ගබඩා	හිමිකාරිත්වය	වී අලෙවි මණ්ඩලය සතු ගබඩා ධාරිතාව (මෙ.ටො.)	වී .අ.ම. විසින් පරිහරණය කරන වෙනත් ආයතන සතු ගබඩා ධාරිතාවය (මෙ.ටො.)	වී.අ.ම. සතු වෙනත් ආයතන පරිහරණය කරන ගබඩා ධාරිතාවය (මෙ.ටො.)
1	තලාව 1	වී.අ.ම.	800	-	-
2	තලාව 2	වී.අ.ම.	800	-	-
3	තලාව 3	වී.අ.ම.	800	-	-
4	රාජාංගනය	වී.අ.ම.	1,000	-	-
5	තඹුත්තේගම	වී.අ.ම.	1,500	-	-
6	කටියාව	වී.අ.ම.	1,000	-	-
7	සේනපුර 1	වී.අ.ම.	1,000	-	-
8	සේනපුර 2	වී.අ.ම.	1,000	-	-
9	හොරොව්පොතාන ආමී	වී.අ.ම.	2,000	-	-
10	හොරොව්පොතාන 1	වී.අ.ම.	2,000	-	-
11	කැකිරාව 02	වී.අ.ම.	1,000	-	-
12	කැකිරාව 03	වී.අ.ම.	1,000	-	-
13	නොච්චියාගම 01	වී.අ.ම.	1,000	-	-
14	නොච්චියාගම 02	වී.අ.ම.	1,000	-	-
15	රඹැව	වී.අ.ම.	1,000	-	-
16	නැගම 1	වී.අ.ම.	1,000	-	-
17	පේමඛුව	වී.අ.ම.	1,000	-	-
18	ගලෙන්බිඳුණුවැව 01	වී.අ.ම.	1,000	-	-
19	කහටගස්දිගිලිය	වී.අ.ම.	1,000	-	-
20	යකල්ල	වී.අ.ම.	1,000	-	-
21	හැලඹැව	වී.අ.ම.	1,500	-	-
22	කලාවැව	වී.අ.ම.	1,000	-	-
23	බුල්නෑව 1	වී.අ.ම.	1,000	-	-
24	බුල්නෑව 2	වී.අ.ම.	1,000	-	-
25	බුල්නෑව 3	වී.අ.ම.	2,000	-	-
26	ශ්‍රාවස්තිපුර	වී.අ.ම.	1,000	-	-
27	සේනානායක 01	වී.අ.ම.	400	-	-
28	සේනානායක 02	වී.අ.ම.	2,500	-	-
29	සේනානායක 03	වී.අ.ම.	500	-	-
30	සේනානායක 04	වී.අ.ම.	800	-	-
31	සේනානායක 05	වී.අ.ම.	1,250	-	-

අනු. අංකය	ගබඩා	භිමිකාරිත්වය	වී අලෙවි මණ්ඩලය සතු ගබඩා ධාරිතාව (මෙ.ටො.)	වී .අ.ම. විසින් පරිහරණය කරන වෙනත් ආයතන සතු ගබඩා ධාරිතාවය (මෙ.ටො.)	වී.අ.ම. සතු වෙනත් ආයතන පරිහරණය කරන ගබඩා ධාරිතාවය (මෙ.ටො.)
32	පදවිය	වී.අ.ම.	1,000	-	-
33	වාහල්කඩ ටෙන්ට්	වී.අ.ම.	400	-	-
34	මැදවච්චිය 1	වී.අ.ම.	2,000	-	-
35	කැබතිගොල්ලෑව	වී.අ.ම.	1,200	-	-
36	පදවිපරාක්‍රමපුර 01	වී.අ.ම.	1,000	-	-
37	පදවිපරාක්‍රමපුර 02	වී.අ.ම.	1,000	-	-
38	පදවිපරාක්‍රමපුර 03	වී.අ.ම.	1,000	-	-
39	පදවිපරාක්‍රමපුර 04	වී.අ.ම.	1,000	-	-
40	පැල්වෙහෙර 01	වී.අ.ම.	1,000	-	-
41	පැල්වෙහෙර 02	වී.අ.ම.	1,000	-	-
42	කණ්ඩලම 01	වී.අ.ම.	1,000	-	-
43	කණ්ඩලම 02	වී.අ.ම.	775	-	-
44	කැකිරාව 01	ආහාර දෙපාර්තමේන්තුව	-	2,000	-
45	ගල්කිරියාගම 01	මහවැලි	-	100	-
46	ගල්කිරියාගම 02	මහවැලි	-	100	-
47	ගල්කිරියාගම 03	මහවැලි	-	100	-
48	ගල්කිරියාගම 04	මහවැලි	-	100	-
49	මැඩියාව	මහවැලි	-	200	-
50	ඇදගල 1	මහවැලි	-	200	-
51	ඇදගල 2	මහවැලි	-	200	-
52	පහල හල්මිල්ලෑව 1	මහවැලි	-	100	-
53	පහල හල්මිල්ලෑව 2	මහවැලි	-	100	-
54	පහල හල්මිල්ලෑව 3	මහවැලි	-	100	-
55	පහල හල්මිල්ලෑව 4	මහවැලි	-	1,000	-
56	ඔත්තප්පුව 01	මහවැලි	-	200	-
57	ඔත්තප්පුව 02	මහවැලි	-	200	-
58	ඔත්තප්පුව 03	මහවැලි	-	200	-
59	ඔත්තප්පුව 04	මහවැලි	-	200	-
60	ඔත්තප්පුව 05	මහවැලි	-	200	-
61	ගාලදිවුල්වැව 01	මහවැලි	-	200	-
62	ගාලදිවුල්වැව 02	මහවැලි	-	200	-
63	වාහල්කඩ D2	ප්‍රාදේශීය ලේ.	-	200	-

අනු. අංකය	ගබඩා	භිමිකාරිත්වය	වී අලෙවි මණ්ඩලය සතු ගබඩා ධාරිතාව (මෙ.ටො.)	වී .අ.ම විසින් පරිහරණය කරන වෙනත් ආයතන සතු ගබඩා ධාරිතාවය (මෙ.ටො.)	වී.අ.ම. සතු වෙනත් ආයතන පරිහරණය කරන ගබඩා ධාරිතාවය (මෙ.ටො.)
64	වාහල්කඩ D4	ගොවිජන සංවිධාන	-	200	-
65	ඔයාමඩුව 01	දිස්.ලේ.	-	8,000	-
66	ඔයාමඩුව 02	දිස්.ලේ.	-	8,000	-
67	හොරොව්පොතාන	වී. අ. ම.	-	-	2,000
68	කැකිරාව සහල් මෝල	වී. අ. ම.	-	-	1,000
69	නෑගම 02	වී. අ. ම.	-	-	1,000
70	මැදවච්චිය 02	වී. අ. ම.	-	-	1,000
71	මැදවච්චිය 03	වී. අ. ම.	-	-	2,000
72	මැදවච්චිය 04	වී. අ. ම.	-	-	1,000
73	පහල මාරගහවැව	වී. අ. ම.	-	-	1,500
74	පුලියන්කුලම වී ගබඩාව	වී. අ. ම.	-	-	300
75	ගලෙන්බිඳුණුවැව 02	වී. අ. ම.	-	-	1,000

6.2 වයඹ කලාපය



වයඹ කලාප කාර්යාලය

වී අලෙවි මණ්ඩලයේ වයඹ කලාපය විසින් කුරුණෑගල, පුත්තලම, මාතලේ සහ ගම්පහ යන දිස්ත්‍රික්ක 04 ආවරණය වන පරිදි සිය මෙහෙයුම් කටයුතු සිදු කරයි. කුරුණෑගල දිස්ත්‍රික්කයේ වී මිලදී ගැනීමේ මධ්‍යස්ථාන 07 ක් ද, පුත්තලම දිස්ත්‍රික්කයේ වී මිලදී ගැනීමේ මධ්‍යස්ථාන 05 ක් ද, මාතලේ දිස්ත්‍රික්කයේ වී මිලදී ගැනීමේ මධ්‍යස්ථාන 01 සහ ගම්පහ දිස්ත්‍රික්කයේ වී මිලදී ගැනීමේ මධ්‍යස්ථාන 02 ක් ද සහිත සමස්ත වී මිලදී ගැනීමේ මධ්‍යස්ථාන 15 ක් තුළ වයඹ කලාපය විසින් 2018 වර්ෂයේ වී මිලදී ගැනීමේ කටයුතු සිදු කරනු ලැබීය.

2018 වර්ෂයේ වගා කළ භූමි ප්‍රමාණය පිළිබඳ විස්තරය

දිස්ත්‍රික්කය	කන්නය	වී වගා කළ කුඹුරු ඉඩම් ප්‍රමාණය (හෙක්ටයාර්)
කුරුණෑගල	2017/18 මහ	46,857.8
	2018 යල	16,598
පුත්තලම	2017/18 මහ	11,536
	2018 යල	2,463
මාතලේ	2017/18 මහ	9,240.4
	2018 යල	5,392.8
ගම්පහ	2017/18 මහ	7,932
	2018 යල	2,728
එකතුව		60,748

වයඹ කලාපය මඟින් භාවිතා කරන ගබඩාවල හිමිකාරිත්වය පිළිබඳ විස්තර - 2018 වර්ෂය

අනු අංකය	ගබඩා	හිමිකාරිත්වය	වී අලෙවි මණ්ඩලය සතු ගබඩා ධාරිතාව (මෙ.ටො.)	වී .අ.ම. විසින් පරිහරණය කරන වෙනත් ආයතන සතු ගබඩා ධාරිතාවය (මෙ.ටො.)
1	නිකවැරටිය 01	වී.අ.ම.	500	-
2	නිකවැරටිය 02	වී.අ.ම.	1,000	-
3	නිකවැරටිය 03	වී.අ.ම.	1,500	-
4	නිකවැරටිය 05	වී.අ.ම.	1,000	-
5	නිකවැරටිය 06	වී.අ.ම.	300	-
6	මහව 01	වී.අ.ම.	2,000	-
7	මහව 02	වී.අ.ම.	1,000	-
8	මහව 03	වී.අ.ම.	1,000	-
9	මහව 04	වී.අ.ම.	300	-
10	වරාවැව 01	වී.අ.ම.	1,200	-
11	වරාවැව 02	වී.අ.ම.	800	-
12	ගල්ගමුව	වී.අ.ම.	1,000	-
13	තඹබෝව 01	වී.අ.ම.	1,000	-
14	තඹබෝව 02	වී.අ.ම.	1,000	-
15	ආනමඩුව 01	වී.අ.ම.	1,000	-
16	ආනමඩුව 02	වී.අ.ම.	1,000	-
17	රාජකදළුව	වී.අ.ම.	1,000	-
18	ගලේවෙල 01	වී.අ.ම.	1,000	-
19	ගලේවෙල 02	වී.අ.ම.	1,000	-
20	මරදගහමුල 01	වී.අ.ම.	15,000	-
21	මරදගහමුල 02	වී.අ.ම.	2,000	-

අනු අංකය	ගබඩා	නිෂ්කාරිත්වය	වී අලෙවි මණ්ඩලය සතු ගබඩා ධාරිතාව (මෙ.ටො.)	වී. අ. ම. විසින් පරිහරණය කරන වෙනත් ආයතන සතු ගබඩා ධාරිතාවය (මෙ.ටො.)
22	මා එළිය 1	වී.අ.ම.	1,000	-
23	මා එළිය 2	වී.අ.ම.	1,000	-
24	මා එළිය 3	වී.අ.ම.	1,000	-
25	මහව ආහාර	ආහාර දෙ.	-	1,000
26	පුත්තලම 01	දි.ලේ.	-	2,000
27	ඉපලෝගම	ප්‍රා.ලේ.	-	400
28	මීගලෑව 1	මහවැලි අධිකාරිය	-	150
29	මීගලෑව 2	මහවැලි අධිකාරිය	-	150
30	මීගලෑව 3	මහවැලි අධිකාරිය	-	150
31	වල්පිට 1	ලංකා ආ.ම.	-	1,500
32	වල්පිට 2	ලංකා ආ.ම.	-	1,500
33	ගැට්ටුවාන	ස.තො..ස.	-	1,000

6.3 උතුරු කලාපය



උතුරු කලාප කාර්යාලය

වී අලෙවි මණ්ඩලයේ උතුරු කලාපය යාපනය, කිලිනොච්චිය, වවුනියාව, මුලතිව්, මන්නාරම යන දිස්ත්‍රික්ක 05 න් සමන්විත වන අතර එම දිස්ත්‍රික්කවලට අදාළව පවතින ප්‍රාදේශීය ලේකම් කාර්යාල හා ගොවිජන සේවා මධ්‍යස්ථාන පහත පරිදි වේ.

දිස්ත්‍රික්කය	ප්‍රාදේශීය ලේකම් කාර්යාල ගණන	ගොවිජන සේවා මධ්‍යස්ථාන ගණන
කිලිනොච්චිය	04	08
මුලතිව්	06	10
වවුනියාව	04	08
මන්නාරම	05	12
යාපනය	15	15

උතුරු කලාපය යනු ඉතාමත් වියළි දේශගුණයක් සහිත කලාපයකි. මෙම කලාපයේ වී ගොවිතැන ප්‍රධාන වශයෙන් ඊසානදිග මෝසම් වර්ෂාව මඟින් සිදුකරන අතර නිරිතදිග මෝසම් වර්ෂාව මඟින් ද ඉතා සුළු වශයෙන් ගොවිතැන් කටයුතු සිදු කරයි.

එමෙන්ම මහ කන්නයේ දී කලාපය තුළ වැඩි වශයෙන් වී වගා කටයුතු සිදු වන අතර යල කන්නයේ ජල හිඟය නිසා වගා කටයුතු සීමිත වේ. කලාපයට අයත් දිස්ත්‍රික්ක 05 තුළම මහ කන්නයේ වී ගොවිතැන් කටයුතු සිදු වේ. නමුත් බොහෝවිට යල කන්නයේ දී යාපනය දිස්ත්‍රික්කය තුළ වී ගොවිතැන් කටයුතු සිදු නොවන නමුත් අනෙකුත් දිස්ත්‍රික්ක 04 හි අඩු වැඩි වශයෙන් වී ගොවිතැන් කටයුතු සිදු වේ.

උතුරු කලාපයේ වගා කටයුතු සඳහා යොදාගනු ලබන වාරි යෝජනා හෝ ජල සම්පාදන ක්‍රම එක් එක් දිස්ත්‍රික්කයන්ට අනුව පහත පරිදි හඳුනාගත හැක.

දිස්ත්‍රික්කය	වාරි යෝජනා හෝ ජල සම්පාදන ක්‍රමය
කිලිනොච්චිය	වැසි ජලය සහ ඉරණමඩු වැව් ජලය උපයෝගී කර ගනී.
වවුනියාව	ප්‍රධාන වශයෙන් වැසි ජලය යොදාගන්නා අතර ප්‍රදේශ ආශ්‍රිතව පවතින කුඩා වැව් ජලය මඟින් ද වගා කටයුතු සිදු කරනු ලබයි.
මන්නාරම	ප්‍රධාන වශයෙන් යෝධ වැවෙහි ජලයෙන් වගා කටයුතු සිදු කරන අතර සමහර ප්‍රදේශ වැසි ජලය සහ වගා ළිං මඟින් වගා කටයුතු සඳහා අවශ්‍ය ජලය සම්පාදනය කර ගනී.
මුලතිව්	වැසි ජලය, මුත්තියන්කට්ටු වැව, කුමුලාමුරිප්පු වැව, තන්නිමුරිප්පු වැව යනාදී වැව් සහ ප්‍රදේශවල පවතින කුඩා වැව් මඟින් සපයා ගන්නා ලද ජලය වගා කටයුතු සඳහා යොදා ගනී.
යාපනය	ප්‍රධාන වශයෙන් වැසි ජලය යොදා ගනිමින් වගා කටයුතු සිදු කරයි.

2018 වර්ෂයේ වගා කළ භූමි ප්‍රමාණය පිළිබඳ විස්තරය

දිස්ත්‍රික්කය	කන්නය	වී වගා කළ කුඹුරු ඉඩම් ප්‍රමාණය (හෙක්ටයාර)
වවුනියාව	2017/18 මහ	17,348.8
	2018 යල	481.3
මන්නාරම	2017/18 මහ	16,800
	2018 යල	504
මුලතිව්	2017/18 මහ	17,655.7
	2018 යල	1,790
කිලිනොච්චිය	2017/18 මහ	26,906.4
	2018 යල	787.5
යාපනය	2017/18 මහ	9,907.3
	2018 යල	-
එකතුව		92,181.0

උතුරු කලාපය මඟින් භාවිතා කරන ගබඩාවල හිමිකාරිත්වය පිළිබඳ විස්තර - 2018 වර්ෂය

අනු අංකය	ගබඩා	හිමිකාරිත්වය	වී අලෙවි මණ්ඩලය සතු ගබඩා ධාරිතාව (මෙ.ටො.)	වී .අ.ම. විසින් පරිහරණය කරන වෙනත් ආයතන සතු ගබඩා ධාරිතාවය (මෙ.ටො.)	වී.අ.ම. සතු වෙනත් ආයතන පරිහරණය කරන ගබඩා ධාරිතාවය (මෙ.ටො.)
1	කිලිනොච්චි නගරය	වී.අ.ම.	250	-	-
2	කිලිනොච්චි නගරය	වී.අ.ම.	250	-	-
3	කිලිනොච්චි නගරය	වී.අ.ම.	250	-	-
4	රාමනාදපුරම්	වී.අ.ම.	2,000	-	-
5	කිලිනොච්චි ආර්ථික ම.	වී.අ.ම.	1,000	-	-
6	මාමඩුව	වී.අ.ම.	1,000	-	-
7	වැලිපොළ (අලුත්වැඩියා)	වී.අ.ම.	2,000	-	-
8	තුනුක්කායි 1	වී.අ.ම.	200	-	-
9	තුනුක්කායි 2	වී.අ.ම.	200	-	-
10	මුල්ලියාවේලි 1	වී.අ.ම.	-	-	1,000
11	මුල්ලියාවේලි 2	වී.අ.ම.	1,000	-	-
12	අල්කඩවේලි 1	වී.අ.ම.	1,000	-	-
13	අල්කඩවේලි 2	වී.අ.ම.	1,000	-	-
14	අල්කඩවේලි 3	වී.අ.ම.	1,000	-	-
15	නෙදුන්කේනි	වී.අ.ම.	1,000	-	-
16	විද්‍යාපුරම්	වී.අ.ම.	1,200	-	-
17	වෙප්පම්කුලම් 1	වී.අ.ම.	350	-	-
18	වෙප්පම්කුලම් 2	වී.අ.ම.	825	-	-
19	වෙප්පම්කුලම් 3	වී.අ.ම.	825	-	-
20	වෙප්පම්කුලම් 4	වී.අ.ම.	850	-	-
21	වෙප්පම්කුලම් 5	වී.අ.ම.	150	-	-
22	පාර්ක්රෝඩ් 1	වී.අ.ම.	1,000	-	-
23	පාර්ක්රෝඩ් 2	වී.අ.ම.	1,000	-	-
24	මාන්කුලම්	වී.අ.ම.	200	-	-
25	තන්නිරිට්ටු	ප්‍රා.ලේ.කා	-	800	-
26	සම්පත් නුවර	ප්‍රා.ලේ.කා	-	250	-
27	කන්ඩාවේලි	ගොවිජන සං.	-	1,000	-
28	මුරිප්පු	ගොවිජන සං.	-	300	-
29	පුදුකුඩිඉරිප්පු	ගොවිජන සං.	-	250	-
30	ඕසියර්	ගොවිජන සං.	-	200	-
31	උඩයාර්කට්ටු	ගොවිජන දෙ.	-	200	-
32	නානාට්ටන්	ගොවිජන දෙ.	-	700	-
33	මුලන්ගාවෙල්	ගොවිජන දෙ.	-	400	-
34	වාවකච්චේරි	ගොවිජන දෙ.	-	100	-
35	පුතූර් 1	ගොවිජන දෙ.	-	400	-
36	පුතූර් 2	ගොවිජන දෙ.	-	200	-
37	උඩුවිල්	ගොවිජන දෙ.	-	400	-
38	පුලියම්පොක්කනේ	ගොවිජන දෙ.	-	300	-
39	සම්පත් නුවර 1	මහවැලි	-	150	-

6.4 අම්පාර කලාපය



අම්පාර කලාප කාර්යාලය

අම්පාර කලාපය අම්පාර, මහනුවර හා බදුල්ල යන දිස්ත්‍රික්ක 03 න් සමන්විත වන අතර සේනානායක සමුද්‍රය ඔස්සේ පෝෂණය වන අම්පාර දිස්ත්‍රික්කය සමස්තයක් වශයෙන් ලංකාවේ වැඩිම වී නිෂ්පාදනයක් සිදුකරන ප්‍රදේශය බවට පත්ව ඇත.

අම්පාර කලාපය මඟින් අම්පාර, මහනුවර හා බදුල්ල යන දිස්ත්‍රික්ක 03 යටතේ ගොවිජන සේවා බල ප්‍රදේශ 37 ක් ආවරණය කරනු ලබයි. එම කලාපය තුළ අනෙකුත් කලාපවලට සාපේක්ෂව වැඩි වී ප්‍රමාණයක් මිලදී ගත්ත ද මහා පරිමාණ මෝල් හිමියන් නොමැති බැවින් හා අනෙකුත් කලාපවලට සාපේක්ෂව වෙළෙඳපොල තුළ අම්පාර කලාපයේ වී සඳහා පවතින ඉල්ලුම අඩුවීම හේතුවෙන් වැඩි කාලයක් වී තොග ගබඩා තුළ රඳවා ගැනීමට සිදු වේ. මේ නිසා වී තොග නිකුත් කිරීමේ දී විවිධ ගැටලු වලට මුහුණ දීමට ද සිදු වේ.

2018 වර්ෂයේ වගා කළ භූමි ප්‍රමාණය පිළිබඳ විස්තරය

දිස්ත්‍රික්කය	කන්නය	වී වගා කළ කුඹුරු ඉඩම් ප්‍රමාණය (හෙක්ටයාර්)
අම්පාර	2017/18 මහ	79,316
	2018 යල	43,554
බදුල්ල	2017/18 මහ	9,500
	2018 යල	12,437
මහනුවර	2017/18 මහ	11,271
	2018 යල	4,050
එකතුව		160,128

අම්පාර කලාපය මඟින් භාවිතා කරන ගබඩාවල හිමිකාරිත්වය පිළිබඳ විස්තර

අනු. අංකය	ගබඩා	හිමිකාරිත්වය	වී අලෙවි මණ්ඩලය සතු ගබඩා ධාරිතාව (මෙ.ටො.)	වී අලෙවි මණ්ඩලය විසින් පරිහරණය කරන වෙනත් ආයතන සතු ගබඩා ධාරිතාවය (මෙ.ටො.)
1	අඩ්ඩාලච්චේන	වී.අ. ම.	1,045	-
2	නෙල්ලිකැලේ	වී.අ. ම.	1,800	-
3	තම්බට්ටේ	වී.අ. ම.	2,500	-
4	පොතුවිල් 1	වී.අ. ම.	1,040	-
5	පොතුවිල් 2	වී.අ. ම.	1,040	-
6	මහඔය 1	වී.අ. ම.	1,500	-
7	මහඔය 2	වී.අ. ම.	1,500	-
8	අම්පාර 1	වී.අ. ම.	1,040	-
9	අම්පාර 2	වී.අ. ම.	1,040	-
10	කෝමාරිය 1	වී.අ. ම.	1,040	-
11	කෝමාරිය 2	වී.අ. ම.	1,040	-
12	සමන්තුරේ 01	වී.අ. ම.	1,040	-
13	සමන්තුරේ 02	වී.අ. ම.	1,040	-
14	ගොනාගොල්ල	වී.අ. ම.	1,040	-
15	නින්දවූර් 1	වී.අ. ම.	800	-
16	නින්දවූර් 2	වී.අ. ම.	1,500	-
17	අක්කරේපත්තුව 1	වී.අ. ම.	2,000	-
18	පාලම්කඳවුර 1	වී.අ. ම.	1,045	-
19	පාලම්කඳවුර 2	වී.අ. ම.	1,045	-
20	කොහොඹාන 1	වී.අ. ම.	1,050	-
21	කොහොඹාන 2	වී.අ. ම.	1,050	-
22	සඳුන්පුර	වී.අ. ම.	2,000	-
23	වීරගොඩ 01	වී.අ. ම.	1,040	-
24	වීරගොඩ 02	වී.අ. ම.	1,040	-
25	මොරයාය 1	වී.අ. ම.	1,040	-
26	මොරයාය 2	වී.අ. ම.	1,040	-
27	පල්ලෙවත්ත 1	වී.අ. ම.	1,000	-
28	පල්ලෙවත්ත 2	වී.අ. ම.	1,000	-
29	පල්ලෙවත්ත 3	වී.අ. ම.	1,000	-
30	පල්ලෙවත්ත 4	වී.අ. ම.	1,600	-
31	පල්ලෙවත්ත 5	වී.අ. ම.	1000	-
32	පල්ලෙවත්ත 6	වී.අ. ම.	800	-
33	කොලොන්ගොඩ	වී.අ. ම.	1,040	-
34	මහියංගනය 01	වී.අ. ම.	1,000	-
35	මහියංගනය 02	වී.අ. ම.	1,000	-
36	කරමැටිය 1	වී.අ. ම.	1,040	-
37	කරමැටිය 2	වී.අ. ම.	1,040	-
38	මැදයාය	වී.අ. ම.	1,040	-
39	ගිරාඳුරුකෝට්ටේ 01	මහවැලි	-	1,500
40	ගිරාඳුරුකෝට්ටේ 02	මහවැලි	-	1,500
41	හසලක	වී.අ. ම.	600	-
42	කුමාරිගම	වී.අ. ම.	1,000	-
43	ZD - 02	වී.අ. ම.	1,000	-

අනු. අංකය	ගබඩා	භිමිකාරිත්වය	වී අලෙවි මණ්ඩලය සතු ගබඩා ධාරිතාව (මෙ.ටො.)	වී අලෙවි මණ්ඩලය විසින් පරිහරණය කරන වෙනත් ආයතන සතු ගබඩා ධාරිතාවය (මෙ.ටො.)
44	ZD - 04	වී.අ. ම.	2,000	-
45	ඉගිණියාගල	වී.අ. ම.	600	-
46	දමන 1	වී.අ. ම.	1,000	-
47	දමන 2	වී.අ. ම.	1,000	-
48	ගල්කන්ද	දි.ලේ.කා.	-	450
49	පහළලන්ද	දි.ලේ.කා.	-	450
50	දීසවාපිය	දි.ලේ.කා.	-	2,000
51	පානම	දි.ලේ.කා.	-	1,500
52	පරගහකැලේ	දි.ලේ.කා.	-	1,000
53	පොල්වත්ත	දි.ලේ.කා.	-	1,500
54	මල්වත්ත	දි.ලේ.කා.	-	2,000
55	අක්කරේපත්තුව 2	දි.ලේ.කා.	-	1,500
56	නාවින්දවේලි	දි.ලේ.කා.	-	1.500
57	කොක්නහර	දි.ලේ.කා.	-	1,000
58	සාගම	දි.ලේ.කා.	-	1,000
59	එරගම	දි.ලේ.කා.	-	1,000
60	බුවුන් හංදිය	දි.ලේ.කා.	-	1,400
61	හුලංනුගේ	දි.ලේ.කා.	-	1,000
62	මාතොට්ටම	දි.ලේ.කා.	-	1,500
63	රජගලතැන්න	දි.ලේ.කා.	-	1,000
64	ගුරුපුර	ආහාර දෙ.	-	2,500
65	ලාභුගල 2	ගොවි සේ.	-	1,000
66	වලගම්පුර 1	ගොවි.සං.	-	500
67	ලිහිණියාගම	මහවැලි	-	150
68	විජේපුර	මහවැලි	-	150
69	මුවපැවෙල	මහවැලි	-	150

6.5 දකුණු කලාපය



දකුණු කලාප කාර්යාලය

වී අලෙවි මණ්ඩලයේ දකුණු කලාප කාර්යාලය හම්බන්තොට දිස්ත්‍රික්කයේ අම්බලන්තොට නගරය ආසන්නයේ දෙහිගහලන්ද ප්‍රදේශයේ පිහිටා ඇති අතර, මෙම කලාපය මඟින් හම්බන්තොට, මොනරාගල, රත්නපුර සහ මාතර යන දිස්ත්‍රික්ක 04 ආවරණය කරමින් මෙහෙයුම් කටයුතු සිදු කරනු ලබයි.

වලවේ ගඟ, කිරිදි ඔය ඇතුළුව ප්‍රධාන ගංගා පහකින් මෙන් ම කුඩා හා මධ්‍යම පරිමාණයේ වැව් රාශියකින් ද පෝෂණය වන දකුණු කලාපය පුරා විසිරී සිටින ගොවි මහතුන් එක් ලක්ෂ පහළොස් දහසකට වැඩි ප්‍රමාණයකට සේවය සැපයීමේදී ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස 46 ක් සහ ගොවිජන සේවා මධ්‍යස්ථාන 73 ක් හා සැබැඳිව කටයුතු කරනු ලබයි. දකුණු කලාපයේ වී අලෙවි මණ්ඩලය සතු ගබඩා 31 ක් පවතින අතර එහි ධාරිතාවය මෙ.ටො. 31,400 ක් පමණ වේ. දකුණු කලාප කාර්යාලයේ ප්‍රාදේශීය කළමනාකාරු ප්‍රමුඛ සහකාර ප්‍රාදේශීය කළමනාකරුවන් 11 දෙනෙක් සහ සංවර්ධන නිලධාරීන් 06 දෙනෙක් සමඟ කළමනාකරණ සහකාරවරියන් 03 දෙනෙකු සේවය කරනු ලබයි.

මොනරාගල හා රත්නපුර දිස්ත්‍රික්කයන්හි දකුණු කලාපය සතු සංචාරක බංගලා දෙකක් ඇති අතර, කලාප කාර්යාලය අම්බලන්තොට නගරය ආසන්න දෙහිගහලන්දේ පිහිටා ඇත.

- 2018 වර්ෂයේ සිදු වූ වෙනත් විශේෂ වැඩසටහන්

1. මොනරාගල V 2020 Enterprise Sri Lanka ප්‍රදර්ශනය (ගම්පෙරළිය) වෙනුවෙන් දකුණු කලාපය ප්‍රදර්ශන කුටියක් නිර්මාණය කිරීම. (2018.08.29 සිට 2018.08.31 දක්වා)

2. බණ්ඩාරනායක අනුස්මරණ ජාත්‍යන්තර සම්මන්ත්‍රණ ශාලාවේ පවත්වන ලද කෘෂිකාර්මික නව්‍යකරණය ප්‍රදර්ශනය හා ගොවි උපහාර උළෙල සඳහා 2018.12.11 සිට 2018.12.16 දක්වා ප්‍රදර්ශන කුටිය පවත්වාගෙන යාම.

3. ආහාර ප්‍රවර්ධන වැඩසටහන සඳහා ප්‍රදර්ශන කුටියක් සැකසීම සහ ඉන් ජයග්‍රහණය කිරීම.

2018 වර්ෂයේ වගා කළ භූමි ප්‍රමාණය පිළිබඳ විස්තරය

දිස්ත්‍රික්කය	කන්නය	වී වගා කළ කුඹුරු ඉඩම් ප්‍රමාණය (හෙක්ටයාර්)
හම්බන්තොට	2017/18 මහ	34,457
	2018 යල	32,105
මොනරාගල	2017/18 මහ	29,629
	2018 යල	11,863
රත්නපුර	2017/18 මහ	11,358
	2018 යල	8,822
මාතර	2017/18 මහ	14,500
	2018 යල	1,905
එකතුව		144,639

දකුණු කලාපය මඟින් භාවිතා කරන ගබඩාවල හිමිකාරිත්වය පිළිබඳ විස්තර - 2018 වර්ෂය

අනු අංකය	ගබඩා	හිමිකාරිත්වය	වී අලෙවි මණ්ඩලය සතු ගබඩා ධාරිතාව (මෙ.ටො.)	වී .අ.ම. විසින් පරිහරණය කරන වෙනත් ආයතන සතු ගබඩා ධාරිතාවය (මෙ.ටො.)
1	මුතුකණ්ඩිය 01	වී. අ. ම.	1,000	-
2	මුතුකණ්ඩිය 02	වී. අ. ම.	500	-
3	ඇතිමලේ 1	වී. අ. ම.	1,000	-
4	ඇතිමලේ 2	වී. අ. ම.	300	-
5	වැල්ලවාය	වී. අ. ම.	1,500	-
6	මැදගම	වී. අ. ම.	1,000	-
7	දොඩම්වත්ත 01	වී. අ. ම.	1,000	-
8	දොඩම්වත්ත 02	වී. අ. ම.	1,000	-
9	අලුත්වැව	වී. අ. ම.	1,500	-
10	කල්තොට	වී. අ. ම.	1,000	-
11	කුට්ටිගල 01	වී. අ. ම.	1,000	-
12	කුට්ටිගල 02	වී. අ. ම.	1,000	-
13	කුට්ටිගල 03	වී. අ. ම.	1,000	-
14	මොරකැටිය 01	වී. අ. ම.	1,000	-
15	මොරකැටිය 02	වී. අ. ම.	750	-
16	ඇඹිලිපිටිය	වී. අ. ම.	500	-
17	කව්විගල්ආර 01	වී. අ. ම.	1,000	-
18	කව්විගල්ආර 02	වී. අ. ම.	1,000	-
19	කව්විගල්ආර 03	වී. අ. ම.	1,000	-
20	කව්විගල්ආර 04	වී. අ. ම.	500	-
21	සූරියවැව	වී. අ. ම.	1,000	-
22	යෝධකණ්ඩිය	වී. අ. ම.	1,500	-
23	පල්ලේමලල 1	වී. අ. ම.	1,000	-
24	පල්ලේමලල 2	වී. අ. ම.	600	-

අනු අංකය	ගබඩා	භිමිකාරිත්වය	වී අලෙවි මණ්ඩලය සතු ගබඩා ධාරිතාව (මෙ.ටො.)	වී .අ.ම. විසින් පරිහරණය කරන වෙනත් ආයතන සතු ගබඩා ධාරිතාවය (මෙ.ටො.)
25	වීරකැටිය	වී. අ. ම.	1,000	-
26	දෙහිගහලන්ද 01	වී. අ. ම.	1,000	-
27	දෙහිගහලන්ද 02	වී. අ. ම.	1,000	-
28	දෙහිගහලන්ද 03	වී. අ. ම.	1,000	-
29	වීරවිල 01	වී. අ. ම.	1,000	-
30	වීරවිල 02	වී. අ. ම.	1,000	-
31	අම්බලන්තොට 01	වී. අ. ම.	750	-
32	සිනිමුන්න	වී. අ. ම.	1,500	-
33	මැද්දවත්ත	වී. අ. ම.	2,000	-
34	හුලන්දාව	ආහාර දෙපා.	-	3,000
35	කහදාව	ආහාර දෙපා.	-	800
36	හම්බන්තොට	ආහාර දෙපා.	-	3,000
37	අම්බලන්තොට 02	පොලීසිය	-	1,000

6.6 පොළොන්නරුව කලාපය



පොළොන්නරු කලාප කාර්යාලය

අතීතයේ රජරට නම් වූ ප්‍රදේශයට අයත් වූ ද, වර්තමානයේ උතුරු මැද පළාතට අයත්වන දිස්ත්‍රික්ක දෙකින් එකක් වන මෙම දිස්ත්‍රික්කය ඉතාමත් අගනා ඓතිහාසික පසුබිමකින් යුත් වර්ග කිලෝමීටර 3,466.38 භූමි ප්‍රමාණයක වපසරියකින් සමන්විත වන අතර, ලංකාවේ ප්‍රධාන ගංගාව වූ මහවැලි නදියේ ජලයෙන් පෝෂණය වන්නාවූ වැව් කිහිපයක වාරිමාර්ග පද්ධතිය හේතුවෙන් සශ්‍රීක වූ භූමි ප්‍රදේශයකින් යුත්, වී වගාව ප්‍රධාන ජීවනෝපාය කර ගත් සිංහල, දෙමළ, මුස්ලිම් ජනතාවක් සහෝදරත්වයෙන් ජීවත්වන දිස්ත්‍රික්කයකි.

උතුරු අක්ෂාංශ 7.4 -8.2 හා නැගෙනහිර දේශාංශ 80.4-81.2 අතර පිහිටි පොළොන්නරුව දිස්ත්‍රික්කයට මි.මී. 119.8 ක වාර්ෂික සාමාන්‍ය වර්ෂාපතනයක් ද ලැබෙන අතර වාර්ෂික සාමාන්‍ය උෂ්ණත්වය සෙ.අංශක 33.5 ක් ද වේ. වර්ෂයේ වැඩි කාලයක් වියළි දේශගුණයක් පවතින අතර එහෙයින් වියළි කලාපයට අයත් ප්‍රදේශයක් ලෙස පොළොන්නරු දිස්ත්‍රික්කය හඳුනා ගත හැකිය. උතුරින් අනුරාධපුර දිස්ත්‍රික්කයට ද, නැගෙනහිරින් ත්‍රිකුණාමලය හා මඩකලපුව දිස්ත්‍රික්කවලට ද, දකුණින් අම්පාර දිස්ත්‍රික්කයට ද, බස්නාහිරින් මාතලේ දිස්ත්‍රික්කයට ද, මායිම්ව පිහිටා ඇත.

එසේම කඩිනම් මහවැලි යෝජනා ක්‍රමයට ඇතුළත් වූ මහවැලි බී, සී, ජී, සහ ඩී කලාප ද, පිහිටා ඇති පොළොන්නරුව දිස්ත්‍රික්කය තුළ පරාක්‍රම සමුද්‍රය, මින්නේරිය, ගිරිතලේ, කවුඩුල්ල වැනි දැකුම්කළු වැව් සහ මාදුරු ඔය සහ මිනනේරිය සහ කවුඩුල්ල වැනි අභය භූමි කිහිපයකින් ද සමන්විත වේ.

වී අලෙවි මණ්ඩලය පොළොන්නරුව ප්‍රාදේශීය කාර්යාලයේ ප්‍රාදේශීය කළමනාකරු යටතේ සහකාර ප්‍රාදේශීය කළමනාකරුවන්, සංවර්ධන නිලධාරීන්, කළමනාකරණ සහකාර, ගබඩා සහකාර වශයෙන් නිලධාරීන් 29 දෙනෙකු සේවයේ නියුතු වේ. ප්‍රාදේශීය කාර්යාලය කදුරුවෙල නගරයේ පිහිටා ඇති අතර, ගබඩාවන් මාතලේ දිස්ත්‍රික්කයේ විල්ගමුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය පොළොන්නරුව දිස්ත්‍රික්කයේ සියලුම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස ආවරණය වන පරිදි පිහිටා ඇත. ඒ අනුව වී මිලදී ගැනීම සඳහා වී අලෙවි මණ්ඩලය සතු ගබඩා 37 කි. මෙයට අමතරව මහවැලි අධිකාරියෙහි හා පුද්ගලික අංශයේ ගබඩාවන්ද වී මිලදී ගැනීමේ කටයුතු සඳහා භාවිතා කරනු ලබයි. 2006 වර්ෂයේ කෘෂි නිෂ්පාදන අලෙවි අධිකාරිය නමින් ආරම්භ කළ වී අලෙවි මණ්ඩලය මුල් ම වර්ෂයේදී දිවයිනට ම වැඩි ම වී ප්‍රතිශතයක් පොළොන්නරුව කලාපය විසින් ගොවි ජනතාවගෙන් මිලදී ගන්නා ලදි. දැනට ගොවිජන සේවා බලප්‍රදේශ 12 ක් පොළොන්නරුව දිස්ත්‍රික්කයේ ඇති අතර, මාතලේ දිස්ත්‍රික්කයේ ද හෙට්ටිපොල හා හඳුන්ගමුව ගොවිජන සේවා බලප්‍රදේශ 02 ක් පොළොන්නරුව කලාපය යටතේ පාලනය වේ. මෙහි කෘෂි කර්මාන්තයේ වී වගාව සඳහා වගා කරන බිම් ප්‍රදේශ හෙක්ටයාර් 80,000 ක් පමණ වේ. මෙම කලාපය තුළ එක් කන්නයක දී වී මෙ.ටො. 320,000 ක පමණ අස්වැන්නක් අපේක්ෂා කරනු ලබයි.

2018 වර්ෂයේ වගා කළ භූමි ප්‍රමාණය පිළිබඳ විස්තරය

දිස්ත්‍රික්කය	කන්නය	වී වගා කළ කුඹුරු ඉඩම් ප්‍රමාණය (හෙක්ටයාර්)
පොළොන්නරුව	2017/18 මහ	65,129.47
	2018 යල	66,773.14
මාතලේ	2017/18 මහ	17,600
	2018 යල	11,860
එකතුව		161,362.61

පොළොන්නරුව කලාපය මඟින් භාවිතා කරන ගබඩාවල හිමිකාරිත්වය පිළිබඳ විස්තර - 2018 වර්ෂය

අනු. අංකය	ගබඩා	හිමිකාරිත්වය	වී අලෙවි මණ්ඩලය සතු ගබඩා ධාරිතාව (මෙ.ටො.)	වී .අ. ම. විසින් පරිහරණය කරන වෙනත් ආයතන සතු ගබඩා ධාරිතාවය (මෙ.ටො.)
1	කදුරුවෙල 01	වී.අ.ම.	1,000	-
2	කදුරුවෙල 02	වී.අ.ම.	1,000	-
3	කදුරුවෙල 03	වී.අ.ම.	1,000	-
4	කදුරුවෙල 04	වී.අ.ම.	3,000	-
5	ජයන්තිපුර 01	වී.අ.ම.	1,000	-
6	ජයන්තිපුර 02	වී.අ.ම.	1,000	-
7	තල්පොත 01	වී.අ.ම.	1,000	-
8	තල්පොත 02	වී.අ.ම.	1,000	-
9	අභයපුර	වී.අ.ම.	1,000	-
10	පන්සල්ගොඩැල්ල	වී.අ.ම.	2,000	-
11	වීරපුර	වී.අ.ම.	1,500	-
12	විජයපුර	වී.අ.ම.	1,040	-
13	මැදිරිගිරිය	වී.අ.ම.	1,300	-
14	කුසුම්පොකුණ	වී.අ.ම.	1,500	-
15	අඹගස්වැව	වී.අ.ම.	1,000	-
16	හිඟුරක්ගොඩ 01	වී.අ.ම.	2,000	-
17	හිඟුරක්ගොඩ මල් ෆාම් 06	වී.අ.ම.	1,000	-
18	මඩුදමන	වී.අ.ම.	1,000	-
19	බකමූණ	වී.අ.ම.	1,000	-
20	09 කණුව	වී.අ.ම.	1,000	-
21	ZD 01	වී.අ.ම.	1,000	-
22	ZD 02	වී.අ.ම.	750	-
23	ZD 03	වී.අ.ම.	1,000	-
24	ZD 04	වී.අ.ම.	2,000	-
25	විජයබාපුර	වී.අ.ම.	1,000	-
26	මනම්පිටිය 01	වී.අ.ම.	1,000	-
27	මනම්පිටිය 02	වී.අ.ම.	1,000	-
28	වැලිකන්ද 01	වී.අ.ම.	1,300	-
29	සිරිපුර	වී.අ.ම.	150	-
30	වෙහෙරගල	වී.අ.ම.	100	-
31	දියබෙදුම	වී.අ.ම.	1,000	-
32	හෙට්ටිපොල 01	වී.අ.ම.	1,000	-
33	හෙට්ටිපොල 02	වී.අ.ම.	1,000	-
34	හෙට්ටිපොල 03	වී.අ.ම.	1,000	-
35	හඳුන්ගමුව	වී.අ.ම.	1,000	-
36	අභයපුර සමුපකාර	සමුපකාර	-	2,000

6.7 නැගෙනහිර කලාපය



නැගෙනහිර කලාප කාර්යාලය

වර්ෂ 2011 ක් වූ ජුනි මස 10 දින ත්‍රිකුණාමලය දිස්ත්‍රික් ලේකම් කාර්යාල පරිශ්‍රය තුළ වී අලෙවි මණ්ඩලයේ නැගෙනහිර කලාප කාර්යාලය ආරම්භ කරන ලදී. මෙම කලාපය මඩකලපුව හා ත්‍රිකුණාමලය යන දිස්ත්‍රික්ක 02 ආවරණය කිරීම සිදු කරනු ලබයි.

ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස 11 හා ග්‍රාම නිලධාරි වසම් 230 කින් යුක්ත වන අතර ගොවි ජනසේවා මධ්‍යස්ථාන 22 ක්ද හෙක්ටයාර 97,796.25 ක ගොවීන් 44,003 ක් පමණ වගා කටයුතු සිදු කරනු ලැබීය. මඩකලපුව දිස්ත්‍රික්කය තුළ ගොවිජන සේවා මධ්‍යස්ථාන 16 කින් ද, හෙක්ටයාර 25,858ක ගොවීන් 23,377 ක් පමණ වගා කටයුතු සිදු කරනු ලැබීය.

2018 වර්ෂයේ වගා කළ භූමි ප්‍රමාණය පිළිබඳ විස්තරය

දිස්ත්‍රික්කය	කන්නය	වී වගා කළ කුඹුරු ඉඩම් ප්‍රමාණය (හෙක්ටයාර්)
ත්‍රිකුණාමලය	2017/18 මහ	41,493.3
	2018 යල	16,340.1
මඩකලපුව	2017/18 මහ	70,000
	2018 යල	20,000.20
එකතුව		147,833.6

වී අලෙවි මණ්ඩලය භාවිතයේ ඇති නැගෙනහිර කලාපයේ ගබඩා

අනු. අංකය	ගබඩා	හිමිකාරිත්වය	වී අලෙවි මණ්ඩලය සතු ගබඩා ධාරිතාව (මෙ.ටො.)	වී .අ.ම. විසින් පරිහරණය කරන වෙනත් ආයතන සතු ගබඩා ධාරිතාවය (මෙ.ටො.)
1	ස්වර්ණජයන්තිපුර	වී.අ.ම.	500	-
2	කන්තලේ 01	වී.අ.ම.	800	-
3	කන්තලේ 02	වී.අ.ම.	1,000	-
4	කන්තලේ 03	වී.අ.ම.	800	-
5	කන්තලේ 04	වී.අ.ම.	1,000	-
6	කල්ලාරු 1	වී.අ.ම.	1,000	-
7	කල්ලාරු 2	වී.අ.ම.	1,000	-
8	කිලිවෙට්ටි	වී.අ.ම.	500	-
9	මැදවච්චිය	වී.අ.ම.	200	-
10	ගෝමරන්කඩවල	වී.අ.ම.	1,000	-
11	සූරන්ගල් PMB	වී.අ.ම.	450	-
12	තඹලගමුව 01	වී.අ.ම.	500	-
13	තඹලගමුව 02	වී.අ.ම.	1,000	-
14	තඹලගමුව 03	වී.අ.ම.	1,000	-
15	ලව්ලේන් 01	වී.අ.ම.	2,000	-
16	ලව්ලේන් 02	වී.අ.ම.	2,000	-
17	ලව්ලේන් 03	වී.අ.ම.	500	-
18	ලව්ලේන් 04	වී.අ.ම.	500	-
19	ලව්ලේන් 05	වී.අ.ම.	500	-
20	ලව්ලේන් 06	වී.අ.ම.	500	-
21	ලව්ලේන් 07	වී.අ.ම.	550	-
22	ලව්ලේන් 08	වී.අ.ම.	550	-
23	පදවි ශ්‍රී පුර	වී.අ.ම.	730	-
24	සූරන්ගල් FO	ගොඃසං	-	250
25	කලුවන්චිකුඩි 01	සමුපකාරය	-	200
26	කලුවන්චිකුඩි 02	සමුපකාරය	-	75
27	පෝරතිව්	සමුපකාරය	-	300
28	අරසඩිතිව් 1	සමුපකාරය	-	200
29	අරසඩිතිව් 2	සමුපකාරය	-	100
30	මනල්පෙඩ්ඩි	දි. ලේ කා.	-	500
31	කපුවත්ත	දි. ලේ කා.	-	500
32	කරදියනාරු	දි. ලේ කා.	-	500
33	තුම්පන්තරනි	දි. ලේ කා.	-	500
34	පන්කුලම	වී. අ. ම.	500	-
35	පුලිපන්වකල් 01	දි. ලේ කා.	-	500
36	පුලිපන්වකල් 02	දි. ලේ කා.	-	400
37	ස.තො.ස.	ස.තො.ස.	-	400

7.1 වී මිල්දී ගැනීමේ ප්‍රගතිය

2017/18 මහ කන්නයේ වී මිල්දී ගැනීමේ ප්‍රගතිය (දිස්ත්‍රික්ක අනුව)

දිස්ත්‍රික්කය		නාඩු (කි.ග්‍රෑ)	සම්බා (කි.ග්‍රෑ)	කීරි සම්බා (කි.ග්‍රෑ)	එකතුව	
					ප්‍රමාණය (කි.ග්‍රෑ)	වටිනාකම (රු.)
1	පොළොන්නරුව	-	-	-	-	-
2	අම්පාර	**32,250**	-	-	**32,250**	**1,225,500.00**
3	මාතලේ	-	-	-	-	-
4	කුරුණෑගල	-	-	-	-	-
5	පුත්තලම	-	-	-	-	-
6	මහනුවර	-	-	-	-	-
7	බදුල්ල	-	-	-	-	-
8	අනුරාධපුරය	-	-	-	-	-
9	හම්බන්තොට	**3,353,985**	-	-	**3,353,985**	**127,451,430.00**
10	මොනරාගල	**720,350**	-	-	**720,350**	**27,373,300.00**
11	රත්නපුර	**389,850**	-	-	**389,850**	**14,814,300.00**
12	මාතර	-	-	-	-	-
13	කිලිනොච්චි	-	-	-	-	-
14	මුලතිව්	-	-	-	-	-
15	වව්නියා	-	-	-	-	-
16	යාපනය	-	-	-	-	-
17	මන්නාරම	-	-	-	-	-
18	මඩකලපුව	**108,600**	-	-	**108,600**	**4,126,800.00**
19	ත්‍රිකුණාමලය	-	-	-	-	-
මුළු එකතුව		**4,605,035**	-	-	**4,605,035**	**174,991,330.00**

2018 යල කන්නයේ වී මිලදී ගැනීමේ ප්‍රගතිය (දිස්ත්‍රික්ක අනුව)

දිස්ත්‍රික්කය		නාඩු (කි.ග්‍රෑ.)	සම්බා (කි.ග්‍රෑ.)	කීරි සම්බා (කි.ග්‍රෑ.)	එකතුව	
					ප්‍රමාණය (කි.ග්‍රෑ.)	වටිනාකම (රු.)
1	පොළොන්නරුව	-	-	-	-	-
2	අම්පාර	**827,250**	**4,450**	-	**831,700**	**31,617,950.00**
3	මාතලේ	-	-	-	-	-
4	කුරුණෑගල	-	-	-	-	-
5	පුත්තලම	-	-	-	-	-
6	මහනුවර	-	-	-	-	-
7	බදුල්ල	-	-	-	-	-
8	අනුරාධපුරය	-	-	-	-	-
9	හම්බන්තොට	**916,290**	**700**	-	**916,990**	**34,847,720.00**
10	මොනරාගල	**28,000**	-	-	**28,000**	**1,064,000.00**
11	රත්නපුර	**29,450**	-	-	**29,450**	**1,119,100.00**
12	මාතර	**22,500**	-	-	**22,500**	**855,000.00**
13	කිලිනොච්චි	-	-	-	-	-
14	මුලතිව්	**22,550**	-	-	**22,550**	**856,900.00**
15	වව්නියා	-	-	-	-	-
16	යාපනය	-	-	-	-	-
17	මන්නාරම	-	-	-	-	-
18	මඩකලපුව	**230,800**	-	-	**230,800**	**8,770,400.00**
19	ත්‍රිකුණාමලය	-	-	-	-	-
	මුළු එකතුව	**2,076,840**	**5,150**	-	**2,081,990**	**79,131,070.00**

7.2 අලෙවි මණ්ඩලය සතු වී තොග තත්ත්වය (2018.12.31 දිනට)

විස්තරය	කීරි සම්බා/ (කි.ග්‍රෑ.)	සම්බා (කි.ග්‍රෑ.)	නාඩු (කි.ග්‍රෑ.)	එකතුව (කි.ග්‍රෑ)
ආරම්භක තොගය 2018.01.01 දිනට	717,955.0	21,971,086.0	64,288,047.0	86,977,088.0
මිලදී ගැනීම්				
- 2017/18 මහ කන්නය	-	-	4,605,035	4,605,035
- 2018 යල කන්නය	-	5,150	2,076,840	2,081,990
එකතුව	717,955.0	21,976,236.0	70,969,922.0	93,664,113.0
නිකුත් කිරීම්				
මුදලට වී විකිණීම	376,180.0	58,743.0	102,823.5	537,746.5
අවසන් තොගය – 2018.12.31 දිනට	**341,775.0**	**21,917,493.0**	**70,867,098.5**	**93,126,366.5**
තොග ඌණතාවය	**304,890.5**	**21,711,742.9**	**63,916,821.0**	**85,933,454.4**
භෞතික අවසන් තොගය – 2018.12.31 දිනට	**36,884.5**	**205,750.1**	**6,950,277.5**	**7,192,912.1**

7.3 වී අලෙවි මණ්ඩලය මඟින් සිදු කරන ලද වී තොග විකුණුම් පිළිබඳ තොරතුරු

වර්ෂය	මුදලට විකිණීම (මෙ.ටො)	සමුපකාර තොග වෙළඳ සංස්ථාවට වී නිකුත් කිරීම (මෙ.ටො)	අපනයනය කිරීම් (මෙ.ටො)	ලෝක ආහාර වැඩ - සටහනට ලබාදීම (මෙ.ටො)
2013	107,011.0	143,479.0	-	4,860.0
2014	6,144.0	37,632.0	2,531.0	5,497.0
2015	13,670.92	-	-	-
2016	258,172.20	25,903.39	-	5,232.25
2017	60,638.78	99,427.39	-	2,530.0
2018	537.7	-	-	-



08. මූල්‍ය විශේෂතා (2011 - 2018)

රු. මි.

විස්තරය	2011	2012	2013	2014	2015	2016	2017	2018
ආදායම	3,500.20	3,617.88	7,878.87	1,554.51	697.18	9,161.35	7,424.98	31.02
මිලදී ගැනුම් - වී තොග	2,278.20	3,636.89	7,755.26	148.66	14,794.58	6,188.17	-	254.12
දළ ලාභය/ (අලාභය)	249.64	(1,440.93)	(121.98)	(237.02)	(799.15)	(4,518.26)	684.94	23.08
පරිපාලන, මූල්‍ය හා අනෙකුත් වියදම්	367.85	630.64	1,674.62	983.562	1,106.79	1,504.09	1,334.67	1,477.50
ශුද්ධ ලාභය/ (අලාභය)	264.13	(1,996.23)	(1,036.23)	(1,126.93)	(1,773.17)	(5,894.29)	(462.11)	(1,185.10)
වී මිල්දී ගැනීම සඳහා ප්‍රතිපාදන ලැබීම්								
මහා භාණ්ඩාගාරය	700.00	100.00	250.00	-	6,943.00	-	-	250.0
ලංකා බැංකුව	410.40	914.80	1,150.00	-	5,128.00	4,100.00	-	-
මහජන බැංකුව	106.30	311.80	1,296.00	-	3,178.00	2,698.20	-	-
ජාතික ඉතිරි කිරීමේ බැංකුව	-	725.90	584.20	-	-	-	-	-
ප්‍රාදේශීය සංවර්ධන බැංකුව	-	250.00	398.90	-	-	-	-	-
ණය ගැතියෝ								
සමූපකාර තොග වෙළඳ සංස්ථාව	341.39	1,587.08	1,404.92	462.59	462.59	462.69	2,867.19	1,467.19
ආහාර දෙපාර්තමේන්තුව	611.99	470.95	440.55	425.95	425.95	425.95	425.95	425.95
ලංකා ස.තො.ස.	90.41	49.94	79.93	77.53	77.53	77.53	77.53	77.53
ණය හිමියෝ								
මහා භාණ්ඩාගාරය	1,900.00	2,000.00	2,250.00	2,250.00	8,489.10	7,067.90	6,434.55	6,684.55
ලංකා බැංකුව	2,185.20	3,100.00	4,115.89	3,129.78	8,257.78	9,580.88	8,589.02	8,572.95
මහජන බැංකුව	1,354.45	1,553.74	2,651.99	2,314.94	5,492.94	5,013.14	2,944.52	2,846.71
ජාතික ඉතිරි කිරීමේ බැංකුව	47.80	725.95	1,142.96	1,000.00	1,000.00	-	-	-
ප්‍රාදේශීය සංවර්ධන බැංකුව	-	241.99	416.13	-	-	-	-	-
මහා භාණ්ඩාගාර ප්‍රතිපාදන								
ප්‍රාග්ධන වියදම් සඳහා	182.90	112.00	80.00	175.00	155.00	150.00	150.00	131.75
පුනරාවර්තන වියදම් සඳහා	25.00	35.35	40.00	66.50	67.50	88.00	96.00	177.5
ප්‍රාග්ධන වැය භාවිතය								
නව ඉදි කිරීම් සඳහා	126.70	85.50	48.00	63.00	-	54.41	54.57	31.05
ගබඩා අලුත්වැඩියා කිරීම් සඳහා	52.30	25.10	27.00	105.00	92.00	45.81	35.36	58.67
ස්ථාවර වත්කම් මිලදී ගැනීම් සඳහා	3.90	1.40	5.00	7.00	63.00	49.78	60.07	67.16

09. වී අලෙවි මණ්ඩලය මඟින් වී මිල්දී ගැනීම සඳහා ලබාගත් ණය හා පොලී මුදල් පිළිබඳ විස්තර - 2008 සිට 2018 දක්වා

වර්ෂය	බැංකුව	ආරම්භක ණය ශේෂය රු. මි.	අදාල වර්ෂය තුළ ලබාගත් ණය රු. මි.	ණය මුදලින් පියවා ඇති මුදල රු. මි.	වර්ෂ අවසාන ණය ශේෂය රු. මි.	වර්ෂය සඳහා අදාල පොළිය රු. මි.
2008	මහා භාණ්ඩාගාරය	-	200.0	-	200.0	-
	ලංකා බැංකුව	-	-	-	-	-
	මහජන බැංකුව	-	-	-	-	-
	ජාතික ඉතිරි කිරීමේ බැංකුව	-	-	-	-	-
	ප්‍රාදේශීය සංවර්ධන බැංකුව	-	-	-	-	-
එකතුව		**-**	**200.0**	**-**	**200.0**	**-**
2009	මහා භාණ්ඩාගාරය	200.0	1,060.0	950.0	310.0	-
	ලංකා බැංකුව	-	-	-	-	-
	මහජන බැංකුව	-	-	-	-	-
	ජාතික ඉතිරි කිරීමේ බැංකුව	-	-	-	-	-
	ප්‍රාදේශීය සංවර්ධන බැංකුව	-	-	-	-	-
එකතුව		**200.0**	**1,060.0**	**950.0**	**310.0**	**-**
2010	මහා භාණ්ඩාගාරය	310.0	1,300.0	310.0	1,300.0	-
	ලංකා බැංකුව	-	2,250.0	-	2,250.0	46.1
	මහජන බැංකුව	-	1,500.0	3.0	1,497.0	29.2
	ජාතික ඉතිරි කිරීමේ බැංකුව	-	1,000.0	732.2	267.8	5.3
	ප්‍රාදේශීය සංවර්ධන බැංකුව	-	400.0	19.6	380.4	7.4
එකතුව		**310.0**	**6,450.0**	**1,064.8**	**5,695.2**	**88.0**
2011	මහා භාණ්ඩාගාරය	1,300.0	700.0	100.0	1,900.0	-
	ලංකා බැංකුව	2,250.0	410.4	475.3	2,185.1	186.5
	මහජන බැංකුව	1,497.0	106.3	248.8	1,354.4	120.8
	ජාතික ඉතිරි කිරීමේ බැංකුව	267.8	-	220.0	47.8	-
	ප්‍රාදේශීය සංවර්ධන බැංකුව	380.4	-	380.4	-	0.1
එකතුව		**5,695.2**	**1,216.7**	**1,424.5**	**5,487.4**	**307.3**
2012	මහා භාණ්ඩාගාරය	1,900.0	100.0	-	2,000.0	-
	ලංකා බැංකුව	2,185.1	914.8	-	3,099.9	234.1
	මහජන බැංකුව	1,354.4	311.8	112.5	1,553.7	135.8
	ජාතික ඉතිරි කිරීමේ බැංකුව	47.8	725.9	47.8	725.9	92.8
	ප්‍රාදේශීය සංවර්ධන බැංකුව	-	250.0	8.0	242.0	48.5
එකතුව		**5,487.4**	**2,302.5**	**168.3**	**7,621.6**	**511.2**

වර්ෂය	බැංකුව	ආරම්භක ණය ශේෂය රු. මි.	අදාල වර්ෂය තුළ ල බාගත් ණය රු. මි.	ණය මුදලින් පියවා ඇති මුදල රු. මි.	වර්ෂ අවසාන ණය ශේෂය රු. මි.	වර්ෂය සඳහා අදාල පොළිය රු. මි.
2013	මහා භාණ්ඩාගාරය	2,000.0	250.0	-	2,250.0	-
	ලංකා බැංකුව	3,099.9	1,150.0	134.1	4,115.8	434.4
	මහජන බැංකුව	1,553.7	1,296.0	265.4	2,584.3	255.7
	ජාතික ඉතිරි කිරීමේ බැංකුව	725.9	584.2	167.0	1,143.0	169.7
	ප්‍රාදේශීය සංවර්ධන බැංකුව	242.0	398.9	224.8	416.1	53.0
එකතුව		**7,621.6**	**3,679.1**	**791.3**	**10,509.3**	**912.8**
2014	මහා භාණ්ඩාගාරය	2,250.0	-	-	2,250.0	-
	ලංකා බැංකුව	4,115.8	-	986.1	3,129.7	378.5
	මහජන බැංකුව	2,584.3	-	337.1	2,247.2	274.1
	ජාතික ඉතිරි කිරීමේ බැංකුව	1,143.0	-	143.0	1,000.0	148.8
	ප්‍රාදේශීය සංවර්ධන බැංකුව	416.1	-	416.1	0.0	20.9
එකතුව		**10,509.3**	**-**	**1,882.3**	**8,626.9**	**822.3**
2015	මහා භාණ්ඩාගාරය	2,250.0	6,943.0	703.6	8,489.4	-
	ලංකා බැංකුව	3,129.7	5,128.0	-	8,257.7	447.2
	මහජන බැංකුව	2,247.2	3,178.0	-	5,425.2	358.7
	ජාතික ඉතිරි කිරීමේ බැංකුව	1,000.0	-	-	1,000.0	145.6
එකතුව		**8,627.0**	**15,249.0**	**703.6**	**23,172.4**	**951.5**
2016	මහා භාණ්ඩාගාරය	8,489.4	-	1,421.2	7,068.2	-
	ලංකා බැංකුව	8,257.7	4,100.0	2,776.9	9,580.8	666.6
	මහජන බැංකුව	5,425.2	2,698.2	3,178.0	4,945.4	631.6
	ජාතික ඉතිරි කිරීමේ බැංකුව	1,000.0	-	1,000.0	0.0	33.9
එකතුව		**23,172.4**	**6,798.2**	**8,376.1**	**21,594.5**	**1,332.0**
2017	මහා භාණ්ඩාගාරය	7,068.2	0	633.3	6,435.0	0
	ලංකා බැංකුව	9,580.8	0	991.8	8,589.0	923.5
	මහජන බැංකුව	4,945.4	0	2,001.0	2,944.5	218.0
එකතුව		**21,594.5**	**0**	**3,626.1**	**17,968.5**	**1,141.5**
2018	මහා භාණ්ඩාගාරය	6,434.9	**250.0**	**-**	**6,684.9**	**-**
	ලංකා බැංකුව	8,589.0	**-**	**16.1**	**8,572.9**	**890.0**
	මහජන බැංකුව	2,944.5	**-**	**97.8**	**2,846.7**	**328.0**
එකතුව		**17,968.4**	**250.0**	**113.9**	**18,104.4**	**1,218.1**

10. වී සඳහා වන සහතික මිල (2001 - 2018)

වර්ෂය	කන්නය	කිලෝවක මිල (රු.)		
		කීරි සම්බා	සම්බා	නාඩු
2001	2000/01 මහ	13.50	13.50	12.50
	2001 යල	13.50	13.50	12.50
2002	2001/02 මහ	14.50	14.50	13.50
	2002 යල	14.50	14.50	13.50
2003	2002/03 මහ	14.50	14.50	13.50
	2003 යල	14.50	14.50	13.50
2004	2003/04 මහ	15.50	15.50	14.50
	2004 යල	15.50	15.50	14.50
2005	2004/05 මහ	16.50	16.50	15.50
	2005 යල	16.50	16.50	15.50
2006	2005/06 මහ	16.50	16.50	15.50
	2006 යල	16.50	16.50	15.50
2007	2006/07 මහ	17.50	17.50	16.50
	2007 යල	17.50	17.50	16.50
2008	2007/08 මහ	22.00	22.00	20.00
	2008 යල	30.00	30.00	28.00
2009	2008/09 මහ	30.00	30.00	28.00
	2009 යල	30.00	30.00	28.00
2010	2009/10 මහ	30.00	30.00	28.00
	2010 යල	30.00	30.00	28.00
2011	2010/11 මහ	30.00	30.00	28.00
	2011 යල	30.00	30.00	28.00
2012	2011/12 මහ	30.00	30.00	28.00
	2012 යල	30.00	30.00	28.00
2013	2012/13 මහ	35.00	35.00	32.00
	2013 යල	35.00	35.00	32.00
2014	2013/14 මහ	35.00	35.00	32.00
	2014 යල	35.00	35.00	32.00
2015	2014/15 මහ	50.00	50.00	45.00
	2015 යල	50.00	50.00	45.00
2016	2015/16 මහ	50.00	41.00	38.00
	2016 යල	50.00	41.00	38.00
2017	2016/17 මහ	41.00	41.00	38.00
	2017 යල	41.00	41.00	38.00
2018	2017/18 මහ	41.00	41.00	38.00
	2018 යල	41.00	41.00	38.00

11. 2018 වර්ෂයේ වී අලෙවි මණ්ඩලයේ නව ඉදිකිරීම් පිළිබඳ විස්තර

අනු අංකය	කලාපය	ගබඩා හා ගොඩනැගිලි ගණන	2018 වර්ෂයේ වෙන් කර ඇති ප්‍රතිපාදන මුදල (රු.මි)	2018 වර්ෂයේ ගෙවා ඇති මුදල් (රු.මි)
ගබඩා සඳහා කමත් 04ක් ඉදිකිරීම - දකුණු කලාපය				
01	පල්ලේමලල ගබඩාව	01	4.9	-
02	වීරවිල ගබඩාව	01	4.8	-
03	කච්චිගල්ආර ගබඩාව	01	4.5	-
04	කුට්ටිගල ගබඩාව	01	4.7	-
ගබඩාව සඳහා කාර්යාල කාමරයක් ඉදිකිරීම				
01	දකුණු කලාපය	02	5.7	2.0
එකතුව		**06**	**24.6**	**2.0**



වීරවිල කමත



පල්ලේමලල කමත



කුට්ටිගල කමත



කච්චිගල්ආර කමත

11.1 2018 වර්ෂයේ වී අලෙවි මණ්ඩලයේ අලුත්වැඩියා කිරීම් පිළිබඳ විස්තර

අනු අංකය	කලාපය	ගබඩා ගණන	ඇස්තමේන්තු ගත මුදල (රු.මි.)	2018 වර්ෂයේ ගෙවා ඇති මුදල් (රු.මි.)
01	අම්පාර කලාපය	03	5.5	0.9
02	පොළොන්නරුව කලාපය	01	5.8	1.1
03	උතුරු කලාපය	02	4.7	0.9
04	වයඹ කලාපය	01	2.0	1.8
05	දකුණු කලාපය	08	3.9	2.8
එකතුව		**15**	**21.9**	**7.5**
වෙනත් ගොඩනැගිලි අලුත්වැඩියා කිරීම්				
01	සංචාරක බංගලාව අලුත්වැඩියා කිරීම්			
	• අම්පාර	02	1.0	1.0
	• දකුණ	01	3.4	1.1
	• අනුරාධපුර	01	2.2	1.0
02	ප්‍රාදේශීය කාර්යාලය අලුත්වැඩියා කිරීම			
	• නැගෙනහිර	01	4.0	0.7
	• වයඹ	01	1.5	1.2
	• අනුරාධපුර	01	4.4	1.3
03	කාර්යාල කාමරය, මුරකුටිය අලුත්වැඩියා කිරීම			
	• වයඹ	01	0.9	0.7
එකතුව		**08**	**17.4**	**7.0**

12. 2018 වර්ෂයේ වී අලෙවි මණ්ඩල අධ්‍යක්ෂ මණ්ඩලයේ කාර්යභාරය

1971 අංක 14 දරන වී අලෙවි මණ්ඩලයේ 13 වන වගන්තිය මඟින් අධ්‍යක්ෂ මණ්ඩල බලතල පිළිබඳව පැහැදිලිව දක්වා ඇත.

යම් නිශ්චල හෝ චංචල දේපලක් අත්පත් කර ගැනීමට අයිතිය ලබා ගැනීම, බද්දට හෝ කුලියට ගැනීම, උකස් කිරීම, විකිණීම හෝ වෙනත් යම් ආකාරයකින් අපහරණය කිරීම, වී සහ සහල් මිලදී ගැනීම, කෙටීම, පැහීම, අලෙවි කිරීම, බෙදා හැරීම, මණ්ඩලයේ ව්‍යාපාරික කටයුතු සඳහා අවශ්‍ය ආනුශාංගික කරුණු ඉටු කිරීම, වී සඳහා සහතික මිලක් නියම කිරීම, මණ්ඩලයේ පරිපාලනමය කටයුතු වලට අදාළ වන නීති රෙගුලාසි සම්පාදනය කිරීම හා ක්‍රියාත්මක කිරීම, ගබඩා පවත්වාගෙන යාමට හා වී අලෙවියට අදාළ අවශ්‍ය පියවර ගැනීම, වී සහ සහල් සැකසීමට අදාළ පර්යේෂණ කටයුතු සිදු කිරීම, වී අලෙවි මණ්ඩලයේ වෙනත් පාර්ශ්වයන් සමඟ ගිවිසුම්වලට එළඹීම ආදී පුළුල් බලතල රාශියක් මෙම වගන්තිය යටතේ අධ්‍යක්ෂ මණ්ඩලය වෙත ලබා දී ඇත.

13. 2018 අධ්‍යක්ෂක මණ්ඩල රැස්වීම් වලදී පහත සඳහන් කරුණුවලට අදාළ තීරණ ගන්නා ලදි.

1. අදාළ දිස්ත්‍රික්කයේ මිල ගණන් යටතේ වී තොග අලෙවි කිරීම.
2. 2018 වර්ෂයේ අභ්‍යන්තර විගණන සැලැස්ම සකස් කිරීම.
3. 2014 වර්ෂයේ සිදු කළ තොග සත්‍යාපනය අනුව හෙළි වී ඇති තොග අඩුවීම්/ ඌණතා පිළිබඳ ක්‍රියාමාර්ග ගැනීම.
4. අබලි වී තොග අලෙවිය/බැහැර කිරීම.
5. වී අලෙවි මණ්ඩලයේ ගබඩාභාර සහකාර ප්‍රාදේශීය කළමනාකාරවරුන්, ප්‍රාදේශීය කළමනාකරුවන්, සංවර්ධන නිළධාරීන් හා ගබඩා සහකාරවරුන්ගේ ආරක්ෂිත තැන්පතු මාසික වැටුපෙන් අයකිරීම.
6. වී අලෙවි මණ්ඩලයේ 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන අනුමත කිරීම.
7. විද්‍යුත් ක්‍රමය භාවිතයෙන් සේවක අර්ථසාධක අරමුදල් සහ සේවක භාර අරමුදල් ගෙවීම් අනුමත කිරීම.
8. 2018 වර්ෂයට අදාළව මු.රෙ. 135 යටතේ අධිකාරියේ බලය පැවරීම.
9. 2017/18 මහ සහ 2018 යල කන්නවල වී මිලදී ගැනීමේ දී ගෙවීම් කිරීම අනෙකුත් ගණුදෙනු සිදු කිරීම සඳහා මූල්‍ය බලතල පැවරීම.
10. වී අලෙවි මණ්ඩලයේ ගිණුම් සඳහා අන්තර්ජාල බැංකුකරණය හරහා නිරීක්ෂණය කිරීමේ පහසුකම ලබා ගැනීම.
11. 2018 වර්ෂය සඳහා වී අලෙවි මණ්ඩලයේ සංශෝධිත සංයුක්ත සැලැස්ම හා සංශෝධිත ප්‍රසම්පාදන සැලැස්ම අනුමත කිරීම.
12. වී විකිණීම සඳහා මිල කමිටුවක් ස්ථාපිත කිරීම.
13. 2018 වර්ෂයේ ප්‍රාග්ධන ප්‍රතිපාදන තුළින් ඉටු කිරීමට අපේක්ෂිත ගබඩා ඉදි කිරීම් සහ අලුත්-වැඩියා කිරීම් කටයුතු සඳහා කෘෂිකර්ම අමාත්‍යාංශයේ ඉංජිනේරු අධ්‍යක්ෂකගේ සහාය ලබා ගැනීම.
14. පද්ධති පරිපාලක JM – 1-1 සහකාර ගණකාධිකාරි තනතුර (JM – 1-1), ප්‍රාදේශීය කළමනාකරු MM – 1-1, සහකාර ප්‍රාදේශීය කළමනාකරු තනතුර (MA-3) සහ කළමනාකරණ සහකාර MA – 1-1 තනතුරු වලට අදාළ පුරප්පාඩු පිරවීම සඳහා නිළධාරීන් බඳවා ගැනීම අනුමත කිරීම.
15. 2018 යල කන්නයේ සහතික මිල සංශෝධනය කිරීම.
16. 2018 වර්ෂයේ සංශෝධිත ක්‍රියාකාරි සැලැස්ම හා ප්‍රසම්පාදන සැලැස්ම අනුමත කිරීම.
17. 2018 වර්ෂය සඳහා වී අලෙවි මණ්ඩලයේ ප්‍රාග්ධන ව්‍යාපෘතිවල වර්තමාන ප්‍රගතිය අධ්‍යයනය කිරීම.

18. අපනයන වැඩපිළිවෙළ සහ සතොස සහ ආහාර දෙපාර්තමේන්තුවට සහල් භාරදීමේ පදනම මත සහල් මෝල් හිමියන් වෙත වී තොග නිදහස් කිරීම මත සහල් භාර නොදුන් මෝල් හිමියන් වී අලෙවි මණ්ඩලය වෙත ගෙවීමට ඇති මුදල් ගෙවීම සම්බන්ධව අවශ්‍ය තීරණ ගැනීම .
19. වී අලෙවි මණ්ඩලයේ වී තොග සහල් කිරීමේ වැඩසටහන අනුමත කිරීම.
20. වී අලෙවි මණ්ඩලය සතු පරිගණකවල මෙහෙයුම් පද්ධතිය හා යෙදුම් මෘදුකාංග භාවිතයට බලපත්‍ර ලබා ගැනීම සඳහා අවශ්‍ය නිර්දේශ ඉදිරිපත් කිරීම.
21. 2019 වර්ෂය සඳහා වී අලෙවි මණ්ඩලයේ ක්‍රියාකාරී සැලැස්ම හා ප්‍රසම්පාදන සැලැස්ම අනුමත කිරීම.

14. 2018 වර්ෂයේ ක්‍රියාකාරීත්වය සම්බන්ධයෙන් අභ්‍යන්තර විගණකගේ වාර්තාව

01. වාර්තාව යොමු කිරීමේ පසුබිම.

අභ්‍යන්තර විගණන අංශයක මූලික කාර්යභාරය වනුයේ අභ්‍යන්තර මෙහෙයුම්, මූල්‍ය සහ පාලන පද්ධතියේ ප්‍රමාණාත්මක හා ගුණාත්මක භාවය නිරන්තරයෙන් ඇගයීමට ලක් කරමින් පාලනාධිකාරිය වෙත තොරතුරු වාර්තා කිරීම සහ හඳුනා නොගත් ගැටළු සඳහා වන විසඳුම් යෝජනා කිරීමයි. ඒ සඳහා වන නීතිමය රාමුව පහත මූලාශ්‍ර වෙතින් සලසා ඇත.

I. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රයේ මුදල් රෙගුලාසි 133.

II. 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ අංක 40 සහ 41දරණ උප වගන්ති.

III. කළමනාකරණ විගණන දෙපාර්මේන්තුව විසින් නිකුත් කර ඇති 2019.01.12 දිනැති අංක DMA/01-2019 දරණ අභ්‍යන්තර විගණන මාර්ගෝපදේශය සඳහා වන කළමනාකරණ විගණන චක්‍රලේඛනය සහ ඒ හා සබැඳිව එම දෙපාර්තමේන්තුව විසින් නිකුත් කර ඇති චක්‍ර ලේඛන.

ඒ අනුව අභ්‍යන්තර විගණන අංශය විසින් අනාවරණය කරගත් කරුණු සහ අදාළ කරුණු සම්බන්ධයෙන් වන විසඳුම් සභාපතිතුමා සහ අධ්‍යක්ෂ මණ්ඩලය වෙත විගණකාධිපතිට ද පිටපත් සහිතව යොමු කරනු ලැබූ අතර එසේ හඳුනාගත් කරුණු සහ යෝජනා කරනු ලැබූ විසඳුම් සම්බන්ධයෙන් ආයතනයේ කළමනාකාරිත්වය විසින් ගනු ලැබූ ක්‍රියාමාර්ග වල ප්‍රගතිය වරින්වර පරීක්ෂාවට ලක් කරනු ලැබූ අතර එමගින් ද විසඳුම් ලැබී නොමැති කරුණු සම්බන්ධයෙන් විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් වෙත කරුණු වාර්තා කරන ලදී.

එම රැස්වීම් වල දී සාකච්ඡා කරනු ලැබූ කරුණු සම්බන්ධයෙන් සහ කමිටුව විසින් ලබා දුන් නිර්දේශ ක්‍රියාත්මක කිරීමේ ප්‍රගතිය සම්බන්ධයෙන් උක්ත නෛතික ප්‍රතිපාදන අනුව වාර්ෂිකව අභ්‍යන්තර විගණක විසින් මෙම වාර්තා පිළියෙල කරනු ලැබේ.

2. අභ්‍යන්තර විගණන අංශය ස්ථාපිත කිරීම.

වී අලෙවි මණ්ඩලය සඳහා අභ්‍යන්තර විගණන අංශයක් ස්ථාපිත කිරීමේ අවශ්‍යතාවය 2012.12.05 දින පැවති පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභා නියෝග අංක 06 මඟින් මෙන්ම විගණකාධිපතිගේ විගණන වාර්තා මඟින් ද වරින් වර පෙන්වා දීමෙන් අනතුරුව 2014.07.01 දින අභ්‍යන්තර විගණකවරයෙකු බඳවා ගෙන අභ්‍යන්තර විගණන අංශය පිහිටුවා ඇත.

2014 වර්ෂයේ දී කළමනාකරණ සහකාර නිලධාරියෙකු ද 2015 වර්ෂයේදී සංවර්ධන නිලධාරියෙකු සහ 2016 වසරේ දී තවත් කළමනාකරණ සහකාර නිලධාරීන් දෙදෙනෙකු ද 2018 වර්ෂයේදී කළමනාකරණ සහකාර නිලධාරීන් දෙදෙනෙක් ද අභ්‍යන්තර විගණන අංශය වෙත අනුයුක්ත කර ඇත. ඒ අනුව 2018 වර්ෂයේ දී අභ්‍යන්තර විගණන අංශයේ මුළු සේවක සංඛ්‍යාව හත (7) කි.

I. ඒ.එම්.යූ එන්. අතපත්තු මයා - අභ්‍යන්තර විගණක

II. ඒ.එම්.එල්.බී. අබේකෝන් මයා - සංවර්ධන නිලධාරි

III. එම්.ඒ.එස්. අනුරාධිකා ද සිල්වා මෙය - සහකාර ප්‍රාදේශීය කළමනාකරු

IV. පසන් මලින්ද පීරිස් මයා - කළමනාකරණ සහකාර

V. චතුරංගා මදුමිණී කොඩිකාරගේ මිය - කළමනාකරණ සහකාර

VI. එච්.එම්. දිනුක මිහිරාන් මයා - කළමනාකරණ සහකාර

VII. ඊ.එස්. වික්‍රමසිංහ මයා - කළමනාකරණ සහකාර

3. විගණන හා කළමනාකරණ කමිටුව පිහිටුවීම සහ විගණන සැලැස්ම ක්‍රියාත්මක කිරීම.

ජාතික විගණන පනත සහ 2010.12.14 දිනැති PED 55 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛනය අනුව විගණන හා කළමනාකරණ කමිටුව පිහිටුවා 2018.01.01 දින සිට 2018.12.31 දින දක්වා වූ වසරක කාල සීමාව සඳහා විගණන සැලැස්ම පිළියෙල කර අධ්‍යක්ෂ මණ්ඩලයේ සහ විගණකාධිපතිගේ අනුමැතිය ලබා ගෙන ක්‍රියාත්මක කර ඇති අතර අදාළ කාලය සඳහා විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් 04ක් පවත්වා ඇත.

I. පළමු රැස්වීම - 2018.03.16

II. දෙවන රැස්වීම - 2018.07.11

III. තෙවන රැස්වීම - 2018.11.19

IV. සිව්වන රැස්වීම - 2019.02.06

අදාළ කාල සීමාව තුළ ආයතනයේ කළමනාකාරීත්වය වෙත යොමු කර ඇති අභ්‍යන්තර විගණන විමසුම් ගණන 31කි. අභ්‍යන්තර විගණන විමසුම්වලට පිළිතුරු සැපයීමේ ප්‍රගතිය ඇමුණුම 01 මඟින් දක්වා ඇත.

එමෙන් ම වසර තුළ දී ජාතික විගණන කාර්යාලය විසින් විගණන විමසුම් 19ක් නිකුත් කර ඇති අතර විගණකාධිපති විගණන විමසුම්වලට පිළිතුරු සැපයීමේ ප්‍රගතිය ඇමුණුම 02 මඟින් දක්වා ඇත.

4. අභ්‍යන්තර විගණකගේ නිරීක්ෂණ හා නිර්දේශ

හඳුනාගත් ක්ෂේත්‍ර අතුරින් පහත ක්ෂේත්‍ර සම්බන්ධයෙන් විශේෂ අවධානයක් යොමු කළ යුතු බව අභ්‍යන්තර විගණක විසින් කළමනාකාරීත්වය, සභාපතිතුමා සහ අධ්‍යක්ෂ මණ්ඩලය වෙත තම නිරීක්ෂණ සහ නිර්දේශ සහිතව විගණන වාර්තා සහ විගණන විමසුම් මඟින් වරින්වර පෙන්වා දී ඇත.

එසේ අභ්‍යන්තර විගණන විමසුම් හා විගණන වාර්තා මඟින් අවධානය යොමුකර තිබූ නිරීක්ෂණ සහ නිර්දේශයන්හි සාරාංශය පහත පරිදි වේ.

4.1 මෙහෙයුම් කටයුතු

I. පරිගණකගත තොග පාලන පද්ධතිය

අක්‍රීය තත්ත්වයේ පවත්නා යෝජිත පරිගණක තොග පාලන පද්ධතිය කඩිනමින් ක්‍රියාත්මක කිරීම සහ වී මිලදී ගැනීම, ගබඩා කිරීම සහ නිකුත් කිරීම සම්බන්ධයෙන් අභ්‍යන්තර පාලන පද්ධතියක් හඳුන්වා දීම.

II. වී මිලදී ගැනීම සහ ගබඩා කිරීම

වී මිලදී ගැනීමට සහ ගබඩාකරණයට අදාළව හඳුනාගත් ගැටලු පහත පරිදි වේ.

- තාවකාලික ගබඩා වශයෙන් රාජ්‍ය වාණිජ විවිධ නීතිගත සංස්ථාව (STC) වෙතින් මිලදී ගත් කොකුන් ගබඩා තුළ ගබඩා කිරීම තුළින් විනාශ වූ වී තොග සහ විනාශ වූ එම ගබඩා සඳහා අලාභ අය කර ගැනීමට කටයුතු කර නොතිබීම.

- ගබඩාවල තත්ත්වය වැඩිදියුණු කර ගැනීම මගින් වී තොග හානි අවම කර ගැනීමට කටයුතු කර නොතිබීම.

- ප්‍රාදේශීය කාර්යාල විසින් ප්‍රධාන කාර්යාල වෙත එවනු ලබන වී තොග වාර්තාවල නිරවද්‍යතාවය පිළිබඳ ගැටලු මතු වීම නිසා ඉහළ නිරවද්‍යතාවයකින් යුත් වී තොග වාර්තා පවත්වා ගැනීම සඳහා ක්‍රමවේදයක් හඳුන්වා දීමේ අවශ්‍යතාව.

- 2018 යල සහ 2018/19 මහ කන්නය සඳහා භාවිතා කිරීම වෙනුවෙන් පොලිසැක් මලු ලක්ෂ 2 ක් මිල දී ගැනීමට අදාළව ක්‍රියාත්මක කරනු ලැබූ මිල දී ගැනීමේ කටයුතු ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයට බැහැරව සිදුකර තිබීම.

- 2018 වර්ෂයේ දී පොලිසැක් මලු මිල දී ගැනීමේ අවස්ථාව වන විට පැවති තොග මට්ටම සහ මිල දී ගැනීමට අපේක්ෂිත මලු ප්‍රමාණය නිසි අධ්‍යයනයක් සිදුකර නොමැති වීම.

  තවද ගබඩා තුළ පොලිසැක් මලු 1,677,477 ක පමණ ප්‍රමාණයක් පවතිද්දී 2017/18 මහ කන්නයේ දකුණු කලාපයේ ගබඩා වෙත වී භාරදුන් ගොවීන් වෙත පොලිසැක් මලු 88,784 ක් සඳහා රුපියල් 2,663,520 ක මුදලක් ගෙවා තිබුණි. ඒ අනුව අවශ්‍ය තරම් පොලිසැක් මලු තොග ආයතනය සතුව පවතිද්දී විධිමත් පරීක්ෂාවකින් තොරව ගොවීන් වෙත ගෙවන ලද එම මුදල නිශ්කාර්යය වියදමකි.

- සුළු වශයෙන් ගබඩාවල පවත්නා වී තොග බැහැර කිරීමකින් තොරව වසර ගණනාවක් පැවතීම හේතුවෙන් විනාශ වීමට ලක්වීම සහ එමගින් අලුතින් මිල දී ගෙන ගබඩා කරනු ලබන වී තොගවල ගුණත්වයට බලපෑමක් සිදුවන බැවින් වී මිල දී ගැනීම ආරම්භයේදී භාවිතා කිරීමට අපේක්ෂිත ගබඩා සම්පූර්ණයෙන් ම හිස් කිරීමෙන් පසු අලුතින් වී මිල දී ගැනීමේ කටයුතු ආරම්භ කිරීම සහ සුළු වශයෙන් ගබඩාවල පවත්නා වී තොග විනාශ වීමට ප්‍රථම බැහැර කිරීමට නිශ්චිත ක්‍රමවේදයක් සකස් කිරීමේ අවශ්‍යතාවය.

III. සේවක පැමිණීම සහ නිවාඩු ලබා ගැනීම

ක්ෂේත්‍ර නිලධාරීන් රාජකාරියට වාර්තා කිරීම සහ නිවාඩු ලබා ගැනීම සම්බන්ධයෙන් අභ්‍යන්තර පාලනය දුර්වල බැවින් ඒ සම්බන්ධයෙන් විධිමත් චක්‍රලේඛන උපදෙස් නිකුත් කිරීමට කටයුතු කිරීමේ අවශ්‍යතාවය.

IV. සංචාරක බංගලා පාලනය

දැනට වී අලෙවි මණ්ඩලය සතු හසලක, මොනරාගල, අනුරාධපුර සහ අම්පාර පිහිටි සංචාරක බංගලාවල පරිපාලනය සහ අදාළ සංචාරක බංගලා ආයතනයට අමතර පිරිවැයක් නොවන පරිදි පවත්වා ගැනීම සහ පිරිවැය ආවරණය කර ගැනීම සඳහා අභ්‍යන්තර විගණනය මඟින් පෙන්වා දී ඇති නිර්දේශ ද ඇතුලත්ව විධිමත් වැඩපිළිවෙලක් සකස් කර පවත්වා ගැනීමේ අවශ්‍යතාව.

V. වාහන පාලනය

- මහා භාණ්ඩාගාර නියෝජ්‍ය ලේකම්ගේ 2017.12.21 දිනැති අංක MF/CG/02/(Cir) දරන වත්කම් කළමනාකරණ චක්‍රලේඛ 02/2017 අනුව රජයේ සෑම ආයතනයක් විසින් ම තමන් විසින් භාවිත කරනු ලබන වාහනවල අයිතිය සම්බන්ධයෙන් පවතින ගැටලු 2018.06.30 දිනට ප්‍රථම නිරාකරණය කර ගැනීම සඳහා උපදෙස් ලබා දී තිබූ නමුත් මෙතෙක් වී අලෙවි මණ්ඩලයට පරම අයිතිය නොමැති වාහන වී අලෙවි මණ්ඩලය වෙත පවරා ගැනීමට කටයුතු කර නොමැති වීම.
- හදිසි අවශ්‍යතාවයක් මත 2017 වර්ෂයේ දී HH – 6041 සහ 65 – 6389 දරන වාහන දෙක පෞද්ගලික රථ ගාලක ගාල්කර තැබීම සිදු කළ ද මේ දක්වා අදාළ වාහන එම ස්ථානයෙන් නිදහස් කර ගෙන වී අලෙවි මණ්ඩලය සතු පරිශ්‍රයක් වෙත ගෙන ඒමට කටයුතු නොකිරීම.
- වී අලෙවි මණ්ඩලය විසින් භාවිතා කරනු ලබන වාහන අයිතියල භාවිතය සහ නඩත්තුව නිසි පරිදි පවත්වා ගැනීමේ අවශ්‍යතාවය.
- ධාවන සටහන් යාවත්කාලීනව පවත්වා ගැනීමේ අවශ්‍යතාවය.
- වාහන සඳහා වන රක්ෂණ සහතිකය සහ වාර්ෂික ආදායම් බලපත්‍ර නියමිත දිනට ලබා ගැනීමට කටයුතු කිරීම.

VI. ක්‍රියාත්මක කරන ලද මතු සඳහන් විවිධ වැඩසටහන් යටතේ වී මෝල් හිමියන්ගෙන් සහ විවිධ ආයතන වෙතින් අයවිය යුතු (2018.12.31 දිනට) මුදල් අයකර ගැනීම සඳහා කඩිනම් ක්‍රියාමාර්ග ගැනීම

➢	ආහාර දෙපාර්තමේන්තුවට සහල් භාරදීමේ වැඩසටහන.	රු.මිලියන	425.95
		රු.මිලියන	10.59
➢	ස.තොස ආයතනය සඳහා වී තොග නිකුත් කිරීම.	රු.මිලියන	1,467.19
➢	ලෝක ආහාර සංවිධානයට සහල් ලබා දීමේ වැඩසටහන.	රු.මිලියන	8.50
➢	සහල් අපනයන වැඩසටහන.	රු.මිලියන	264.15
		රු.මිලියන	211.44
➢	ණය පදනම මත වී තොග නිකුත් කිරීම.	රු.මිලියන	44.40
➢	ලංකා සතොස ආයතනයෙන්	රු.මිලියන	77.52
➢	වී මෝල් හිමියන් වෙතින්	රු.මිලියන	66.39

VII. සතොස ආයතනය වෙත වී තොග නිකුත් කිරීම – 2016 / 2017

ජීවන වියදම් පිළිබඳ අමාත්‍ය මණ්ඩල අනු කමිටුව (Committee of cost of Living), මහා භාණ්ඩාගාරය සහ රේඛීය අමාත්‍යාංශයේ නියමයන් පරිදි ණය ආවරණ ලිපි (Letter of Comfort) මත පදනම්ව සතොස ආයතනය වෙත වී තොග නිකුත් කර ඇත.

- නිකුත් කරනු ලැබූ වී සඳහා මුදල් ලැබෙන තෙක් බැංකු වෙත ණය පොළී ගෙවීමට වී අලෙවි මණ්ඩලයට සිදු වුවද අදාළ පොළී මුදල වී අලෙවි මණ්ඩලය වෙත අයකර ගැනීමේ ක්‍රමවේදයක් සකස් කර නොතිබුණි.

- වී අලෙවි මණ්ඩලය සහ සතොස ආයතන මෙම ක්‍රියාවලියට අදාළව ගිවිසුමකට එළැඹ තිබුණ ද ගිවිසුම අවිධිමත් වීම නිසා වී අලෙවි මණ්ඩලයට ලැබිය යුතු මුදල් නිසි පරිදි නොලැබීම.

- සතොස ආයතනය විසින් වී අලෙවි මණ්ඩලය වෙත ලැබිය යුතු මුදල් ගෙවීම දිගින් දිගට ම පැහැර හැරීම සිදුකර තිබූ අතර ඒ සම්බන්ධයෙන් ක්‍රියාමාර්ග නොගැනීම.

- මේ සම්බන්ධයෙන් මහා භාණ්ඩාගාරය මඟින් නිකුත් කරනු ලැබූ ණය ආවරණ ලිපි (Letter of Comfort) වල කාලය මේ වන විට ඉක්ම ගොස් තිබුණ ද අදාළ කාලය දීර්ඝ කර ගැනීමට මෙතෙක් ක්‍රියා කර නොමැති වීම.

- සතොස ආයතනය මඟින් ක්‍රියාත්මක කරනු ලැබූ මෙම ව්‍යාපෘතියේ වැය බර (ණය පොළිය) වී අලෙවි මණ්ඩලයට දැරීමට සිදුවීම සම්බන්ධයෙන් ප්‍රතිපත්තිමය තීරණයක් ගැනීමට කටයුතු කර නොතිබීම.

VIII. වී මිලදී ගැනීම සහ නිකුත් කිරීමේ ක්‍රියාවලිය තුල දී අලාභ අවම වන මට්ටමට පවත්වා ගැනීම සඳහා යෝජනාවලියක් ඉදිරිපත් කිරීම.

අමාත්‍ය මණ්ඩල අනුමැතිය, ජීවන වියදම් පිළිබඳ අමාත්‍ය මණ්ඩල අනු කමිටුව (Committee of Cost of Living), මහා භාණ්ඩාගාරය සහ රේඛීය අමාත්‍යාංශයේ නියමයන් පරිදි ක්‍රියාත්මක කරන ලද වැඩසටහන් මඟින් (ලෝක ආහාර වැඩසටහන, සහල් අපනයනය සහ ස.තො.ස ආයතනය වෙත වී තොග නිකුත් කිරීම) වී අලෙවි මණ්ඩලයට සිදුවූ මූල්‍ය අලාභය මහා භාණ්ඩාගාරය හෝ අදාළ පාර්ශව වෙතින් පූර්ණය කර ගැනීමට කටයුතු කිරීමේ අවශ්‍යතාව ය.

IX. ගබඩා පරිපාලනය

- ගබඩා පරිපාලනය සම්බන්ධයෙන් විධිමත් අභ්‍යන්තර පාලන ක්‍රමවේදයක් ස්ථාපිත කිරීම හා ගබඩා පාලනය සම්බන්ධයෙන් උපදෙස් නිසි පරිදි ගබඩා භාර නිලධාරීන් වෙත නිකුත් කිරීමේ (ගබඩා පාලන අත්පොතක් ලෙස) අවශ්‍යතාව ය.
- සෑම ගබඩාවක් ම ආවරණය වන පරිදි වාර්ෂිකව භෞතික තොග ගණනයක් සිදු කිරීම සහ එහිදී ගණනය කරනු ලබන සත්‍ය භෞතික තොගය අවසන් ගිණුම් සඳහා ඇතුලත් කිරීම.
- ගබඩා පාලනය, කෘෂිකාර්මික ප්‍රමිතීන් මැනීම සඳහා අවශ්‍ය නව තාක්ෂණික උපකරණ හා මඟ පෙන්වීම (තාක්ෂණික දැනුම) අදාළ ප්‍රමිතීන් සම්බන්ධව කටයුතු කරන රාජ්‍ය ආයතනවලින් ලබා ගැනීම.
- ගබඩාකර තැබීමේදී ස්වාභාවිකව වී තොග වියළීම මඟින් වන තොග බර අඩුවීම සඳහා නිශ්චිත විද්‍යාත්මක පදනමක්/සම්මතයක් ගොඩනැගීම.
- ගබඩාවල සිදුකරනු ලබන වී තොග වංචා, ඌණතා සහ අඩුමාණ කඩිනමින් හඳුනා ගැනීමට සහ අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීමට සහ අවශ්‍ය ක්‍රමවේදයන් ස්ථාපිත කිරීම සහ 2017 වර්ෂයේ දී සිදු කරනු ලැබූ වී තොග සත්‍යාපනයේ දී හඳුනාගත් කරුණු සම්බන්ධයෙන් කඩිනම් ක්‍රියාමාර්ග ගැනීම.
- වී අලෙවි මණ්ඩලය විසින් දැනට භුක්ති විඳිනු ලබන ගබඩා, ඉඩම් සහ දේපල සම්බන්ධයෙන් වන නීත්‍යානුකූල අයිතිය වී අලෙවි මණ්ඩලයට ලබා ගැනීමට කටයුතු කිරීම.

X. 2016 වර්ෂයේ දී වී අලෙවි මණ්ඩලය වෙත පවරා ගත් මරදගහමුල පිහිටි පිළිවෙලින් මෙ.ටොන් 2,000 සහ 15,000 ක් වන ගබඩා සඳහා රාජ්‍ය ඉංජිනේරු සංස්ථාව වෙත රු. මිලියන 34.45 ක් ගෙවා තිබුණ ද අදාළ ඉඩම මේ වනතුරු වී අලෙවි මණ්ඩලය වෙත පවරා ගැනීමට කටයුතු කර නොතිබීම සහ අදාළ දේපල ඌණ උපයෝජිත මට්ටමේ පැවතීම.

XI. වී අලෙවි මණ්ඩලය සතු බාහිර පාර්ශ්ව විසින් භාවිතා කරනු ලබන ගබඩා, ඉඩම් හා දේපල වී අලෙවි මණ්ඩලය වෙත පවරා ගැනීමට හෝ විධිමත් පරිදි බදු දීම සඳහා අවශ්‍ය කටයුතු කිරීම.

විශේෂයෙන් ම දැනට ඌණ උපයෝජිත මට්ටමේ පවතින වී අලෙවි මණ්ඩල විසින් භාවිත කරනු ලැබූ ගබඩා, වී මෝල් සහ අදාළ දේපල පිහිටි ඉඩම් සම්බන්ධයෙන් කඩිනම් අවධානය යොමු කර අදාළ දේපල ප්‍රයෝජනවත් ආර්ථික කටයුත්තක් සඳහා යොමු කිරීමට කටයුතු කිරීම.

XII. 1971 අංක 14 දරන වී අලෙවි මණ්ඩල පනතේ සඳහන් අරමුණු ඉටුකර ගැනීමට හැකි වන පරිදි වී අලෙවි මණ්ඩලයේ ඉදිරි සැලසුම් (සංයුක්ත සැලැස්ම) පිළියෙල කිරීම.

XIII. ආයතනයේ මෙහෙයුම් කටයුතු ආයතන සංග්‍රහය, මුදල් රෙගුලාසි, මහා භාණ්ඩාගාර සහ අනෙකුත් චක්‍ර ලේඛනයන්ට අනුකූල වීමේ අවශ්‍යතාව ය.

XIV. සේවක මානව සම්පත් කළමනාකරණය

- 2018 වර්ෂයේදී තනතුරු 7 ක් සඳහා නිලධාරීන් 58 දෙනෙකු අවස්ථා 11 ක දී බඳවා ගැනීමට කටයුතු කර තිබූ අතර එහිදී ඇතැම් බඳවා ගැනීම් බඳවා ගැනීමේ පටිපාටියට බැහැරව බඳවා ගෙන ඇති අතර ඇතැම් බඳවා ගැනීම් අධ්‍යක්ෂ මණ්ඩලය වෙතින් ලබාගත් අනුමැතිය ඉක්මවා සිදුකර තිබුණි.
- 2008 වර්ෂයේ වී අලෙවි මණ්ඩලය ආරම්භ කළ අවස්ථාවේ සිට වරින්වර සේවයට බඳවා ගත් සේවකයින් සම්බන්ධ පහත ගැටලු කඩිනමින් නිරවුල් කර ගැනීමේ අවශ්‍යතාවය.

    - සේවක කාර්යක්ෂමතා කඩඉම් විභාග පැවැත්වීම.
    - සේවය ස්ථිර කිරීමේ කටයුතු කඩිනම් කිරීම.
    - වසර ගණනාවක් නොගෙවා තිබූ සේවක වැටුප් වර්ධක කඩිනමින් ලබාදීම.
    - සංයුක්ත සැලැස්මේ අරමුණු ඉටුකර ගැනීමට හැකිවන පරිදි කාර්ය මණ්ඩල (ධූරාවලිය) සමාලෝචනය කිරීම.

4.2 මූල්‍ය හා ගිණුම් කටයුතු.

ආයතනයේ දිගු කාලීන පැවැත්ම සම්බන්ධිත පාර්ශවයන් සමඟ ගණුදෙනු හෙළි නොකිරීම, නීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම, ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුගත නොවීම, ගිණුම්කරණ අඩුපාඩු, සාක්ෂි නොමැතිවීම සහ හඳුනා නොගත් වෙනස්කම් යන ප්‍රධාන හේතු මත විගණකාධිපතිවරයා විසින් 2018 වර්ෂය සඳහා වී අලෙවි මණ්ඩලයේ මූල්‍ය ප්‍රකාශන සම්බන්ධව මතය ව්‍යාචනයකර ප්‍රකාශයට පත්කර ඇත. එබැවින් මෙම ගැටලු නිවැරදි කිරීමට වී අලෙවි කළමනාකරණය සහ පාලනාධිකාරිය විසින් විශේෂ අවධානයක් යොමු කිරීමේ අවශ්‍යතාව ය.

I. වාර්ෂික ගිණුම් පිළියෙල කිරීම කඩිනම් කිරීම.

2003.06.02 දිනැති රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛ අංක PED 12 ප්‍රකාරව මුදල් වර්ෂයක් සඳහා මූල්‍ය ප්‍රකාශන මුදල් වර්ෂය අවසන් වී දින 60 ක් ඇතුලත විගණනය සඳහා ඉදිරිපත් කළයුතු වුවද 2018 වර්ෂයේ අවසන් ගිණුම් පිළියෙල කර අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය ලබාගෙන ඇත්තේ 2019.09.03 දින දීය.

2003.06.02 දිනැති රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛ අංක PED 12 ප්‍රකාරව මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීමට කටයුතු කිරීමේ අවශ්‍යතාවය සහ එම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති සහ මුදල් රෙගුලාසි වලට අනුකූල වීමේ අවශ්‍යතාව ය.

II. බැංකු සැසඳුම් යාවත්කාලීනව පිළියෙල කර පවත්වා ගැනීම

2015 සහ 2016 වර්ෂවල දී වී මිල දී ගැනීම සඳහා භාවිත කරනු ලැබූ ගිණුම් 21 තුළ 2020.07.23 වන දින වනවිට හඳුනා නොගත් නිරවුල් කළ යුතු වටිනාකම රුපියල් මිලියන 4,933.28 ක් පමණ වන ගණුදෙනු 66,005 ක් පවතින අතර එම ගණුදෙනු හේතුවෙන් උක්ත බැංකු ගිණුම්වලට අදාළ බැංකු සැසඳුම් පිළියෙල කිරීමේ කටයුතු 2015.12.31 සහ 2016.12.31 දිනට පමණක් සිදුකර ඇත.

වාර්ෂික ගිණුම් නියමිත දිනට ඉදිරිපත් කිරීමට බාධාකාරී වන ප්‍රධානතම සාධකය වන වී මිලදී ගැනීමේ දී ගොවීන් වෙත මුදල් ගෙවීම සඳහා භාවිතා කරනු ලබන බැංකු ගිණුම්වලින් කරන ලද හඳුනා ගැනීමට අපහසු ගෙවීම් සම්බන්ධයෙන් පහත කරුණු අනුගමනය කිරීම.

- අන්තර්ජාල බැංකුකරණයට (Internet Banking) යොමු වීම.
- ගොවීන් වෙත බැංකුවෙන් සෘජුවම මුදල් ගෙවීම වෙනුවට ගොවීන් නමින් අදාළ බැංකුවේ පවත්වා ගෙන යනු ලබන බැංකු ගිණුමකට මුදල් මාරු කිරීමේ (Fund Transfer) ක්‍රමවේදයකට යොමුවීම.
- බැංකු ගිණුමෙන් එක් ගොවියෙකුට වඩා වැඩි ප්‍රමාණයකට ගෙවනු ලබන මුදල් එක් ගිණුම් සටහනක් ලෙස (Bulk Amount) බැංකු ගිණුමට හර කිරීම වැළැක්වීම සඳහා එකවර එක් ගනුදෙනුවක් මඟින් වී මිලදී ගැනීම සඳහා භාවිත කරනු ලබන බැංකු ගිණුමට හර කළහැකි උපරිම මුදල තීරණය කිරීම.
- ඒ ඒ කලාප වෙනුවෙන් වී මිල දී ගැනීමේදී ගොවීන් වෙත මුදල් ගෙවීම සඳහා වෙන්කර ඇති ගිණුමකින් වෙනත් කලාපයක වී මිල දී ගැනීමක් වෙනුවෙන් ගොවීන් වෙත මුදල් ගෙවීම වැළැක්වීම සඳහා ක්‍රමවේදයක් ස්ථාපිත කිරීම.

III. වී තොග සත්‍යාපනය ගිණුම් ගත කිරීම.

2008 වර්ෂයේ සිට 2018 වර්ෂය දක්වා කාලය තුළදී මිල දී ගත් වී තොග සම්බන්ධයෙන් 2018 වර්ෂයේ දී සිදු කරනු ලැබූ තොග සත්‍යාපනයේදී හඳුනාගත් තොග හිඟය වන වී මෙට්‍රික් ටොන් 85,933 ක් පමණ ප්‍රමාණයක වටිනාකම වන රුපියල් මිලියන 3,047.10 ක මුදල අධ්‍යක්ෂ මණ්ඩල උපදෙස් මත "වෙළඳ ණය ගැති-අවිනිශ්චිත (තොග වෙනස්කම්)" ගිණුමට හර කර තිබුණි.

අදාළ වටිනාකම තුළ පවත්නා සත්‍ය තොග හානි, වී තොග වල සිදුවන ස්වභාවික බර අඩුවීම්, තොග වංචාවලට අදාළ නීතිමය කටයුතු වෙනුවෙන් වන වෙන් කිරීම් ආදිය හඳුනා ගෙන නොතිබීම නිසා 2018 වර්ෂයේ සහ ඒ දක්වා වන ශුද්ධ වත්කම් ප්‍රමාණය අධි තක්සේරු වීමක් සිදු වී ඇති බව නිරීක්ෂණය වේ.

IV. ගිණුම්වල පවත්නා නිරවුල් නොවූ ශේෂ කඩිනමින් නිරවුල් කිරීම.

ගිණුම්වල පවත්නා හඳුනා නොගත් ගෙවීම්.

2014/15 මහ, 2015 යල, 2015/16 මහ, 2016 යල සහ ඊට පෙර කන්නවල දී වී මිල දී ගැනීම වෙනුවෙන් ගොවීන් වෙත කරනු ලැබූ ගෙවීම් අතරින් පහත සඳහන් ගෙවීම් තහවුරු කරගත නොහැකි වීම මත හඳුනා නොගත් ගෙවීම් (හඳුනානොගත් වී මිල දී ගැනීම්) ලෙස අවසන් ගිණුම් තුල නිරූපණය කර තිබුණි.

	<u>රුපියල් මිලියන</u>
ලංකා බැංකුවෙන් ලැබිය යුතු මුදල	3.28
මහජන බැංකුවෙන් ලැබිය යුතු මුදල	1.69
හඳුනා නොගත් වී මිල දී ගැනීම්	63.97
වී මිල දී ගැනීම් අවිනිශ්චිත ගිණුම	28.17
වී මිල දී ගැනීමේ පාලන ගිණුම	49.74

උක්ත ගණුදෙනු නිරවුල් කිරීම සහ ඉදිරි අවසන් ගිණුම් පිළියෙල කිරීම සඳහා වී අලෙවි මණ්ඩලයේ කාර්ය මණ්ඩලයට අවශ්‍ය මඟ පෙන්වීම් සිදුකිරීම සඳහා මසකට රුපියල් ලක්ෂ 2 ක දීමනාවක් ගෙවීමේ පදනම මත විශ්‍රාමික රාජ්‍ය ගිණුම් අධ්‍යක්ෂ ජනරාල් තනතුර දරන ලද නිලධාරියකු අමාත්‍ය මණ්ඩලයේ අනුමැතිය මත මාස 6 ක කාලයක් සඳහා 2017 වර්ෂයේ දී සේවයේ යොදවා තිබූ අතර ඊට අමතරව අදාළ කාර්යයට සහාය වීම වෙනුවෙන් ගිණුම් අංශයේ නිලධාරීන් වෙත දිරි දීමනාවක් ද ගෙවා මෙම හඳුනා නොගත් ශේෂ නිරවුල් කිරීම සම්බන්ධයෙන් අධ්‍යක්ෂ මණ්ඩලයේ අවධානය ද යොමුව තිබූ නමුත් අදාළ විශ්‍රාමික නිලධාරියා විසින් ලබාදී තිබූ නිර්දේශ ක්‍රියාත්මක නොකිරීම නිසා මෙම කාර්යය නිසි පරිදි සම්පූර්ණ කිරීමට නොහැකි වී ඇති බව නිරීක්ෂණය වේ.

එම හේතුව නිසා ඉහත ආකාරයට අවසන් ගිණුම් තුළ පවත්නා වී මිල දී ගැනීම වෙනුවෙන් සිදු කරනු ලැබූ ගෙවීම් අතුරින් කොටසක් හඳුනා නොගත් ගෙවීම් ලෙස නිරූපණය වන අතර ඒ සම්බන්ධයෙන් කටයුතු කිරීමේ හැකියාව ගිලිහී ගොස් ඇත.

වී මිල දී ගැනීමේදී සිදු කරනු ලබන ගෙවීම් විධිමත් පරිදි වාර්තා කර ගොවියා වෙත කඩිනමින් මුදල් ගෙවීම සඳහා නව ක්‍රමවේදයක් හඳුන්වා දීම සම්බන්ධයෙන් කළමනාකාරිත්වයේ අවධානය යොමුවිය යුතු බවට අභ්‍යන්තර විගණනය වෙතින් වරින් වර තම නිරීක්ෂණ හා නිර්දේශ ඉදිරිපත්කර ඇත.

V. වාර්ෂික භාණ්ඩ සමීක්ෂණය සිදුකිරීම හා ස්ථාවර වත්කම් ලේඛන යාවත්කාලීන කිරීම

2016.03.31 දිනැති අංක 05/2016 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛනය ප්‍රකාරව භාණ්ඩ සමීක්ෂණ කටයුතු සිදුකර අදාළ ඉදිරි ක්‍රියාමාර්ග ගත යුතු වුවද 2017 සහ 2018 වර්ෂ වල දී භාණ්ඩ සමීක්ෂණ කටයුතු ආරම්භ කර තිබුණ ද අදාළ කාර්යයන් උක්ත චක්‍රලේඛන ප්‍රකාරව අවසන් කිරීමට කටයුතු කර නොමැති බැවින් ඒ සම්බන්ධයෙන් විශේෂ අවධානය යොමුකර ක්‍රියා කළයුතු බව.

විශේෂයෙන් ම ප්‍රධාන කාර්යාලය මඟින් සහ ප්‍රාදේශීය කාර්යාල මඟින් අවස්ථානුකූලව මිල දී ගනු ලබන ස්ථාවර වත්කම් සහ ඉන්වෙන්ට්‍රි අයිතමයන් අදාළ ප්‍රාදේශීය කාර්යාලවල සහ ප්‍රධාන කාර්යාලයේ පවත්වා ගෙන යනු ලබන ස්ථාවර වත්කම් ලේඛනයේ සහ ඉන්වෙන්ට්‍රි ලේඛනයේ යාවත්කාලීන වන බව තහවුරු කර ගැනීම සඳහා විධිමත් ක්‍රමවේදයක් ස්ථාපිත කිරීමේ අවශ්‍යතාවය.

VI. වත්කම් හා දේපල සම්බන්ධයෙන් වාර්තා පවත්වා ගැනීම සහ යාවත්කාලීන කිරීම

ආයතනය සතු ස්ථාවර වත්කම් (ජංගම නොවන වත්කම්) සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 502 අනුව පවත්වාගත යුතු ලේඛන (Register) යාවත්කාලීන කරගැනීම සහ මුදල් රෙගුලාසි 507 අනුව වාර්ෂිකව සත්‍යාපනයක් කිරීමේ අවශ්‍යතාවය අභ්‍යන්තර විගණනය විසින් වරින්වර පෙන්වාදී තිබුණ ද අදාළ ලේඛන යාවත්කාලීන කිරීමේ කටයුතු නිසි පරිදි සම්පූර්ණ කර නොතිබුණි.

මුදල් රෙගුලාසි 454 අනුව ආයතනය විසින් භාවිතා කරනු ලබන භාණ්ඩ සහ පාරිභෝජ්‍ය ද්‍රව්‍ය සම්බන්ධයෙන් වාර්තා පවත්වා ගත යුතු අතර මුදල් රෙගුලාසි 751-773 අනුව අදාළ වාර්තා යාවත්කාලීන කළ යුතු වුවද වාර්තා පවත්වා ගැනීමේ සහ යාවත්කාලීන කිරීමේ ප්‍රමාදයක් පවතින බව නිරීක්ෂණය වේ.

VII. වී අලෙවි මණ්ඩලයේ සේවකයින් වෙත සහ වෙනත් පාර්ශ්වයන් වෙත නිකුත් කරනු ලබන අත්තිකාරම් පියවා ගැනීමේ ප්‍රමාදයන් පවතින බැවින් කඩිනමින් පියවා ගැනීමේ ක්‍රමවේදයකට යොමු වීම.

VIII. වී තොග විකිණීම.

වී තොග විකිණීමේදී පහත කරුණු කෙරෙහි අවධානය යොමු කිරීම.

- තාර්කික විකුණුම් මිලක් තීරණය කිරීම.
- සුදුසු අවස්ථාවේදී විකිණීමට තීරණය කිරීම. (වෙළඳපළ මිල ඉහළ අගයක් ගන්නා අවස්ථා සහ වී අස්වනු නෙලීම සිදු නොවන අවස්ථාවල දී)
- බාහිර රජයේ ආයතන වෙත වී / සහල් නිකුත් කිරීමේදී තාර්කික මිලක් පදනම් කර ගැනීම.

IX. වී අලෙවි මණ්ඩලයේ මූල්‍ය තත්ත්වය සහ බැරකම්.

විවෘත වෙළඳපළට මැදිහත් වීමක් තුළින් පාලන මිල ක්‍රියාත්මක කිරීම නිසා ආයතනය අඛණ්ඩව මෙහෙයුම් අලාභයක් වාර්තා කිරීමට හේතු වී ඇති බව මූල්‍ය ප්‍රකාශන මඟින් පෙන්නුම් කෙරේ. 2018.12.31 දිනට ආයතනයේ අලාභය රුපියල් මිලියන 1,241.42 ක් පමණ වන අතර සමස්ත සෘණ ශුද්ධ වත්කම් ප්‍රමාණය 2018 වසර අග වන විට රුපියල් මිලියන 13,266.65 ක් දක්වා ඉහළ ගොස් තිබේ. තවද රාජ්‍ය බැංකු වලින් ලබා ගත් ණය තුළින් මූල්‍ය හිඟය පියවා ඇති අතර ඒ හේතුවෙන් ආයතනයේ 2018.12.31 දින වන විට සමස්ත ණය ප්‍රමාණය රුපියල් මිලියන 11,419.66 ක් වී ඇත. ඒ අනුව ආයතනය අඛණ්ඩව දැඩි මූල්‍ය අලාභයක් ලබමින් සිටින බව වැඩි දුරටත් නිරීක්ෂණය වේ.

මේ තත්ත්වය ආයතනයේ අඛණ්ඩ පැවැත්ම කෙරෙහි බලපානු ඇත. එම නිසා කඩිනමින් ක්‍රමානුකූල තොග පාලන පද්ධතිය සහ අභ්‍යන්තර පාලන ක්‍රමවේදයන් ශක්තිමත් කරමින් ණය කළමනාකරණ පද්ධතිය නිසි උපාය මාර්ගික සැලැස්මක් මත ක්‍රියාත්මක කිරීම මගින් අභ්‍යන්තර පාලන යාන්ත්‍රණයන් ශක්තිමත් කිරීමට ආයතනයේ කළමනාකාරිත්වය කටයුතු කළ යුතුය. ඒ සඳහා,

- වී අලෙවි මණ්ඩලය මඟින් මිලදී ගනු ලබන වී තොග මිලදී ගත් මිලට වඩා අඩු මිලකට විකිණීම මඟින් සිදුවන අලාභය අවම කිරීම මඟින් මහා භාණ්ඩාගාරය සහ රජයේ බැංකු වෙත පවත්නා දිගු කාලීන බැඳීම් සහ ණය ගෙවීම සඳහා දිගු කාලීන සැලැස්මක් සකස් කර ක්‍රියාත්මක කිරීම සහ එමඟින් දැනට ගෙවමින් පවතින අනවශ්‍ය පොළී වියදම් අවම කර ගැනීමට අවශ්‍ය කටයුතු කිරීම.

- එවැනි දිගුකාලීන සැලැස්මක් මඟින් වී අලෙවි මණ්ඩලය තුළින් ගොවීන්ට ලැබෙන දායකත්වය වර්ධනය කර ගැනීමත් රජයට වැය බරක් නොවන ආකාරයට ආයතනය පවත්වා ගැනීමත් (අවම වශයෙන් අලාභ නොලබන මට්ටමෙන් පවත්වා ගැනීමට) අවශ්‍ය දිගු කාලීන අරමුණු පිහිටුවා ඒ අනුව කටයුතු කිරීම.

X. ගිණුම්වල දිගින් දිගටම පවත්නා අක්‍රීය ණය ගැති ශේෂයන් (සමූපකාර තොග වෙළඳ සංස්ථාව, රේඛීය අමාත්‍යාංශය, ආහාර දෙපාර්තමේන්තුව, ලංකා ස.තො.ස ආයතනය, හම්බන්තොට හා අම්පාර දිස්ත්‍රික් ලේකම් කාර්යාලය සහ විවිධ වී මෝල් හිමියන් ආදී) අදාළ ආයතන වෙතින් අයකර ගැනීමට / නිරවුල් කිරීමට කටයුතු කිරීමේ අවශ්‍යතාවය.

XI. කොන්ත්‍රාත්/ඉදිකිරීම් පරිපාලනය.

- ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයට අනුකූල වීමේ අවශ්‍යතාවය.

- ඉදිකිරීම් කටයුතු අධීක්ෂණය සඳහා තාක්ෂණික දැනුමෙන් යුත් ස්ථිර නිලධාරියකු වී අලෙවි මණ්ඩලය වෙත බඳවා ගැනීමේ අවශ්‍යතාවය.

XII. පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාවේ (COPE) නියෝග ක්‍රියාත්මක කිරීමේ ප්‍රගතිය.

අවසන් වරට කැඳවනු ලැබූ 2019.05.07 වන දින පැවති පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාවේදී ලබාදුන් නිර්දේශයන් කඩිනමින් ක්‍රියාත්මක කිරීම සඳහා අවධානය යොමු කිරීමේ අවශ්‍යතාවය.

I. වාර්ෂික වාර්තා පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීමේ ප්‍රමාදය.
II. පරිගණක ගත තොග පාලන පද්ධතිය.
III. වී තොග ගබඩා කිරීම.
IV. සත්ත්ව ආහාර සඳහා වී තොග නිකුත් කිරීම.
V. සාමාන්‍යාධිකාරී තනතුර.
VI. හඳුනා නොගත් තැන්පතු.

VII. පාලම් තරාදි.

VIII. ගබඩා ලබාදීම.

IX. මරදගහමුල ගබඩාව.

5. අභ්‍යන්තර විගණනය විසින් ඉදිරිපත් කරනු ලැබූ නිර්දේශ සම්බන්ධයෙන් වන සාධනීය කරුණු.

පෙන්වා දුන් කරුණු අතරින් පහත කරුණු සම්බන්ධයෙන් කළමනාකාරිත්වයේ අවධානය යොමුකර තිබූ අතර මේ වන විට පහත ක්‍රියාමාර්ග ගෙන ඇත.

I. පවත්නා තොග පාලන පද්ධතිය සම්බන්ධයෙන් පද්ධති විගණනයක් (System Audit) සිදුකර අදාළ මෘදුකාංගයේ පිරිවැය සහ ප්‍රතිඵල විශ්ලේෂණයකට යොමුකර තිබීම.

II. ක්ෂේත්‍ර නිලධාරීන්ගේ රාජකාරි කටයුතු තහවුරු කර ගැනීම සඳහා ක්‍රමවේදයක් හඳුන්වා දී තිබීම.

III. ක්‍රියාත්මක කරනු ලැබූ විවිධ වැඩසටහන් යටතේ වී අලෙවි මණ්ඩලයට අයවිය යුතු මුදල් අයකර ගැනීම සඳහා නීතිමය ක්‍රියාමාර්ග වෙත යොමු වී තිබීම.

IV. ගබඩාවල සිදුවන වී තොග අඩුවීම සහ ඌණතා සම්බන්ධයෙන් කටයුතු කිරීම සඳහා චක්‍රලේඛ උපදෙස් නිකුත් කර වී තොග අඩුමාන ඌණතා විමර්ශන කමිටු පිහිටුවා තිබීම.

V. වසර ගණනාවක් නොගෙවා තිබූ සේවක වැටුප් වර්ධක ගණනය කර ගෙවීමට කටයුතු කර තිබීම.

VI. නිසි පරිදි සම්පූර්ණ නොකර අවිධිමත් මට්ටමේ පැවති සේවක පෞද්ගලික ලිපි ගොනු යාවත්කාලීන කිරීමට කටයුතු කර තිබීම.

VII. ඉදිකිරීම් කටයුතු සඳහා අවශ්‍ය ඉංජිනේරුමය සේවාවන් ඉංජිනේරුමය කාර්යයන් පිළිබඳ මධ්‍යම උපදේශන කාර්යාංශය (CECB) වෙතින් ලබා ගැනීම සඳහා වන අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබාගෙන තිබීම.

ඇමුණුම – 01

අංකය	දිනය	විමසුම් අංකය	මාතෘකාව	පිළිතුරු ලද දිනය
01	2018.01.11	PMB/IA/GEN/030-15/12	ගිණුම් අංක 7767985 (2016) (අම්පාර කලාපය)	2018.01.19
02	2018.01.23	PMB/IA/GEN/030-15/14	වී මිල දී ගැනීමේ මෙහෙයුම් වියදම් සඳහා කලාප වෙත අත්තිකාරම් මුදල් නිදහස් කිරීම.	2018.02.08
03	2018.01.25	PMB/IA/INQ/032-18/01	කොන්ත්‍රාත් පදනම මත සේවයට බඳවා ගෙන ඇති නිලධාරීන්.	2018.02.09
04	2018.01.25	PMB/IA/INQ/032-18/02	කොන්ත්‍රාත් පදනම මත සේවයට බඳවා ගෙන ඇති නිලධාරීන්.	2018.03.28

අංකය	දිනය	විමසුම් අංකය	මාතෘකාව	පිළිතුරු ලද දිනය
05	2018.01.25	PMB/IA/GEN/029-15/29	ප්‍රාදේශීය කළමනාකරුවන් වෙත අත්තිකාරම් මුදල් නිදහස් කිරීම.	2018.02.09
06	2018.01.25	PMB/IA/GEN/060-18/01	ගබඩාවල සුළු වශයෙන් ඉතිරිව පවතින හොඳ වී තොග සහ අබලි වී තොග.	2018.03.15
07	2018.01.25	PMB/IA/GEN/060-18/02	ගබඩා භාර නිලධාරීන්ගෙන් බැඳුම්කරයක් ලබා ගැනීම.	2018.03.15
08	2018.01.29	PMB/IA/GEN/028-16/17	පුද්ගලික ලිපි ගොනු පරීක්ෂාව.	2018.02.20
09	2018.02.19	PMB/IA/GEN/52-16/05	බිම් රාක්ක භාර ගැනීම සහ ඒවායේ ප්‍රමිතිය.	2018.03.22
10	2018.02.19	PMB/IA/GEN/57-17/03	කරමැටිය ගබඩාව පිහිටි ඉඩම අනවසරයෙන් භාවිත කිරීම.	2018.03.15
11	2018.02.19	PMB/IA/GEN/021-15/11	කරමැටිය අංක 01 සහ 02 ගබඩා අලුත්වැඩියා කිරීම.	2018.03.22
12	2018.12.28	PMB/IA/GEN/060-18/04	දෛනික වී මිලදී ගැනීම් වාර්තා කිරීමේ ක්‍රමවේදය විධිමත් කිරීම.	2018.03.15
13	2018.03.05	PMB/IA/GEN/060-18/05	මුද්‍රිත පෝරම/ පොත් බෙදා හැරීම විධිමත් කිරීම.	2018.03.16
14	2018.03.05	PMB/IA/GEN/030-15/15	වී මෝල් ලියාපදිංචි කිරීම.	2018.03.15
15	2018.03.15	PMB/IA/GEN/029-15/31	ඉන්වෙන්ට්‍රි අයිතම (ජංගම වත්කම්) පාරිභෝජ්‍ය ද්‍රව්‍ය හා ලිපිද්‍රව්‍ය මිල දී ගැනීම වාර්තා කිරීම විධිමත් කිරීම.	2018.04.04
16	2018.03.22	PMB/IA/GEN/038-16/15	2014/15 මහ සහ 2015 යල කන්නවල දී මිලදී ගත් වී තොග පෞද්ගලික වී මෝල් හිමියන් මඟින් සහල් බවට පත් කිරීමේ ක්‍රියාවලිය – 2016.	2018.04.12
17	2018.04.18	PMB/IA/GEN/052-16/06	බිම් රාක්ක (Pallers) වල ප්‍රමිතිය	2018.04.26
18	2018.04.26	PMB/IA/GEN/040-16/22	ජංගම නොවන වත්කම් (ස්ථාවර වත්කම්) මිල දී ගැනීමල බෙදා හැරීම සහ වාර්තා කිරීම විධිමත් කිරීම.	2018.05.15
19	2018.05.31	PMB/IA/GEN/024-15/11	වී අලෙවි මණ්ඩලය විසින් භාවිත කරනු ලබන වාහනවල අයිතිය භාවිතය සහ නඩත්තුව පරීක්ෂා කිරීම.	2018.08.02

අංකය	දිනය	විමසුම් අංකය	මාතෘකාව	පිළිතුරු ලද දිනය
20	2018.07.26	PMB/IA/GEN/65-18/01	පොලිසැක් මලු බෙදාහැරීම.	2018.08.01
21	2018.08.02	PMB/IA/GEN/024-15/14	LH – 4602 අංක දරන ලොරි රථය සම්බන්ධවයි.	2018.08.19
22	2018.08.27	PMB/IA/GEN/062-18/11	සේවකයින් සේවයෙන් ඉල්ලා අස්වීම සහ වී අලෙවි මණ්ඩලය වෙත ඔවුන්ගෙන් අයවිය යුතු මුදල්.	2018.12.01
23	2018.08.28	PMB/IA/GEN/024-15/15	වී අලෙවි මණ්ඩලය විසින් භාවිත කරනු ලබන වාහනවල අයිතියල භාවිතය සහ නඩත්තුව පරීක්ෂාව.	2018.08.19
24	2018.08.29	PMB/IA/GEN/065-18/02	වී තොග වාර්තා පවත්වා ගැනීම (සම්බා සහ කීරි සම්බා වී තොග වෙන් වෙන් වශයෙන් වාර්තා නොවීම සහ රතු සහ සුදු වශයෙන් වෙන් වෙන්ව වාර්තා නොවීම).	2018.10.16
25	2018.08.29	PMB/IA/GEN/024-15/16	වී අලෙවි මණ්ඩලය විසින් භාවිත කරනු ලබන වාහනවල අයිතිය, භාවිතය සහ නඩත්තුව පරික්ෂා කිරීම	2018.10.29
26	2018.09.11	PMB/IA/GEN/57-17/13	කැකිරාව සහල් මෝල් සංකීර්ණය	2019.01.11
27	2018.09.14	PMB/IA/GEN/021-15/13	නැගෙනහිර ප්‍රාදේශීය කාර්යාලය ඉදිකිරීම.	2018.11.27
28	2018.10.01	PMB/IA/GEN/21-15/14	රත්නපුර සංචාරක බංගලාව අලුත්වැඩියා කිරීම.	2018.10.31
29	2018.10.03	PMB/IA/GEN/40-16/31	කොකුන් ගබඩා මිල දී ගැනීම සහ වී තොග ගබඩා කිරීම.	2019.03.25
30	2018.10.31	PMB/IA/GEN/063-18/03	සංචාරක බංගලා වෙන් කිරීම, භාවිතය සහ නඩත්තුව පරීක්ෂා කිරීම.	2019.01.29
31	2018.12.17	PMB/IA/GEN/052-16/11	2018/19 මහ කන්නය සඳහා පොලිසැක් මිල දී ගැනීම.	2019.01.29

ඇමුණුම - 02

අනු අංකය	යොමු අංකය	මාතෘකාව	පිළිතුරු යැවූ දිනය
01	TCM/D/PMB/2018/AQ/01	අත්තිකාරම් පියවීම පරීක්ෂාව 2016 හා 2017 වර්ෂයන්	2018.03.18
02	එන්සිපි/එල්/පිඑම්බී/02/2017/බීඊ/02	අනුරාධපුර දිස්ත්‍රික්කය තුළ පිහිටි වී අලෙවි මණ්ඩලයේ සහල් සංකීර්ණ පිළිබඳ විශේෂ විගණනය.	2018.06.18
03	TCM/D/PMB/2018/AQ/02	මූල්‍ය ප්‍රකාශන විගණනය - 2015.	2018.05.25
04	TCM/D/PMB/AQ/2018/03	වී අලෙවි මණ්ඩලයේ මහනුවර ප්‍රාදේශීය කාර්යාල ගොඩනැගිල්ල විකිණීම.	2018.05.15
05	TCM/D/PMB/2018/AQ/04	බැංකු සැසඳුම් පරීක්ෂාව - 2015.	2018.05.25
06	ටීසීඑම්/ඩී/පිඑම්බී/01/15	වී අලෙවි මණ්ඩලයේ 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ 1971 අංක 38 දරන මුදල් පනතේ 14(2) (සී) වගන්තිය ප්‍රකාර විගණකාධිපති වාර්තාව.	2018.06.06
07	TCM/D/PMB/2018/AQ/05	බැංකු සැසඳුම් පරීක්ෂාව -2016.	2018.08.06
08	TCM/D/PMB/2018/AQ/06	අත්තිකාරම් පියවීම පරීක්ෂාව.	2018.08.01
09	SNP/L/PMB/2018/01	විගණන පරීක්ෂාව - මැද්දවත්ත වී ගබඩාව අලුත්වැඩියා කිරීම.	2018.08.13
10	TCM/D/PMB/1/16	වී අලෙවි මණ්ඩලයේ 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ 1971 අංක 38 දරන මුදල් පනතේ 14(2) (සී) වගන්තිය ප්‍රකාර විගණකාධිපති වාර්තාව.	2018.09.12
11	TCM/D/PMB/1/16	වී අලෙවි මණ්ඩලයේ 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ 1971 අංක 38 දරන මුදල් පනතේ 13 (7) (ඒ) වගන්තිය ප්‍රකාර විගණකාධිපති වාර්තාව.	2018.11.19
12	TCM/D/PMB/1/15	වී අලෙවි මණ්ඩලයේ 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ 1971 අංක 38 දරන මුදල් පනතේ 13 (7) (ඒ) වගන්තිය ප්‍රකාර විගණකාධිපති වාර්තාව.	2018.09.28
13	SNP/L/PMB/2018/01	විගණන පරීක්ෂාව - මැද්දවත්ත වී ගබඩාව අලුත් වැඩියා කිරීම.	2019.04.05
14	TCM/D/PMB/SR/2018	වී අලෙවි මණ්ඩලයේ කාර්ය සාධනය.	2018.10.10
15	TCM/D/PMB/1/17	වී අලෙවි මණ්ඩලයේ 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ගණුදෙනු පිළිබඳ විගණකාධිපති වාර්තාව.	2018.10.31
16	TCM/D/PMB/AQ/2018/08	බිම් රාක්ක මිලදී ගැනීම - 2017.	2018.11.01
17	NCP/AP/A/PMO/AC/2017/24/AQ-01	වී අලෙවි මණ්ඩලය වී තොග සත්‍යාපනය අනුරාධපුර.	2019.01.29
18	TCM/D/PMB/AQ/2018/07	ගොඩනැඟිලි අලුත්වැඩියා කිරීම - 2016.	2018.08.27
19	TCM/D/PMB/AQ/2018/09	මීතොටමුල්ල ගබඩා සංකීර්ණය පරීක්ෂාව.	2019.01.22

14. තිරසර සංවර්ධන ඉලක්ක අත්කර ගැනීමේ ප්‍රගතිය

වී නිෂ්පාදනය වෙළඳපොලට නිකුත් වන අවස්ථාවේදී වී අලෙවි මණ්ඩලය විසින් වී ගොවීන්ගෙන් සහතික මිලකට අස්වැන්න මිල්දී ගැනීම සිදුවේ. මෙමඟින් අප ගොවි ජනතාවගේ දිළිඳුකම අඩුකර ජීවන තත්ත්වය උසස් කිරීමට බලාපොරොත්තු වේ.

වසරේ මාස කිහිපයක සහල් සහ වී වල විවෘත වෙළඳපොලේ මිල ඉහළ යාම හේතුවෙන් පාරිභෝගිකයන් දැඩි දුෂ්කරතාවයකට ලක් වේ. එබැවින් පාරිභෝගිකයාට සාධාරණ මිලකට සහල් මිල්දී ගැනීමට අවස්ථාව ලබා දීමේ අරමුණින් වී අලෙවි මණ්ඩලය විසින් වී තොග අදාළ කාල වකවානු තුළදී වෙළඳපොලට නිකුත් කිරීමට කටයුතු කරනු ලැබේ.

ඊට අමතරව ආරක්ෂිත තොගයක් පවත්වා ගනිමින් රට තුළ ආහාර සුරක්ෂිතතාවය තහවුරු කිරීමට බලාපොරොත්තු වේ.

වාර්ෂික ගිණුම් - 2018

Paddy Marketing Board

STATEMENT OF FINANCIAL POSITION

As at 31 December 2018

	Note	2018 Rs.	2017 Rs.
ASSETS			
Non Current Assets			
Property Plant & Equipment	3	996,780,367	917,462,940
Capital Work-in-Progress	4	34,789,928	78,891,620
Investments	5	498,291,881	448,941,944
		1,529,862,176	1,445,296,504
Current Assets			
Inventories	6	279,652,991	3,090,731,472
Trade and Other Receivables	7	5,907,867,152	4,227,507,094
Cash and Cash Equivalents	8	680,843,080	229,848,894
		6,868,363,223	7,548,087,460
Total Assets		**8,398,225,399**	**8,993,383,964**
EQUITY AND LIABILITIES			
Capital Contrubuted by the Treasury	9	631,484,518	631,484,518
Reserve Surplus/ (Deficit)		(13,898,138,127)	(13,180,175,058)
Total Equity		(13,266,653,609)	(12,548,690,540)
Non Current Liabilities			
Interest Bearing Loans & Borrowings	10	11,419,664,165	11,533,541,354
Provision for Defined Benefit Plans	11	20,801,539	17,765,901
Deferred Income	12	832,113,082	814,109,507
		12,272,578,785	12,365,416,762
Current Liabilities			
Trade & Other Payables	13	9,122,450,574	9,107,113,171
Interest Bearing Loans & Borrowings	10	269,849,649	69,544,572
		9,392,300,223	9,176,657,742
Total Equity and Liabilities		**8,398,225,399**	**8,993,383,964**

These Financial Statements are in compliance with the requirements of the Finance Act No. 38 of 1971.

.....
Deputy General Manager (Finance)

K. P. M. M. K. Jayaweera
Deputy General Manager (Finance)
Paddy Marketing Board
6th Floor, Housing Secretariat Building
Sir Chittampalam A Gardiner Mw,
Colombo 02, Sri Lanka.

.....
Accountant

The Board of Directors is responsible for the preparation and presentation of these Financial Statements. Signed for and on behalf of the Board by:

.....
Chairman

Kasthuri Anuradhanayaka
(Attorney-at-Law)
Chairman
Paddy Marketing Board
6th Floor, Housing Secretariat Building
Sir Chittampalam A Gardiner Mw,
Colombo 02

.....
Director

J. Krishnamoorthy
Head Commissioner
Head Commissioner's Department
On Place
Colombo 02.

The accounting policies and notes on pages 5 to 24 form an integral part of the Financial Statements.

03.09.2019
Colombo

මූල්‍ය තත්ත්ව ප්‍රකාශය

2018 දෙසැම්බර් 31 දිනට

	සටහන	2018	2017
වත්කම්		රු.	රු.
ජංගම නොවන වත්කම්			
දේපළ, පිරියත සහ උපකරණ	3	996,780,367	917,462,940
කෙරීගෙන යන ප්‍රාග්ධන වැඩ	4	34,789,928	78,891,620
ආයෝජන	5	498,291,881	448,941,944
		1,529,862,176	1,445,296,504
ජංගම වත්කම්			
අවසන් තොගය	6	279,652,991	3,090,731,472
වෙළඳ සහ අනෙකුත් ලැබිය යුතු මුදල්	7	5,907,867,152	4,227,507,094
මුදල් සහ මුදල් සමානතා	8	680,843,080	229,848,894
		6,868,363,223	7,548,087,460
මුළු වත්කම්		**8,398,225,399**	**8,993,383,964**
සාමාන්‍ය කොටස් ප්‍රමාණය සහ වගකීම්			
භාණ්ඩාගාරය මගින් දායක වූ ප්‍රාග්ධනය	9	631,484,518	631,484,518
සංචිත අතිරික්තය / (හිඟය)		(13,898,138,127)	(13,180,175,058)
මුළු සාමාන්‍ය කොටස් ප්‍රමාණය		(13,266,653,609)	(12,548,690,540)
ජංගම නොවන වගකීම්			
පොළී දරන ණය සහ ණය ගැණුම්	10	11,419,664,165	11,533,541,354
නිර්වචිත ප්‍රතිලාභ සැලසුම් සඳහා ප්‍රතිපාදන	11	20,801,539	17,765,901
විලම්භිත ආදායම	12	832,113,082	814,109,507
		12,272,578,785	12,365,416,762
ජංගම වගකීම්			
වෙළඳ සහ අනෙකුත් ගෙවිය යුතු මුදල්	13	9,122,450,574	9,107,113,171
පොළී දරණ ණය සහ ණය ගැණුම්	10	269,849,649	69,544,572
		9,392,300,223	9,176,657,742
මුළු සාමාන්‍ය කොටස් ප්‍රමාණය සහ වගකීම්		**8,398,225,399**	**8,993,383,964**

මෙම මූල්‍ය ප්‍රකාශ 1971 අංක 38 දරන මුදල් පනතේ අවශ්‍යතාවලට අනුකූල වේ.

....

නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (මූල්‍ය) ගණකාධිකාරී

අධ්‍යක්ෂ මණ්ඩලය මෙම මූල්‍ය වාර්තා පිළියෙළ කිරීම හා ඉදිරිපත් කිරීම පිළිබඳව වගකීමෙන් බැඳී සිටියි. අධ්‍යක්ෂ මණ්ඩලය වෙනුවෙන් අත්සන් කළේ:

....

සභාපති අධ්‍යක්ෂ

මෙම ගිණුම්කරණ ප්‍රතිපත්ති හා පිටු අංක 69 - 91 දක්වා සටහන් මූල්‍ය ප්‍රකාශනවල අත්‍යවශ්‍ය කොටසකි.

2019.....

කොළඹ

(ඉංග්‍රීසි මුල් පිටපතෙහි අනුවාදයයි)

විස්තීර්ණ ආදායම් ප්‍රකාශය
2018 දෙසැම්බර් 31 අවසන් වර්ෂය සඳහා

	සටහන	2018 රු.	2017 රු.
අයභාරය	14	31,020,886	7,424,976,814
විකිණුම් පිරිවැය		(7,942,497)	(6,740,033,282)
දළ ලාභය		23,078,389	684,943,531
වෙනත් ආදායම්	15	212,998,004	187,621,713
පරිපාලන වියදම්		(233,547,335)	(186,970,856)
විකිණීම් සහ බෙදා හැරීමේ වියදම්		(1,235,349)	(1,402,122)
මූල්‍ය වියදම්	16	(1,231,355,118)	(1,146,297,587)
වෙනත් වියදම්		(11,366,042)	-
බදුකරණයට පෙර ලාභ / (අලාභ)		(1,241,427,452)	(462,105,320)
ආදායම් බදු (වියදම්) / ප්‍රතිවර්තන		-	-
කාල පරිච්ඡේදය සඳහා ලාභය /(අලාභ)		(1,241,427,452)	(462,105,320)
වෙනත් විස්තීර්ණ ආදායම්			
විලම්භිත ආදායම		56,325,729	-
මුළු විස්තීර්ණ ආදායම්		(1,185,101,723)	(462,105,320)

මෙම ගිණුම්කරණ ප්‍රතිපත්ති හා පිටු අංක 69 - 91 දක්වා සටහන් මූල්‍ය ප්‍රකාශනවල අත්‍යවශ්‍ය කොටසකි.

සාමාන්‍ය කොටස් වෙනස්වීම පිළිබඳ ප්‍රකාශය

2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වසර

	දායක වූ ප්‍රාග්ධනය	රඳවාගත් ඉපයීම්	එකතුව
	රු.	රු.	රු.
2017 ජනවාරි 1 දිනට ශේෂය	631,484,518	(12,692,062,340)	(12,060,577,822)
පූර්ව වසර ගැළපීම්	-	(26,007,397)	(26,007,397)
කාල පරිච්ඡේදය සඳහා ලාභය / (අලාභය)	-	(462,105,320)	(462,105,320)
2017 දෙසැම්බර් 31 දිනට ශේෂය	631,484,518	(13,180,175,058)	(12,548,690,540)
2018 ජනවාරි 1 දිනට ශේෂය	631,484,518	(13,180,175,058)	(12,548,690,540)
පූර්ව වසරේ ගැළපීම්	-	467,138,654	467,138,654
කාල පරිච්ඡේදය සඳහා ලාභ / (අලාභ)	-	(1,185,101,723)	(1,185,101,723)
2018 දෙසැම්බර් 31 දිනට ශේෂය	631,484,518	(13,898,138,127)	(13,266,653,609)

මෙම ගිණුම්කරණ ප්‍රතිපත්ති හා පිටු අංක 69 - 91 දක්වා සටහන් මූල්‍ය ප්‍රකාශනවල අත්‍යවශ්‍ය කොටසකි.

ක්ෂය කිරීම්	62,621,557	49,450,628
පාරිතෝෂික සඳහා ප්‍රතිපාදන	3,210,427	3,750,900
ස්ථාවර තැන්පතුවලින් ලද පොළී ආදායම්	(48,690,201)	(45,293,343)
ඉතිරිකිරීම්වල පොළී ආදායම	(10,618,483)	
විලම්භිත ආදායම් සඳහා පූර්ව වසර ගැළපීම්	(103,170,697)	
පූර්ව වසර ගැළපීම්	467,138,654	(17,613,366)
කාරක ප්‍රාග්ධන වෙනස්කම්වලට පෙර මෙහෙයුම් ලාභය	360,418,923	674,487,086
(කෙරීගෙන යන වැඩ (වැඩිවීම) / අඩුවීම	44,101,692	7,132,965
තොගයේ (වැඩිවීම) / අඩුවීම	2,811,078,481	6,656,954,208
වෙළඳ හා වෙනත් ලැබිය යුතු මුදල් (වැඩිවීම) / අඩුවීම්	(1,680,360,058)	(2,162,693,748)
වෙළඳ හා වෙනත් ගෙවිය යුතු මුදල් (වැඩිවීම) / අඩුවීම	15,337,403	(1,020,337,329)
මෙහෙයුම්වලින් උත්පාදනය වූ මුදල්	1,550,576,441	4,155,543,182
ගෙවන ලද මූල්‍ය පිරිවැය	(1,231,355,118)	(1,146,297,587)
ගෙවන ලද ආදායම් බදු	-	-
ගෙවන ලද පාරිතෝෂික	(174,789)	(653,693)
මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් / ක්‍රියාකාරකම් සඳහා (භාවිත කළ) ශුද්ධ මුදල් ප්‍රවාහය	319,046,534	3,008,591,901
ආයෝජන ක්‍රියාකාරකම්වලින් / ක්‍රියාකාරකම් සඳහා (භාවිත කළ) මුදල් ප්‍රවාහය		
දේපළ, පිරියත සහ උපකරණ අත්පත් කර ගැනීම	(141,938,984)	(213,718,880)
ස්ථාවර තැන්පතුවල ආයෝජනය කිරීම	(49,349,936)	(35,066,475)
ස්ථාවර තැන්පතුවලින් ලද පොළී ආදායම	48,690,201	45,293,343
ඉතිරි කිරීම්වලින් ලද පොළී ආදායම	10,618,483	
ආයෝජන ක්‍රියාකාරකම්වලින් / ක්‍රියාකාරකම් සඳහා (භාවිත කළ) ශුද්ධ මුදල් ප්‍රවාහය	(131,980,237)	(203,492,012)
මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ඇති වූ / (භාවිත කළ) මුදල් ප්‍රවාහය		
කොටස් නිකුත් කිරීම	-	-
පොළී දරන ණය හා ණයගැනීම්වලින් ලබා ගත් මුදල්	-	-
පොළී දරන ණය හා ණය ගැනීම් ආපසු ගෙවීම් වල	(113,877,189)	(3,060,472,874)
රජයේ ප්‍රදාන ලැබීම්	177,500,000	142,109,507
මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ඇති වූ / (භාවිත කළ) ශුද්ධ මුදල් ප්‍රවාහය	63,622,811	(2,918,363,366)
මුදල් හා මුදල් සමානකාවල ශුද්ධ වැඩිවීම/ (අඩුවීම)	250,689,108	(113,263,477)
වසර ආරම්භයේ මුදල් හා මුදල් සමානකා	160,304,323	273,567,800
වසර අවසානයේ මුදල් හා මුදල් සමානකා	**410,993,431**	**160,304,323**

මෙම ගිණුම්කරණ ප්‍රතිපත්ති හා පිටු අංක 69 - 91 දක්වා සටහන් මූල්‍ය ප්‍රකාශනවල අත්‍යවශ්‍ය කොටසකි.

මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්

2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා

1. සංස්ථාපිත තොරතුරු

වී අලෙවි මණ්ඩලය (PMB) 1971 අංක 14 දරණ වී අලෙවි මණ්ඩල පනතේ විධිවිධාන යටතේ ස්ථාපනය කරන ලද ව්‍යවස්ථාපිත මණ්ඩලයක් වන අතර එය ශ්‍රී ලංකාවේ නිත්‍ය වශයෙන් ස්ථාපනය වී තිබේ. මෙහි ලියාපදිංචි කාර්යාලය හා ප්‍රධාන ව්‍යාපාරික ස්ථානය කොළඹ 02, යුනියන් පෙදෙසේ අංක 330 ස්ථානයේ පිහිටා තිබේ.

වසර 2000 සිට 2007 දක්වා වූ කාල පරිච්ඡේදය තුළ වී අලෙවි මණ්ඩලය ඇවර කිරීමට නියමිතව තිබුණු අතර එවකට සිටි කෘෂිකර්ම සංවර්ධන හා ගොවිජන සේවා අමාත්‍ය ගරු මෛත්‍රීපාල සිරිසේන මැතිතුමා විසින් 2007 දෙසැම්බර් 01 දා සිට ක්‍රියාත්මක වන පරිදි වී අලෙවි මණ්ඩලය නැවත සක්‍රීය කරනු ලැබීය.

1.1 මූල්‍ය ප්‍රකාශන නිකුත් කිරීම සඳහා අවසර ලබා දුන් දිනය.

2019.09.03 දින අධ්‍යක්ෂ මණ්ඩලය මගින් සම්මත කරන ලද යෝජනාවකට අනුව 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වසර සඳහා මූල්‍ය ප්‍රකාශන නිකුත් කිරීම සඳහා අවසර දෙන ලදී.

1.2 මූල්‍ය ප්‍රකාශන සඳහා වගකීම

ශ්‍රී ලංකාවේ වරලත් ගණකාධිකාරීවරුන්ගේ ආයතනය විසින් නිකුත් කරන ලද ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට (SLFRS සහ LKAS) අනුකූලව මෙම මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩලය වගකිව යුතු අතර වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

1.3 ප්‍රධාන ක්‍රියාකාරකම් හා මෙහෙයුම්වල ස්වභාවය

වී අස්වනු නෙළන සමයේ දී වී මිලදී ගැනීම හා වී විකිණීම වී අලෙවි මණ්ඩලයේ ප්‍රධාන ව්‍යාපාරික කටයුත්ත වේ.

1.4 පිළියෙළ කිරීමේ පදනම

(අ) අනුකූලතාව පිළිබඳ ප්‍රකාශය

මූල්‍ය තත්ත්ව ප්‍රකාශය, විස්තීර්ණ ආදායම් ප්‍රකාශය, සාමාන්‍ය කොටස් වෙනස්වීම පිළිබඳ ප්‍රකාශය, මූල්‍ය ප්‍රවාහ ප්‍රකාශය හා මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්වලින් මූල්‍ය ප්‍රකාශන සමන්විත වේ. ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය මගින් නිකුත් කරන ලද ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති (ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිති හා ලංකා ගිණුම්කරණ ප්‍රමිති) වලට අනුකූලව මෙම මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කර තිබේ.

(ආ) ඇගයීමේ පදනම

අදාළ සටහන් යටතේ ධාරණ අගයට අදාළව සුදුසු හෙළිදරවු කිරීම් සිදු කරන අවස්ථා හැර මූල්‍ය ප්‍රකාශ ඓතිහාසික පිරිවැය පදනම මත පිළියෙළ කරනු ලැබීය.

මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්

2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා

(ඇ) **සංසන්දනාත්මක තොරතුරු**

වර්තමාන කාලපරිච්ඡේදයේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව අවබෝධය වැඩිදියුණු කිරීම සඳහා ද කාල පරිච්ඡේද අතර සංසන්දනාත්මකභාවය වැඩිදියුණු කිරීම සඳහා ද මූල්‍ය ප්‍රකාශනවල වාර්තා කරන ලද සියලු ප්‍රමාණ සඳහා ප්‍රමාණාත්මක, සවිස්තරාත්මක තොරතුරු ඇතුළත් සංසන්දනාත්මක තොරතුරු පසුගිය කාල පරිච්ඡේදයට අදාළව හෙළිදරවු කරනු ලැබේ.

(ඈ) **මූල්‍ය හා ඉදිරිපත් කිරීමේ ව්‍යවහාර මුදල්**

වී අලෙවි මණ්ඩලයේ ක්‍රියාකාරී හා ඉදිරිපත් කිරීමේ ව්‍යාවහාර මුදල් වර්ගය වන ශ්‍රී ලංකා රුපියල්වලින් මෙම මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කර තිබේ.

වෙනත් ආකාරයකින් සඳහන් කර ඇත්නම් හැර, ශ්‍රී ලංකා රුපියල්වලින් ඉදිරිපත් කරන ලද සියලුම මූල්‍ය තොරතුරු ආසන්නතම රුපියලට වටයා ඇත.

(ඉ) **තක්සේරු කිරීම් හා නීන්දු උපයෝගී කර ගැනීම.**

ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිති / ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කිරීමේ දී හා ඉදිරිපත් කිරීමේ දී කළමනාකාරිත්වය විසින් ගිණුම්කරණ ප්‍රතිපත්ති භාවිත කිරීම සඳහා මෙන්ම වත්කම්, වගකීම්, ආදායම් හා තක්සේරු කිරීම්වලට බලපාන නීන්දු, තක්සේරු කිරීම් හා උපකල්පන සිදුකිරීම අවශ්‍ය වේ. එසේ භාවිත කරනු ලබන තක්සේරු කිරීම් හා නීන්දු මගින් තථ්‍ය ප්‍රතිඵල වෙනස් විය හැකිය.

තක්සේරු කිරීම් හා බලපවත්වන උපකල්පන පවත්නා පදනම මත සමාලෝචනය කෙරේ. ගිණුම්කරණ තක්සේරු සඳහා සිදුකරනු ලබන ප්‍රතිශෝධන එම කාල පරිච්ඡේදයට පමණක් බලපෑමක් සිදු කරන්නේ නම් හෝ ප්‍රතිශෝධනය සිදුකරනු ලබන කාල පරිච්ඡේදයට හෝ අනාගත කාල පරිච්ඡේදයට බලපෑමක් සිදු කරන්නේ නම් එවැනි ප්‍රතිශෝධන සිදු කරනු ලබන අතර එම ප්‍රතිශෝධන වර්තමාන හා අනාගත කාල ද්විත්වයම සඳහා බලපාන්නේ නම් එවැනි ප්‍රතිශෝධන සිදු කරනු නොලැබේ.

මූල්‍ය ප්‍රකාශනවල පිළිගන්නා ප්‍රමාණ මත ඉතා කැපී පෙනෙන බලපෑමක් සිදු කරන ගිණුම්කරණ ප්‍රතිපත්ති යොදා ගැනීමේ දී තක්සේරු කිරීම්, අනියතතාව හා තීරණාත්මක නීන්දු සම්බන්ධ වැදගත් ක්ෂේත්‍ර පිළිබඳ තොරතුරු මූල්‍ය ප්‍රකාශනවල සටහන් ලෙස ඇතුළත් කරනු ලැබේ.

2. වත්කම් හා ඒවා ඇගයීමේ පදනම

2.1 දේපළ, පිරියත හා උපකරණ

(අ) පිරිවැය

එදිනෙදා සේවා කිරීම සඳහා වන පිරිවැය හැර දේපළ, පිරියත හා උපකරණ සමුච්චිත ක්ෂය කිරීම් හා වටිනාකමේ සමුච්චිත හානිකරණ අඩු කර පිරිවැයට දක්වනු ලැබේ. පිළිගැනීමේ නිර්ණායක තෘප්තිමත් කර ඇත්නම් පිරිවැය දැරීමේ අවස්ථාවේ දී පිරියත හා උපකරණවල කොටස් ප්‍රතිස්ථාපනය කිරීමේ පිරිවැය ද එම පිරිවැයට ඇතුළත් වේ.

මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්

2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා

(ආ) ප්‍රතිෂ්ඨාපන පිරිවැය

කාර්යසාධනය පිළිබඳ මුලින් තක්සේරු කළ ප්‍රමිතියෙන් අපේක්ෂිත අනාගත ආර්ථික ප්‍රතිලාභ ප්‍රතිෂ්ඨාපනය කිරීම හා නඩත්තු කිරීම වෙනුවෙන් දේපළ, පිරියත හා උපකරණ අලුත්වැඩියා කිරීම හා නඩත්තු කිරීම් සඳහා වැයකරනු ලබන වියදම ප්‍රතිෂ්ඨාපන පිරිවැය ලෙස හැඳින්වේ.

(ඇ) ක්ෂය කිරීම්

පහත සඳහන් කර ඇති පරිදි සමාන වාරිකවලින් එවැනි මුදල් ප්‍රමාණ ලියා හැරීම සඳහා පහත දැක්වෙන තක්සේරු කළ ඵලදායී ජීව කාලය මුළුල්ලේ සියලුම දේපළ, පිරියත හා උපකරණවල පිරිවැය හෝ වටිනාකම මත සරල රේඛීය ක්‍රමය භාවිත කරමින් ක්ෂය කිරීම් සඳහා ප්‍රතිපාදන සලසනු ලැබේ.

වත්කම් වර්ගය	**වාර්ෂික අනුපාතය**
ගොඩනැගිලි	2.5%
පරිගණක සහ උපාංග	20%
ගෘහ භාණ්ඩ සහ සවිකිරීම්	20%
කාර්යාලීය උපකරණ	20%
වෙනත් උපකරණ	20%
තරාදි	20%
තෙතමාපක	20%
මෝටර් වාහන	20%
“කොකූන් ” ගබඩා	20%
බිම් රාක්ක	20%
පාලම් තරාදි	20%

දේපළ, පිරියත හා උපකරණ අයිතමයන් හා මුලින් හඳුනාගත් වැදගත් කොටස් දේපළ, පිරියත හා උපකරණ අයිතමයන් ඉවත් කළ විට හෝ ඒවා භාවිත කිරීමෙන් තවදුරටත් අනාගත ආර්ථික ප්‍රතිලාභ අපේක්ෂා කළ නොහැකි තත්ත්වයට පත් වූ විට හෝ එවැනි දේපොළ, පිරියත හා උපකරණ අයිතමයන් පිළිගැනීම අත් හරිනු ලැබේ. දේපළ, පිරියත හා උපකරණ අයිතමයන් පිළිගැනීම අත්හැරීමෙන් සිදුවන ලාභය හෝ අලාභය වශයෙන් නිර්ණය කරනු ලබන්නේ එවැනි වත්කමක් විකුණා ලත් මුදලත් එහි ධාරණ වටිනාකමත් යන දෙකේ වෙනස වන අතර වත්කම පිළිගැනීම අත් හැරීමේ දී එම ලාභය හෝ අලාභය ආදායම් ප්‍රකාශයෙහි දක්වනු ලැබේ.

වත්කමේ අවශේෂ වටිනාකම, ඵලදායී ජීව කාලය හා ක්ෂය කිරීමේ ක්‍රම සෑම මූල්‍ය වර්ෂයකම අවසානයේ දී සමාලෝචනය කරන අතර යෝග්‍ය වේ නම්, අනාගතය සඳහා ද ගළපනු ලැබේ.

2.2 තොග

යල්පිනූ හෝ අඩුවෙන් විකිණෙන අයිතම සඳහා නිසිපරිදි ප්‍රතිභාග ලබාදීමෙන් අනතුරුව පිරිවැය හා ශුද්ධ උපලබ්ධි අගය යන දෙකෙන් අඩු අගයට තොග අගය කර ඇත. සාමාන්‍ය ව්‍යාපාරික ක්‍රියාවලිය තුළින් තොග විකිණිය හැකි මිලෙන් විකිණීම සම්පූර්ණ කිරීම සඳහා තක්සේරු කළ පිරිවැය සහ විකිණීම සඳහා අවශ්‍ය තක්සේරු කළ පිරිවැය අඩු කිරීමෙන් ශුද්ධ උපලබ්ධි වටිනාකම ලැබේ.

2.3 මූල්‍ය වත්කම්

(අ) ආරම්භක පිළිගැනීම

ලාභය හෝ අලාභය තුළින් සාධාරණ අගයට පිළිගනු ලබන මූල්‍ය වත්කම්, ණය හා ලැබිය යුතු මුදල්, කල් පිරෙනතුරු තබාගන්නා ආයෝජන හෝ විකිණීම සඳහා පවතින මූල්‍ය වත්කම් ලෙස ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති 39 විෂය පථය යටතේ වන මූල්‍ය වත්කම් වර්ගීකරණය කරනු ලැබේ.

සියලුම මූල්‍ය වත්කම් මූලිකව ඒවායේ සාධාරණ අගයට පිළිගන්නා අතර ලාභය හා අලාභය තුළින් සාධාරණ අගයට පිළිනොගන්නා වත්කම් සම්බන්ධයෙන් වන විට සෘජුව ආරෝපණය කළ හැකි ගනුදෙනු පිරිවැයට හඳුනා ගනු ලැබේ.

(ආ) පසු අවස්ථාවක තක්සේරු කිරීම

මූල්‍ය වත්කම් පසුව තක්සේරු කිරීම පහත දක්වා ඇති වර්ගීකරණය මත රඳා පවතී.

ලාභය හෝ අලාභය තුළින් සාධාරණ අගයට පිළිගන්නා ලද මූල්‍ය වත්කම්

වී අලෙවි මණ්ඩලය ලාභය හෝ අලාභය තුළින් සාධාරණ අගයට පිළිගන්නා මූල්‍ය වත්කම් ලෙස කිසිදු වත්කමක් නම් කර නොමැත.

ණය සහ ලැබිය යුතු මුදල්

සක්‍රීය වෙළපොළක මිල සඳහන් කර නොමැති නියමිත දිනට ගෙවීම් සිදු කළ හැකි හෝ නිශ්චය කළ හැකි ගෙවීම් සිදු කළ හැකි ව්‍යුත්පන්න නොකරන ලද මූල්‍ය වත්කම් ණය හා ලැබිය යුතු මුදල් ලෙස හැඳින්වේ. ආරම්භක තක්සේරුවෙන් අනතුරුව, එවැනි මූල්‍ය වත්කම් ඵලදායී පොළී අනුපාතික ක්‍රමය (EIR) භාවිත කරමින් ක්‍රමක්ෂය කළ පිරිවැයෙන් හානිකරණ පාඩු අඩු කිරීමෙන් පසුව තක්සේරු කරනු ලැබේ. අත්පත් කර ගැනීම මත ලබා දෙනු ලබන වට්ටමක් හෝ වාරිකයක් සහ සඵල පොළී අනුපාතික ක්‍රමයේ අත්‍යවශ්‍ය කොටසක් වන ගාස්තු හා පිරිවැය සැලකිල්ලට ගනිමින් ක්‍රමක්ෂය කළ පිරිවැය ගණනය කරනු ලැබේ. ඵලදායී පොළී අනුපාතික ක්‍රමයෙන් ක්‍රමක්ෂය කිරීම් ආදායම් ප්‍රකාශයේ මූල්‍ය ආදායමේ ඇතුළත් කරනු ලැබේ. හානිකරණයෙන් ඇති වන අලාභ ආදායම් ප්‍රකාශයේ මූල්‍ය පිරිවැයෙහි හඳුනා ගනු ලැබේ.

වී අලෙවි මණ්ඩලය වෙළඳ හා අනෙකුත් ලැබිය යුතු මුදල්, ස්ථාවර තැන්පතු, මුදල් හා මුදල් සමානතා ණය හා ලැබිය යුතු මුදල් ලෙස වර්ගීකරණය කරනු ලබයි.

කල් පිරෙන තුරු තබාගන්නා මූල්‍ය වත්කම්

කල් පිරෙනතුරු තබා ගන්නා මූල්‍ය වත්කම් යනු වී අලෙවි මණ්ඩල කළමනාකාරීත්වයට කල් පිරෙනතුරු තබා ගැනීමේ හැකියාවන් ඇති එමෙන්ම කල් පිරෙන තුරු තබාගැනීමට ධනාත්මක අභිප්‍රායක් ඇති නියමිත දිනට ගෙවිය යුතු හා නිශ්චය කළ හැකි ගෙවීම් සහිත ව්‍යුත්පන්න නොවන මූල්‍ය වත්කම්ය. මුල් ඇගයීමෙන් අනතුරුව කල් පිරෙන තුරු තබාගන්නා මූල්‍ය වත්කම් ඵලදායී පොළී අනුපාතික ක්‍රමය (EIR) භාවිත කරමින් ක්‍රමක්ෂය කළ පිරිවැයෙන් හානිකරණ පාඩු අඩු කිරීමෙන් පසුව තක්සේරු කරනු ලැබේ. අත්පත් කර ගැනීම මත ලබා දෙනු ලබන වට්ටමක් හෝ වාරිකයක් සහ සඵල පොළී අනුපාතික ක්‍රමයේ අත්‍යවශ්‍ය කොටසක් වන ගාස්තු හා පිරිවැය සැලකිල්ලට ගනිමින් ක්‍රමක්ෂය කළ පිරිවැය ගණනය කරනු ලැබේ. ඵලදායී පොළී අනුපාතික ක්‍රමයෙන් ක්‍රමක්ෂය කිරීම් ආදායම් ප්‍රකාශයේ මූල්‍ය ආදායමේ ඇතුළත් කරනු ලැබේ. හානිකරණයෙන් ඇති වන අලාභ ආදායම් ප්‍රකාශයේ මූල්‍ය පිරිවැයෙහි හඳුනා ගනු ලැබේ.

2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ කාල පරිච්ඡේදය තුළ වී අලෙවි මණ්ඩලය සතුව කල් පිරෙනතුරු තබාගන්නා වත්කම් කිසිවක් නොතිබුණි.

විකිණීමට තිබෙන මූල්‍ය ආයෝජන

වී අලෙවි මණ්ඩලය සතුව පවතින එක්සත් ප්‍රවෘත්ති පත්‍ර (ලංකා) සමාගමේ සාමාන්‍ය කොටස් 20,000 ක් විකිණීමට තිබෙන මූල්‍ය වත්කමක් වශයෙන් හඳුනා ගෙන ඇත.

(ඇ) **මූල්‍ය වත්කම් හානිකරණය කිරීම**

වී අලෙවි මණ්ඩලය සෑම වාර්තාකරණ දිනකම මූල්‍ය වත්කමක් හෝ වී අලෙවි මණ්ඩලයේ මූල්‍ය වත්කමක් හානිකරණයට ලක් වී ඇති බවට යම් වාස්ථවික සාක්ෂ්‍යයක් ඇත්දැයි තක්සේරු කරනු ලබයි. වත්කමේ (සිදු වූ අලාභයන්) මුල් හඳුනාගැනීමෙන් අනතුරුව සිදුවන එක් සිදුවීමක් හෝ සිදුවීම් ගණනාවක ප්‍රතිඵලයන් ලෙස හානිකරණයක් සිදුවී ඇති බවට වාස්තවික සාක්ෂ්‍ය ඇත්නම් විශ්වසනීය ලෙස තක්සේරු කළ හැකි වන මූල්‍ය වත්කමේ හෝ **වී අලෙවි මණ්ඩලය**ට අයත්වන මූල්‍ය වත්කමේ තක්සේරු කළ අනාගත මූල්‍ය ප්‍රවාහ මත බලපෑමක් එම අලාභය නිසා සිදු වේ නම් මූල්‍ය වත්කම හෝ වී අලෙවි මණ්ඩලයේ මූල්‍ය වත්කම් හානිකරණය වී ඇති බව සලකනු ලැබේ. ණය ගැතියන් හෝ වී අලෙවි මණ්ඩලයේ ණය ගැතියන් කැපී පෙනෙන මූල්‍ය දුෂ්කරතා අත් විඳියි නම් හෝ පොළී හා ප්‍රධාන ගෙවීම්වල පැහැර හැරීමක් හෝ වස්තු භංගත්වයට පැමිණීම හෝ වෙනත් මූල්‍ය ප්‍රතිසංවිධානගතවීමක් හා ගෙවීම් පැහැර හැරීමට අදාළ වන හිඟ මුදල් හා ආර්ථික තත්ත්වයේ වෙනස්වීමක් වැනි තක්සේරු කළ අනාගත මූල්‍ය ප්‍රවාහයේ මිණිය හැකි අඩු වීමක් පවතින බව නිරීක්ෂණය කළ හැකි දත්තවලින් පැහැදිලි වීම හානිකරණයක් සිදු වී ඇති බවට වන සාක්ෂ්‍ය වේ.

මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්

2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා

ක්‍රමක්ෂය කළ පිරිවැයට ගැනෙන මූල්‍ය වත්කම්

ක්‍රමක්ෂය කළ පිරිවැයට ගැනෙන මූල්‍ය වත්කම් සඳහා ඒවාට පෞද්ගලික වන පරිදි හා පෞද්ගලිකව වැදගත් නොවන මූල්‍ය වත්කම් සඳහා සාමූහිකව හෝ හානිකරණයට ලක්වීම පිළිබඳව සාක්ෂ්‍ය ඇත්දැයි වී අලෙවි මණ්ඩලය පළමුව තක්සේරු කරනු ලැබේ. වැදගත් හෝ වැදගත් නොවන පෞද්ගලිකව තක්සේරු කරනු ලබන මූල්‍ය වත්කමක් සඳහා හානිකරණයක් පවතින බවට වාස්තවික සාක්ෂ්‍ය නොමැති බවට වී අලෙවි මණ්ඩලය තීරණය කරන්නේ නම්, එම වත්කම වී අලෙවි මණ්ඩලයේ සමාන ණය අවදානම් ලක්ෂණ සහිත මූල්‍ය වත්කම්වලට ඇතුළත් කරනු ලබන අතර ඒවා හානිකරණ සඳහා සාමූහිකව තක්සේරු කරනු ලැබේ. පෞද්ගලිකව තක්සේරු කරනු ලබන වත්කමක හානිකරණ අලාභ තිබේ නම් හෝ අඛණ්ඩව හානිකරණ අලාභ පවතියි නම් හෝ හානිකරන අලාභ පවතින බවට හඳුනා ගන්නා ලද්දේ නම්, එබඳු වත්කම් හානිකරණ තක්සේරු කිරීම්වලට සාමූහිකව ඇතුළත් නොකරයි.

හානිකරණ අලාභ සිදු වී ඇති බවට වාස්තවික සාක්ෂ්‍ය ඇත්නම්, වත්කමේ ධාරණ ප්‍රමාණය හා තක්සේරු කළ අනාගත මූල්‍ය ප්‍රවාහයේ (මේ වන තෙක් වැය නොකරන ලද අනාගත අපේක්ෂිත ණය හානි හැර) වර්තමාන අගය යන අගයන් දෙක අතර වෙනස ලෙස හානිකරණ අලාභය තක්සේරු කරනු ලැබේ. තක්සේරු කළ අනාගත මූල්‍ය ප්‍රවාහයේ වර්තමාන අගය මූල්‍ය වත්කමේ මුල් සඵල පොළී අනුපාතිකයට වට්ටම් කරනු ලැබේ. ණය මුදලක් සඳහා විචල්‍ය පොළී අනුපාතයන් ඇත්නම්, හානිකරණ අලාභය තක්සේරු කිරීම සඳහා වන වට්ටම් අනුපාතය ප්‍රවර්තන සඵල පොළී අනුපාතය වේ.

ප්‍රතිභාග ගිණුමක් භාවිත කිරීම තුළින් වත්කමේ ධාරණ අගය අඩු වන අතර අලාභයේ ප්‍රමාණය ආදායම් ප්‍රකාශයේ හඳුනා ගැනේ. අඩු වූ ධාරණ ප්‍රමාණය මත පොළී ආදායම උපචිත වීම අඛණ්ඩව සිදුවන අතර හානිකරණ අලාභය තක්සේරු කිරීමේ අරමුණින් අනාගත මූල්‍ය ප්‍රවාහය වට්ටම් කිරීමට භාවිත කරන පොළී අනුපාතය භාවිත කරමින් පොළී ආදායම උපචිත වේ. පොළී ආදායම ආදායම් ප්‍රකාශයේ මූල්‍ය ආදායමේ කොටසක් වශයෙන් ගිණුම්ගත කරයි. අනාගතයේ ප්‍රතිලාභ වීම පිළිබඳව සැබෑ වන අපේක්ෂාවක් නොමැති විට හා සියලුම අතිරේක මුදල් වී අලෙවි මණ්ඩලයට උපලබ්ධි වී ඇති විට හෝ මාරු කර ඇති විට ආශ්‍රිත ප්‍රතිභාග සමඟ ණය ලියා හරිනු ලැබේ. හානිකරණය හඳුනා ගැනීමෙන් පසුව ඇතිවන සිදුවීමක් හේතුවෙන් පසුව එළැඹෙන වසර තුළ තක්සේරු කළ හානිකරණ අලාභයේ ප්‍රමාණය වැඩි වේ නම් හෝ අඩු වේ නම්, ප්‍රතිභාග ගිණුම ගැළපීම මගින් මුලින් හඳුනාගත් හානිකරණ අලාභය වැඩිකිරීම හෝ අඩුකිරීම සිදු කරනු ලැබේ. අනාගත ලියා හැරීමක් පසුව ආපසු අය කර ගතහොත්, ආපසු අය කර ගැනීම ආදායම් ප්‍රකාශයේ මූල්‍ය පිරිවැයට බැර කරනු ලැබේ.

(ඇ) **මුදල් හා මුදල් සමාන දෑ**

කලින් දන්නා මුදල් ප්‍රමාණවලට පහසුවෙන් පරිවර්තනය කළ හැකි සහ අගය වෙනස් වීමේ සුළු අවදානමකට පමණක් යටත් ඉහළ ද්‍රවශීලතාවක් සහිත කෙටිකාලීන ආයෝජනවලින් හා අත ඇති මුදල්වලින් සහ ඉල්ලුම් තැන්පතුවලින් මුදල් හා මුදල් සමානතා සමන්විත වේ.

මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ අරමුණු සඳහා මුදල් හා මුදල් සමාන දෑ ලෙස සලකනු ලබන්නේ අත ඇති මුදල් හා තවමත් ගෙවීමට තිබෙන බැංකු අයිරාව අඩු කළ බැංකු තැන්පතුය. අත්පත් කර ගත් දිනයේ සිට මාස තුනක් හෝ ඊට අඩු කාලයක් වැනි කෙටි කාලයකින් කල් පිරෙන ආයෝජන ද මුදල් සමාන දෑ වශයෙන් සලකනු ලැබේ.

2.4 මූල්‍ය වගකීම්

(අ) මූලික පිළිගැනීම හා තක්සේරු කිරීම

ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති 39 විෂය පථය යටතේ වන මූල්‍ය වගකීම්, ලාභය හෝ අලාභය තුළින් සාධාරණ අගයට පිළිගනු ලබන මූල්‍ය වගකීම් හෝ යෝග්‍ය පරිදි ණය මුදල් හා ණයට ගැනීම් වශයෙන් වර්ගීකරණය කර තිබේ. මූලික පිළිගැනීමේ දී වී අලෙවි මණ්ඩලය එහි මූල්‍ය වගකීම්වල වර්ගීකරණය නිර්ණය කරයි.

සියලුම මූල්‍ය වගකීම් මූලික වශයෙන් එහි සාධාරණ අගයට පිළිගනු ලබන අතර ණය මුදල් හා ණය ගැනීම් සම්බන්ධයෙන් ක්‍රමක්ෂය කළ පිරිවැයට පිළිගනු ලැබේ. මෙයට සෘජු ගනුදෙනු පිරිවැය ද ඇතුළත් වේ.

වී අලෙවි මණ්ඩලයේ මූල්‍ය වගකීම්වලට වෙළෙඳ හා අනෙකුත් ගෙවිය යුතු මුදල් හා ණය මුදල් හා ණය ගැනීම් ද ඇතුළත් වේ.

(ආ) පසුව සිදුකරනු ලබන තක්සේරු කිරීම්

මූල්‍ය වගකීම්වල තක්සේරු කිරීම් පහත සඳහන් කර ඇති පරිදි ඒවායේ වර්ගීකරණය මත රඳා පවතී.

ලාභය හා අලාභය හරහා සමාන අගයට පිළි ගනු ලබන මූල්‍ය වගකීම්.

ලාභය හා අලාභය හරහා සාධාරණ අගයට පිළිගනු ලබන මූල්‍ය වගකීම්වලට වෙළඳාම සඳහා තබන ලද මූල්‍ය වගකීම් හා මූලික හඳුනාගැනීමෙන් අනතුරුව ලාභය හා අලාභය හරහා සාධාරණ අගයට පිළිගනු ලබන මූල්‍ය වගකීම් ඇතුළත් වේ.

නුදුරු අනාගතයේ දී විකිණීමේ අරමුණින් අත්පත් කර ගන්නා මූල්‍ය වගකීම් වෙළෙඳාම සඳහා තබාගන්නා මූල්‍ය වගකීම් ලෙස හඳුනා ගනු ලැබේ. මෙම ප්‍රවර්ගයට ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති 39 මගින් නිර්වචනය කරන ලද ඉදිරි රැකුම් සබඳතාවල දී ඉදිරි රැකුම් මෙවලම් ලෙස නම් නොකරන ලද වී අලෙවි මණ්ඩලය ඇතුළත් වූ ව්‍යුත්පන්න කළ හැකි මූල්‍ය මෙවලම් ඇතුළත් වේ. සඵලදායී ඉදිරි රැකුම් මෙවලම් ලෙස නම් කර නොමැති නම්, වෙන් කරන ලද හා ඔබ්බවන ලද ව්‍යුත්පන්න ද වෙළෙඳාම සඳහා තබා ගන්නා වගකීම් ලෙස වර්ගීකරණය කෙරේ.

වෙළෙඳාම සඳහා තබන ලද වගකීම්වලින් ලබා ගත් ලාභ හෝ අලාභ ආදායම් ප්‍රකාශයේ හඳුනා ගැනේ.

වී අලෙවි මණ්ඩලය මගින් මූලික පිළිගැනීමේ දී ලාභය හෝ අලාභය හරහා සාධාරණ අගයට පිළිගනු ලැබූ කිසිදු මූල්‍ය වගකීමක් නොමැත.

(ඇ) ණය මුදල් හා ණයට ගැනීම

මූලික පිළිගැනීමෙන් අනතුරුව, පොළී උත්පාදන ණය මුදල් හා ණයට ගැනීම් සඵල පොළී අනුපාතික ක්‍රමය උපයෝගී කර ගනිමින් පසු අවස්ථාවක ක්‍රමක්ෂය කළ පිරිවැයට තක්සේරු කරනු ලැබේ. සඵල පොළී අනුපාත ක්‍රමය භාවිත කර ක්‍රමක්ෂය කිරීමේ ක්‍රියාවලිය තුළින් ද පිළිගැනීම අත්හරින ලද වගකීම් ඇති විට ලාභ හා අලාභ ආදායම් ප්‍රකාශනයේ පිළිගැනේ.

අත්පත් කර ගැනීම මත ලබා දෙනු ලබන වට්ටමක් හෝ වාරිකයක් සහ සඵල පොළි අනුපාතික ක්‍රමයේ අත්‍යවශ්‍ය කොටසක් වන ගාස්තු හා පිරිවැය සැලකිල්ලට ගනිමින් ක්‍රමක්ෂය කළ පිරිවැය ගණනය කරනු ලැබේ. ඵලදායී පොළී අනුපාතික ක්‍රමයෙන් ක්‍රමක්ෂය කිරීම් ආදායම් ප්‍රකාශයේ මූල්‍ය ආදායමේ ඇතුළත් කරනු ලැබේ. වී අලෙවි මණ්ඩලය මගින් පොළී උත්පාදන ණය මුදල් හා ණයට ගැනීම් හා වෙනත් ණයට ගැනීම්, ණය මුදල් හා ණයට ගැනීම් ලෙස වර්ගීකරණය කර තිබේ.

(ඇ) මූල්‍ය සහතික කොන්ත්‍රාත්තු

වී අලෙවි මණ්ඩලය මගින් නිකුත් කරන ලද මූල්‍ය සහතික කොන්ත්‍රාත්තු යනු ණය මෙවලමේ නියමවලට අනුව ගෙවිය යුතු අවස්ථාවේ ගෙවීමක් සිදු කිරීමට සුවිශේෂී ණයගැතියකු අසමත් වීම නිසා එම මූල්‍ය මෙවලම මගින් සිදුකරන අලාභය එම මූල්‍ය මෙවලම දරන පුද්ගලයා වෙත ප්‍රතිපූර්ණය කිරීම සඳහා ගෙවීමක් සිදුකිරීම අවශ්‍ය වන කොන්ත්‍රාත් වේ. මෙම මූල්‍ය සහතික කොන්ත්‍රාත්තුව වගකීමක් වශයෙන් මූලිකව පිළිගන්නා අතර සහතික නිකුත් කිරීමට සෘජුව දායක වන ගනුදෙනු පිරිවැයට ගළපන ලද සාධාරණ අගයට ඒවා පිළි ගනු ලැබේ. පසු අවස්ථාවක දී, මූල්‍ය වාර්තාකරණ දිනට වර්තමාන වගකීම් නිරවුල් කිරීම සඳහා අවශ්‍ය වන වියදම පිළිබඳ විශිෂ්ටතම තක්සේරුව හා පිළිගත් අගයෙන් සමුච්චිත ක්‍රමක්ෂය අඩු කිරීමෙන් ලැබෙන අගය යන දෙකෙන් වැඩිම අගයට තක්සේරු කරනු ලැබේ.

පිළිගැනීම අත්හැරීම

වගකීම යටතේ පවතින බැඳීමෙන් නිදහස්වීම හෝ අවලංගු කිරීම හෝ කල් ඉකුත් වීම සිදු වූ විට මූල්‍ය වගකීම පිළිගැනීම අත්හරිනු ලැබේ. පවතින මූල්‍ය වගකීමක් එම ණයහිමියා විසින් ම සාරානුකූලව වෙනස් වන නියමයන් මත පදනම් වන වෙනත් මූල්‍ය වගකීමකින් ප්‍රතිස්ථාපනය කරනු ලැබූ විට හෝ පවතින වගකීමක නියමයන් සාරානුකූලව වෙනස් කළ විට එවැනි හුවමාරුකිරීමක් හෝ වෙනස් කිරීමක් මුල් වගකීම පිළිගැනීම අත්හැරීමක් ලෙස සලකනු ලබන අතර අළුත් වගකීම පිළිගැනීමක් ලෙස ද සලකනු ලැබේ. අදාළ ධාරණ ප්‍රමාණවල වෙනස ආදායම් ප්‍රකාශයේ හඳුනා ගැනේ.

මූල්‍ය මෙවලම් හිලව් කිරීම

පිළිගත් ප්‍රමාණ හිලව් කිරීමට දැනට බලාත්මකව පවතින නෛතික අයිතිවාසිකම් පවතී නම් සහ ශුද්ධ පදනම මත නිරවුල් කිරීමට අභිමතයක් තිබේ නම් හෝ වත්කම් එකිනෙකට සමගාමීව උපලබ්ධි කිරීමට හා වගකීම් නිරවුල් කිරීමට අවශ්‍ය වේ නම්, මූල්‍ය වත්කම් හා මූල්‍ය වගකීම් හිලව් කරනු ලබන අතර ඒකාබද්ධ මූල්‍ය තත්ත්ව ප්‍රකාශයේ ශුද්ධ ප්‍රමාණය වාර්තා කරනු ලැබේ.

2.5 ප්‍රතිපාදන

වී අලෙවි මණ්ඩලයට අදාළ වගකීම නිරවුල් කිරීම සඳහා ආර්ථික ප්‍රතිලාභ අන්තර්ගත වූ සම්පත් ගලනයක් සිදුවිය හැකි එමෙන්ම බැඳීමේ ප්‍රමාණය පිළිබඳ විශ්වාසනීය තක්සේරුවක් කළ හැකි පූර්ව සිදුවීමක ප්‍රතිඵලයක් වශයෙන් සිදුවන වර්තමාන බැඳීමක් (නෛතික හෝ අනුමිත) ඇති වන අවස්ථාවක ප්‍රතිපාදන පිළිගනු ලැබේ. යම් ප්‍රතිපාදන ප්‍රමාණයක් හෝ සියලුම ප්‍රතිපාදන ප්‍රතිපූරණය කිරීමට වී අලෙවි මණ්ඩලය අපේක්ෂා කරන විට එය සත්‍ය වශයෙන්ම ස්ථීර වේ නම් පමණක් මෙම ප්‍රතිපූර්ණය වෙනම වත්කමක් වශයෙන් පිළිගනියි. යම් ප්‍රතිපාදනයකට අදාළ වන වියදම යම් ප්‍රතිපූරණයක් අඩුකර ආදායම් ප්‍රකාශනයේ ඉදිරිපත් කෙරේ. මුදලේ කාල වටිනාකමේ බලපෑම වැදගත් වන්නේ නම්, මුදලේ කාල වටිනාකම පිලිබඳ වර්තමාන වෙළෙඳපොළ තක්සේරුව මගින් ද, යෝග්‍ය වන පරිදි සහ වගකීමට සුවිශේෂී වූ අවදානම ද පිළිබිඹු කෙරෙන පූර්ව වෙළෙඳ අනුපාතයක් අපේක්ෂිත අනාගත මුදල් ප්‍රවාහය වට්ටම් කිරීමෙන් ප්‍රතිපාදන නිශ්චය කරනු ලැබේ. වට්ටම් කිරීම භාවිතා කරන අවස්ථාවල කාලය ගත වීම හේතුවෙන් ප්‍රතිපාදන ඉහළ යෑම පොළී වියදම ලෙස හඳුනා ගනු ලැබේ.

අවසාන වී තොගයේ තෙතමන හානිය සඳහා ප්‍රතිපාදන 3% ක අනුපාතයකින් ගණනය කරනු ලැබේ.

2.6 රජයේ ප්‍රදාන

ප්‍රදාන ලැබෙන බවට හා අමුණා ඇති සියලු කොන්දේසිවලට අනුගත වන බවට යුක්ති සහගත සහතිකයක් පවතින විට, රජයේ ප්‍රදාන පිළිගනියි. ප්‍රදානය වැය අයිතමයකට අදාළ වන විට, හිලව් කිරීමට අපේක්ෂිත පිරිවැය වැය වන කාල පරිච්ඡේදය මුළුල්ලේ විධිමත් පදනමක් මත ආදායම ලෙස පිළිගැනේ. ප්‍රදානය වත්කමකට අදාළ වන විට, අදාළ වත්කමේ අපේක්ෂිත ඵලදායී ආයු කාලය මුළුල්ලේ සමාන ප්‍රමාණවලින් එය ආදායමක් වශයෙන් පිළිගැනේ.

කණ්ඩායමට මුදල් නොවන ප්‍රදාන ලැබෙන විට වත්කම් හා ප්‍රදානය නාමමාත්‍ර ප්‍රමාණවලින් මුළුමනින් වාර්තාකරන අතර සමාන වාර්ෂික වාරිකවලින් බලපවත්වන වත්කමේ ප්‍රතිලාභය භාවිත කරන රටාවෙන් අපේක්ෂිත ඵලදායී ආයු කාලය මුළුල්ලේ ලාභයට හෝ අලාභයට නිදහස් කෙරේ. වර්තමානයේ අදාළ වන වෙළෙඳපොළ අනුපාතිකයට වඩා පහළ පොළී අනුපාතිකයක් සමඟ රජය හෝ අදාළ ආයතනවලින් ණය මුදල් හෝ සමාන සහායක් ලබා දෙන අවස්ථාවක මෙම වාසිදායක පොළියේ බලපෑම රජයේ ප්‍රදානය ලෙස සලකනු ලබයි.

2.7 විශ්‍රාම ප්‍රතිලාභ සැලසුම්

2.7.1 නිශ්චිත ප්‍රතිලාභ සැලසුම - පාරිතෝෂික

වසර 01 ක සේවා කාලය සම්පූර්ණ කර ඇති සියලුම සේවකයින්ට මූලික වැටුපෙන් අඩක් බැගින්, මූල්‍ය වර්ෂයේ අවසාන මාසය සඳහා හෝ සම්පූර්ණ කරන ලද සෑම වසරකම සේවය සඳහා සේවය අවසානයේ දී ප්‍රතිලාභ ලබා දී ඇත. ප්‍රතිපාදන සඳහා බාහිරව අරමුදල් සපයා නොමැති අතර ආයුගණක තක්සේරුවක් ද සිදු කර නොමැත.

2.7.2 නිශ්චිත ප්‍රතිලාභ සැලසුම

සමාගමේ සියලුම සේවකයින් සේවක අර්ථසාධක අරමුදලේ සහ සේවක භාර අරමුදලේ සාමාජිකයන් වන අතර ,එම සේවකයින්ගේ ඒකාබද්ධ වැටුප මත පදනම්ව සියලුම සේවා යෝජකයන් විසින් සේවක අර්ථසාධක අරමුදල සඳහා 12%කින් ද, සේවක භාරකාර අරමුදල සඳහා 3% කින් ද දායක වේ.) මූලික වැටුපෙන් සහ අනෙකුත් දීමනා වලින් ඒකාබද්ධ වැටුප සැකසේ.)

2.8 ආදායම් පිළිගැනීම

වී අලෙවි මණ්ඩලයට ආර්ථික ප්‍රතිලාභ ගැලීමේ හැකියාවක් පවතින ප්‍රමාණයට ආදායම පිළිගන්නා අතර ආදායම හෝ දරන ලද හෝ දැරීමට නිබෙන ඒ ආශ්‍රිත පිරිවැය විශ්වසනීය ලෙස තක්සේරු කළ හැකිය. ලැබුණු හා ලැබීමට නියමිත ප්‍රතිෂ්ඨාවේ සාධාරණ අගයෙන් වෙළෙඳ වට්ටම් හා විකුණුම් බදු අඩු කිරීමෙන් ආදායම තක්සේරු කරනු ලැබේ.

2.9 භාණ්ඩ විකිණීම

වැදගත් අවදානම් සහ භාණ්ඩවල අයිතිය පිළිබඳ පාරිතෝෂික ද, භාණ්ඩ පිටත් කර හරින අවස්ථාවේ ම ගැණුම්කරු වෙත මාරු කිරීමේ අවස්ථාවේ දී භාණ්ඩ විකිණීමෙන් ලබා ගන්නා ආදායම පිළිගැනේ.

2.10 පොළී ආදායම

මූල්‍ය මෙවලමේ අපේක්ෂිත ආයු කාලය තුළින් තක්සේරු කරන ලද අනාගත මුදල් ගෙවීම් හෝ ලැබීම් තථ්‍ය වශයෙන් වට්ටම් කරනු ලබන අනුපාතය වන සඵල පොළී අනුපාතය (EIR) භාවිත කරමින් එය උපචය වන පරිදි හෝ කෙටි කාලීනව මූල්‍ය වත්කමේ ශුද්ධ ධාරණ වටිනාකමට යෝග්‍ය වන පරිදි පොළී ආදායම වාර්තා කෙරේ. ආදායම් ප්‍රකාශයේ අනෙකුත් ආදායම්වල පොළී ආදායම ඇතුළත් කෙරේ.

මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්
2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය

3. දේපළ, පිරියත හා උපකරණ

3.1 පිරිවැය

	2018.01.01 දිනට ශේෂය	එකතු කිරීම්	බැහැර කිරීම්	ගැළපීම්	2018.12.31 දිනට ශේෂය
	රු.	රු.	රු.	රු.	රු.
ඉඩම් සහ ගොඩනැගිලි	827,360,306	108,016,412	-	(579,489)	934,797,229
පරිගණක සහ උපාංග	20,420,703	2,643,549	-	-	23,064,252
කොකුන් ගබඩා	39,330,000	-	-	-	39,330,000
ගෘහ භාණ්ඩ සහ සවිකිරීම්	16,007,094	3,219,946	-	-	19,227,040
කාර්යාලීය උපකරණ	3,307,112	3,087,374	-	-	6,394,487
වෙනත් උපකරණ	1,336,541	1,155,451	-	-	2,491,992
තෙතමාපක	12,527,600	-	-	-	12,527,600
මෝටර් වාහන	3,101,000		-	-	3,101,000
බිම් රාක්ක	115,264,240	16,405,740	-	-	131,669,980
තරාදි	5,828,173	-	-	-	5,828,173
පාලම් තරාදි	6,146,750	2,990,000	-	-	9,136,750
තොග පාලන පද්ධතිය	-	5,000,000	-	-	5,000,000
	1,050,629,520	142,518,473	-	(579,489)	1,192,568,504

3.2 ක්ෂය කිරීම

	2018.01.01 දිනට ශේෂය	වසර සඳහා ගාස්තුව	බැහැර කිරීම්	ගැළපීම්	2018.12.31 දිනට ශේෂය
	රු.	රු.	රු.	රු.	රු.
ගොඩනැගිලි	69,628,939	22,309,245	-	-	91,938,184
පරිගණක සහ උපාංග	6,854,133	3,651,378	-	-	10,505,511
කොකුන් ගබඩා	15,732,000	7,866,000	-	-	23,598,000
ගෘහ භාණ්ඩ සහ සවිකිරීම්	9,199,853	2,657,470	-	-	11,857,323
කාර්යාලීය උපකරණ	2,238,737	775,589	-	-	3,014,326
වෙනත් උපකරණ	874,665	317,096	-	-	1,191,761
තෙතමාපක	8,144,254	1,623,721	-	-	9,767,975
මෝටර් වාහන	3,101,000	-	-	-	3,101,000
බිම් රාක්ක	14,716,833	20,621,418	-	-	35,338,251
තරාදි	2,172,276	1,121,790	-	-	3,294,066
පාලම් තරාදි	503,892	1,677,850	-	-	2,181,742
	133,166,580	62,621,557	-	-	195,788,137

3.3 ශුද්ධ පොත් වටිනාකම

	2018.12.31 දිනට ශේෂය	2017.12.31 දිනට ශේෂය
	රු.	රු.
ඉඩම් සහ ගොඩනැගිලි	842,859,045	757,731,367
පරිගණක සහ උපාංග	12,558,742	13,566,571
කොකුන් ගබඩා	15,732,000	23,598,000
ගෘහ භාණ්ඩ සහ සවිකිරීම්	7,369,718	6,807,241
කාර්යාලීය උපකරණ	3,380,161	1,068,375
වෙනත් උපකරණ	1,300,231	461,877
තෙතමාපක	2,759,625	4,383,346
මෝටර් වාහන	-	-
බිම් රාක්ක	96,331,729	100,547,407
තරාදි	2,534,107	3,655,897
පාලම් තරාදි	6,955,008	5,642,858
තොග පාලන පද්ධතිය	5,000,000	-
	996,780,367	**917,462,940**

මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්

2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වසර සඳහා *

4. කෙරීගෙන යන කටයුතු	2018	2017
	රු.	රු.
ආරම්භක ශේෂය	78,891,620	86,024,585
ඉඩම් හා ගොඩනැගිලි ගිණුමට මාරු කළා	(107,436,923)	(35,012,214)
කාල පරිච්ඡේදය සඳහා ලබාදෙන ලද අත්තිකාරම්	63,335,231	52,452,910
	34,789,928	78,891,620

5. ආයෝජන	2018	2017
	රු.	රු.
ස්ථාවර තැන්පතු - ලංකා බැංකුව	498,164,881	448,814,944
එක්සත් ප්‍රවෘත්ති පත්‍ර සමාගම	127,000	127,000
	498,291,881	448,941,944

6. බඩු ලේඛන	2018	2017
	රු.	රු.
මාර්ගස්ථ භාණ්ඩ (සහල් කෙටීම සඳහා නිකුත් කළ වී)	2,234,953.42	-
වී තොග - නාඋ	264,110,545	2,245,453,947
- සම්බා	8,435,754	835,392,139
- කීරි සම්බා	1,512,265	8,987,050
සහල් තොගය	2,316,944	-
පාරිභෝජ්‍ය අයිතම	1,042,530	898,337
	279,652,991	3,090,731,472

7. වෙළඳ සහ වෙනත් ලැබිය යුතු මුදල්	2018	2017
	රු.	රු.
වෙළඳ ණයගැතියෝ (7.1)	5,823,864,901	4,151,314,979
අඩු කළා - අඩමාන ණය වෙන් කිරීම	-	-
	5,823,864,901	4,151,314,979
විවිධ ණයගැතියෝ		
ණය සහ අත්තිකාරම් (7.2)	67,095,407	63,723,310
වෙනත් ලැබිය යුතු මුදල් (7.3)	16,355,844	11,917,805
ඇප සහ තැන්පතු (7.4)	551,000	551,000
	5,907,867,152	4,227,507,094

7.1 වෙළඳ ණය ගැතියෝ	2018	2017
	රු.	රු.
සමුපකාර තොග වෙළඳ සංස්ථාව	1,467,190,102	2,867,190,052
වී විකිණීම සඳහා අමාත්‍යාංශය	32,688,410	32,688,410
ආහාර දෙපාර්තමේන්තුව	425,951,745	425,951,745
ලංකා සතොස	77,526,708	77,526,708
සහල් අපනයන අමාත්‍යාංශය	264,154,465	264,154,465
කෂ්ඨ සංස්ථාව	3,500,000	3,500,000
North - Sea	1,000,000	1,000,000
තල් සංවර්ධන මණ්ඩලය	700,000	700,000
ආහාර දෙපාර්තමේන්තුවෙන ලැබිය යුතු මුදල්	10,591,838	10,591,838
මෝල් හිමියන්ගෙන් ලැබිය යුතු මුදල්	66,395,726	68,704,726
අම්පාර ප්‍රාදේශීය ලේකම්ගෙන් ලැබිය යුතු - WFP	2,458,086	2,458,086
හම්බන්තොට ප්‍රාදේශීය ලේකම්ගෙන් ලැබිය යුතු - WFP	18,351,743	18,351,743
අපනයනය සඳහා සහල් මෝල්හිමියන්	211,447,915	211,870,394
සහල් මෝල් හිමියන් (ණය පදනම මත වී විකිණීම සඳහා)	44,399,804	44,399,804
සහල් මෝල්කරුවන් (ස.තො.ස. සහ ලෝක ආහාර -2016)	8,502,516	8,502,516
මිලදී ගැනීම් පාලන ගිණුම	49,743,530	49,743,530
හඳුනා නොගත් වී මිලදී ගැනීම්	63,980,963	63,980,963
අවිනිශ්චිත ගිණුම - වී මිලදී ගැනීම්	28,174,188	-
අවිනිශ්චිත ගිණුම - වී තොග විචලනය (7.1.1)	3,047,107,163	-
	5,823,864,901	4,151,314,979

7.1.1 2008 වසරේ සිට 2018 වසර දක්වා මිල දී ගත් තොගවලට අදාළව 2018 වසර තුළ සිදු කරන ලද තොග සත්‍යාපනයේ දී කිලෝග්‍රෑම් 85,933,454.4 ක ප්‍රමාණයක් සඳහා රු. 3,047,107,162.90 ක තොග විචලනයක් හඳුනා ගත හැකි විය. මෙම තොග විචලනය සඳහා හේතු හඳුනා ගන්නා තුරු අධ්‍යක්ෂ මණ්ඩලයේ උපදේස්වලට අනුව, රු. 3,047,107,162.90 ක තොග විචලනය අවිනිශ්චිත ගිණුමට හර කරන ලදී.

මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්
2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වසර සඳහා

7.2 ණය සහ අත්තිකාරම්

අත්තිකාරම්	**2018**	**2017**
	රු.	**රු.**
අම්පාර කලාපය	1,059,387	1,075,716
අනුරාධපුර කලාපය	308,040	169,018
ඒ.කේ ජීවන්ත කුමාර	12,000	-
බී.එම්. සජිත් කුමාර	55,738	-
බෙන් විෂන් ප්‍රින්ටර්ස් ඇන්ඩ් පබ්ලිකේටර්ස්	78,000	-
බී.ටී.එස්. ප්‍රනාන්දු	10,353	10,333
බී.එස්. වතුරේගම	20,000	20,000
ප්‍රධාන තක්සේරුකරු	110,180	120,680
සභාපති - වී අලෙවි ඔණ්ඩලය	10,000	26,000
ගොවිජන සේවා කොමසාරිස් - කුරුණෑගල	-	274,271
සමූපකාර සංවර්ධන කොමසාරිස්	9,000,000	9,000,000
නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (මෙහෙයුම්) -වී.අ.මි.	43,400	-
ගොඩනැගිලි කුලිය සඳහා ත්‍රිකුණාමලය දිස්ත්‍රික් ලේකම්	44,000	110,000
ඩී. සත්කුමාර	-	24,000
නැගෙනහිර කලාපය	441,000	65,986
ඊඑම්සී ලැබ්ස්	4,500	-
රජයේ ඒජන්ත - අම්පාර	200,000	200,000
ජී.අයි.එන්. ප්‍රනාන්දු	-	13,500
ජී.එල්.ටී.ඩී. කුලතුංග	39,934	20,000
ජී.එල්. දුමින්ගුහේවා	41,000	41,000
එච්. ජයලත්	-	10,000
අයි. ධර්මරත්න	30,000	-
කලුපහන හාර්ඩ්වෙයාර්	47,600	-
කේ.ටී.එච්.පී.එම්. පීරිස්	-	65,000
ලංකා සතොස ලිමිටඩ්	1,000,000	1,000,000
එම්.ඒ.එන්. පෙරේරා	134,899	378,708
එම්.එම්.එම්. ඒ. කුමාරසිරි	-	3,990
පීරිස් මහතා (රජයේ විගණක)	20,000	20,000
එම්.ඒ.එස්. අනුරාධිකා	5,000	-
එම්.ජී.ඩී.බී. මල්දෙණිය	10,000	-
මදාරා ඇඩ්වර්ටයිසින්	164,500	-
මුතු ප්‍රින්ටර්ස්	50,000	-
ජාතික ඉංජිනේරු පර්යේෂණ සහ සංවර්ධන මධ්‍යස්ථානය	50,000	-
වයඹ කලාපය	60,449	754,596
උතුරු කලාපය	91,925	484,870
පී.එම්.පී.එන්. පතිරාජ	40,000	-
පී.ඩබ්ලිව්.ආර්.ටී.කේ. පෙරේරා	85,000	-
පොළොන්නරුව කලාපය	74,110	1,194,455
ප්‍රසන්න මෝටර්ස්	50,000	-
මෙහෙයුම් වියදම සඳහා අත්තිකාරම් - අම්පාර	373,651	-
වී මිලදී ගැනීම් මෙහෙයුම් - දකුණු	17,349	-
වී මිලදී ගැනීම් මෙහෙයුම් - වයඹ	37,500	-
වී මිලදී ගැනීම් මෙහෙයුම් - නැගෙනහිර	125,000	-
ආර්.ඒ.එන්.එල්. රණවක	57,800	-
ආර්.එම්. මලින්ද නුවන්	33,234	114,274
මාර්ග සංවර්ධන අධිකාරිය	797,161	797,161
රාජ්‍ය විවිධ නීතිගත සංස්ථාව	234,000	3,000,000
එස්. දිනෂාන්	15,000	-
එස්. දිසානායක	12,270	-
එස්.එම්.ඩී.ඩී. සත්කුමාර	34,000	-
පද්ධති පරිපාලක - වී.අ.මි.	25,000	-
රාජ්‍ය ඉංජිනේරු සංස්ථාව - මරදගහමුල ගබඩාව	34,451,514	34,451,514
දකුණු කලාපය	1,055,543	1,168,018
වී.එල්. බන්දුල	9,000	-
ගබඩා නඩත්තුව සඳහා දිස්ත්‍රික් ලේකම්	-	143,961
ගබඩා පරිශ්‍රය පවිත්‍ර කිරීම සඳහා දිස්ත්‍රික් ලේකම්	-	746,757
වී.ඒ.එම්. දර්ශනි	78,263	72,580

මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්
2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වසර සඳහා

ඩබ්ලිව්.ආර්.එස්. රණසිංහ	-	20,000
ඩබ්ලිව්. සුබසිංහ	10,000	-
ඩබ්ලිව්. ඩී. පෙරේරා	10,000	-
වෙයිට්ටෙක් (පුද්) සමාගම	-	2,242,500
සුළු මුදල් - ත්‍රිකුණාමලය	51,515	21,515
- පොළොන්නරුව	2,278	26,005
- අනුරාධපුරය	210	29,765
- ප්‍රධාන කාර්යාලය	-	2,000
- වයඹ	776	29,723
- උතුර	30,000	30,000
- හසලක C.B.	10,000	-
උත්සව අත්තිකාරම්	210,450	195,450
ණය		
යතුරුපැදි ණය	346,362	346,362
ආපදා ණය	15,676,515	5,203,602
	67,095,407	**63,723,310**

7.3 වෙනත් ලැබිය යුතු මුදල්

	2018	**2017**
	රු.	රු.
සංවර්ධන නිලධාරිවරයාගේ සහ වෙනත් නිලධාරීන්ගේ වැටුප්		
ප්‍රතිපූරණ ගිණුම	3,310,631	2,258,252
උපචිත කුලී ආදායම	1,176,000	3,568,400
වී.අ.ම. කාර්ය මණ්ඩලයෙන් ලැබිය යුතු මුදල් - තොග හිඟ	6,615,555	890,080
ඉදි කිරීම සඳහා දිස්ත්‍රික් ලේකම්ගෙන් ලැබිය යුතු මුදල්	163,019	143,948
ලංකා බැංකුවෙන් ලැබිය යුතු මුදල්	3,282,807	3,282,807
මහජන බැංකුවෙන් ලැබිය යුතු මුදල්	1,691,330	1,691,330
ඩී.පී.ඒ.එස්. දසනායකගෙන් ලැබිය යුතු මුදල්	9,825	-
බී.එම්.එස්. කුමාරගෙන් ලැබිය යුතු මුදල්	15,600	-
එල්.එන්. ළමාඡේවාගෙන් ලැබිය යුතු මුදල්	25	-
එම්.එස්.එන්.එම්.සේනාරත්නගෙන් ලැබිය යුතු මුදල්	8,041	-
වැටුප් පාලන සහ අවකරණ	83,012	82,987
	16,355,844	**11,917,805**

7.4 ඇප හා තැන්පතු

	2018	**2017**
	රු.	රු.
නිවාස ඇප තැන්පතු	20,000	20,000
ඇප තැන්පතු	531,000	531,000
	551,000	**551,000**

8. මුදල් හා මුදල් සමානතා

	2018	**2017**
	රු.	රු.
වාසිදායක මුදල් හා කෙටිකාලීන තැන්පතු		
මුදල් හා බැංකු ශේෂ	680,843,080	229,848,894
	680,843,080	**229,848,894**

9. ප්‍රාග්ධනය හා සංචිත

දායක වූ ප්‍රාග්ධනය	2018	2017
	රු.	රු.
මහා භාණ්ඩාගාරය මගින් සපයන ලද ප්‍රාග්ධනය	631,484,518	631,484,518
	631,484,518	631,484,518

10 පොළී දරණ ණය හා ණය ගැණුම්

	2018			2017		
	ජංගම නොවන	ජංගම	එකතුව	ජංගම නොවන	ජංගම	එකතුව
	රු.	රු.	රු.	රු.	රු.	රු.
බැංකු ණය (10.1)	-	11,419,664,165	**11,419,664,165**	-	11,533,541,354	11,533,541,354
බැංකු අයිරා	-	269,849,649	**269,849,649**	-	69,544,572	69,544,572
	-	11,689,513,814	**11,689,513,814**	-	11,603,085,925	11,603,085,925

10.1 බැංකු ණය	**2018.01.01** දිනට	ලබාගත් ණය	ආපසු ගෙවීම්	**2018.12.31** දිනට
	රු.	රු.	රු.	රු.
ලංකා බැංකුව	8,589,022,392	-	16,070,349	**8,572,952,043**
මහජන බැංකුව	2,944,518,962	-	97,806,840	**2,846,712,122**
	11,533,541,354	-	113,877,189	**11,419,664,165**

11. නිර්වචිත ප්‍රතිලාභ වගකීම්

	2018	2017
	රු.	රු.
වසර ආරම්භයේ ශේෂය	17,765,901	6,274,662
වසර සඳහා ප්‍රතිපාදන	3,210,427	3,750,900
වර්ෂය සඳහා පොළිය	-	-
ආයුගණක අලාභය	-	-
පූර්ව වර්ෂය සඳහා ගැළපීම්	-	8,394,032
වසර තුළ සිදුකරන ලද ගෙවීම්	(174,789)	(653,693)
වර්ෂය අවසානයේ ශේෂය	20,801,539	17,765,901

මෙයට පෙර, වගකීම සඳහා සැලසුම් වත්කමක් ඇතැයි උපකල්පනය කරමින් වී අලෙවි මණ්ඩලය විසින් ප්‍රක්ෂේපිත ඒකක ණය ක්‍රමය මත පදනම්ව පාරිතෝෂිකය සඳහා ප්‍රතිපාදන සලසා ඇති නමුත් වී අලෙවි මණ්ඩලයට එවැනි වත්කමක් නොමැති බැවින්, මේ වසරේ වගකීම පමණක් භාවිතා කරන ආකාරයෙන් ගණනය කිරීම ප්‍රතිවර්ත කර ඇත. වී අලෙවි මණ්ඩලයේ අභ්‍යන්තර අරමුදල් භාවිතා කරමින් ගෙවීම් කටයුතු සිදු කරන ලදී.

12 විලම්බිත ආදායම්

	2018	2017
	රු.	රු.
වසර ආරම්භයේ ශේෂය	814,109,507	672,000,000
වසර තුළ ප්‍රාග්ධන වියදම් සඳහා රාජ්‍ය ප්‍රදාන	177,500,000	142,109,507
ආදායම් ප්‍රකාශය සඳහා වියදමක් වශයෙන් - ප්‍රවර්තන වසර	(56,325,729)	-
රඳවාගත් ඉපයීම් සඳහා වියදමක් වශයෙන් (2012 - 2017)	(103,170,697)	-
වර්ෂය අවසානයේ ශේෂය	832,113,082	814,109,507

වැඩිදියුණු කිරීම්, ගබඩා ඉදිකිරීම හා පරිගණකගත කිරීම් සඳහා ආයතනයට ලබා දෙන ලද රාජ්‍ය ප්‍රදාන මෙමගින් නියෝජනය කෙරේ.

මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්

2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා

13.	**වෙළඳ හා වෙනත් ගෙවිය යුතු මුදල්**	**2018**	**2017**
		රු.	**රු.**
	වෙළඳ ගෙවිය යුතු මුදල් (13.1)	248,016,056	248,161,339
	විවිධ ණයහිමියන් (13.2)	6,723,689,338	6,807,451,258
	වෙනත් ගෙවිය යුතු මුදල් (13.3)	1,309,743,470	1,438,303,646
	උපචිත වියදම් (13.4)	841,001,711	613,196,929
		9,122,450,574	9,107,113,171

13.1	**වෙළඳ ගෙවිය යුතු මුදල්**	**2018**	**2017**
		රු.	**රු.**
	ලංකා සතොස ණය	200,000,000	200,000,000
	අපනයන සඳහා සහල් මෝල් හිමියන්	4,713,654	4,858,937
	සහල් මෝල් හිමියන් (ස.තො.ස. සහ ලෝක ආහාර - 2016)	3,302,402	3,302,402
	දිසාපතිවරයාට ගෙවිය යුතු මුදල් - අම්පාර	10,000,000	10,000,000
	- ත්‍රිකුණාමලය	30,000,000	30,000,000
		248,016,056	248,161,339

13.2	**විවිධ ණයහිමියන්**	**2018**	**2017**
		රු.	**රු.**
	මහා භාණ්ඩාගාරයට ගෙවිය යුතු මුදල්	6,684,554,538	6,434,554,538
	ආහාර හා සුරක්ෂිතතා අමාත්‍යාංශයට ගෙවිය යුතු මුදල්	-	92,000,000
	ග්‍රාමීය ආර්ථික අමාත්‍යාංශයට ගෙවිය යුතු මුදල්	-	241,790,000
	විවිධ ණයහිමියන්	39,134,800	39,106,720
		6,723,689,338	6,807,451,258

13.3	**වෙනත් ගෙවිය යුතු මුදල්**	**2018**	**2017**
		රු.	**රු.**
	ප්‍රතිපාදන (13.3.1)	1,217,126,761	1,292,896,018
	ආපසු ගෙවිය යුතු තැන්පතු (13.3.2)	8,243,475	4,990,475
	වී විකිණුම් සඳහා මුදල් තැන්පතු	10,582,449	12,187,487
	සීඩබ්ලිව්ඊ කන්ස්ට්‍රක්ෂන්ස් ඇන්ඩ් ඉංජිනියරින් (පුද්) සමාගම	8,025,272	8,025,272
	සේවක අර්ධසාධක අරමුදල් ගෙවිය යුතු ගිණුම	1,692,743	1,445,204
	සේවක භාරකාර අරමුදල් ගෙවිය යුතු ගිණුම	255,547	217,032
	බැංකු දෝෂ	308,885	308,885
	සතොස සඳහා ගෙවිය යුතු මුදල්	1,202,897	1,202,897
	ඉම්පැක්ට් ඉමේජ් (පුද්.) සමාගමට ගෙවිය යුතු මුදල් Payable	5,395,090	34,437,690
	ඩබ්ලිව්.ඕ. තිලකරත්නට ගෙවිය යුතු මුදල්	1,113	1,113
	දේශීය ආදායම් දෙපාර්තමේන්තුවට ගෙවිය යුතු මුදල්	36,387	21,300
	ඉදිකිරීම් සඳහා රජයේ ඒජන්තවරයාට ගෙවිය යුතු මුදල්	40,429,668	68,226,432
	ඩී.එස්. නිකවැරටියට ගෙවිය යුතු මුදල්	68,177	-
	ගෙවිය යුතු ඇප තැන්පතු - වී.අ.මැ. යේ කාර්ය මණ්ඩලය	542,624	-
	හඳුනා නොගත් වී මිලදී ගැනීම්	-	2,741,353
	අත රැඳවුම් මුදල් - ප්‍රාග්ධන ව්‍යාපෘතිවලට අදාළ	15,352,537	11,122,645
	ගෙවිය යුතු ණය පොළිය PB 1021	468,252	468,252
	හිමිකම් නොපාන ලද වැටුප්	11,591	11,591
		1,309,743,470	1,438,303,646

13.3.1	**ප්‍රතිපාදන**	**2018**	**2017**
		රු.	**රු.**
	වී driage සඳහා ප්‍රතිපාදන	1,217,126,761	1,292,896,018
		1,217,126,761	1,292,896,018

වී අලෙවි මණ්ඩලය

මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්

2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වසර

13.3.2	ආපසු ගෙවිය යුතු තැන්පතු	2018	2017
		රු.	රු.
	එම්.එම්. ආපසු ගෙවිය යුතු තැන්පතු	372,925	372,925
	තැන්පතු - ආපසු ගෙවිය යුතු බදු කුලිය සහ වෙනත් තැන්පතු	1,943,000	490,000
	ආපසු ගෙවිය යුතු ටෙන්ඩර් තැන්පතු	5,918,550	4,118,550
	ඇප තැන්පතු - වී.අ.මැ. කාර්ය මණ්ඩලය	9,000	9,000
		8,243,475	4,990,475

13.4	උපචිත වියදම්	2018	2017
		රු.	රු.
	උපචිත විගණන ගාස්තු	1,313,234	963,234
	උපචිත වියදම්	17,552,990	17,083,617
	උපචිත ණය පොළිය	822,135,487	595,150,078
		841,001,711	613,196,929

14.	අය භාරය	2018	2017
		රු.	රු.
	අය භාරය	31,020,886	7,424,976,814
	එකතුව	31,020,886	7,424,976,814

15.	වෙනත් ආදායම්	2018	2017
		රු.	රු.
	ආපදා ණය පොළිය	442,437	190,103
	ලාභාංශ ආදායම	20,000	33,694
	ස්ථාවර තැන්පතු පොළී ආදායම	48,690,201	45,293,343
	පොළී ආදායම - ඉතිරි කිරීම්	10,618,483	425,855
	ආපසු ගෙවනු නොලබන ටෙන්ඩර් ආදායම	204,500	178,500
	විවිධ ආදායම්	1,026,028	31,548
	වී මෝල් ලියාපදිංචි කිරීමේ ආදායම	412,000	893,196
	පොලිසැක් බෑග් විකුණුම්	951,575	36,969,296
	කුලී ආදායම	7,742,510	6,021,100
	සැපයුම්කරු ලියාපදිංචි කිරීමේ ආදායම	415,000	412,875
	තොග හිඟ අය කර ගැනීමෙන් ලද ආදායම	10,424,310	1,172,204
	සහල් නියැදි විකිණුම් ආදායම	300,960	-
	භාණ්ඩාගාර ප්‍රදාන	131,750,000	96,000,000
		212,998,004	187,621,713

16.	මූල්‍ය වියදම්	2018	2017
		රු.	රු.
	බැංකු ගාස්තු	60,279	24,325
	ණය පොළිය - ලංකා බැංකුව	890,044,701	923,590,600
	ණය පොළිය - මහජන බැංකුව	328,048,622	218,027,379
	ණය අයිරා ගාස්තු	9,596,599	125,749
	රැඳවුම් බද්ද	3,604,917	4,529,534
		1,231,355,118	1,146,297,587

මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්

2018 දෙසැම්බර් 31 දිනට අවසන් වසර

17. මුදල් ප්‍රවාහ ප්‍රනාශයේ අරමුණු වෙනුවෙන් වන මුදල් සහ කෙටිකාලීන තැන්පතු

මුදල් සංරචක හා කෙටිකාලීන තැන්පතු	**2018**	**2017**
	රු.	**රු.**
17.1 වාසිදායක මුදල් හා කෙටිකාලීන තැන්පතු		
මුදල් සහ බැංකු ශේෂ	680,843,080	229,848,894
	680,843,080	229,848,894
17.2 වාසිදායක නොවන මුදල් සහ කෙටිකාලීන තැන්පතු		
බැංකු අයිරා	(269,849,649)	(69,544,572)
මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ අරමුණු වෙනුවෙන් වන මුළු මුදල් සහ කෙටිකාලීන තැන්පතු	410,993,431	160,304,323

18. ඇප තැබූ වත්කම්

වගකීම් සඳහා ඇප තැබූ වත්කම් නොමැත.

19. ශේෂ පත්‍ර දිනයෙන් පසුව සිදු වූ සිදුවීම්

ගැළපීම් සිදුකිරීම අවශ්‍ය වන හෝ මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කළයුතු වැදගත් සිදුවීම් කිසිවක් ශේෂපත්‍ර දිනෙන් පසු සිදු වී නොමැත.

වී අලෙවි මණ්ඩලය

විස්තීර්ණ ආදායම් පිළිබඳ සවිස්තරාත්මක ප්‍රකාශය
2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා

		2018.12.31 දිනෙන් අවසන් වර්ෂය රු.	2017.12.31 දිනෙන් අවසන් වර්ෂය රු.
අය භාරය	I	31,020,886	7,424,976,814
විකුණුම් පිරිවැය	II	(7,942,497)	(6,740,033,282)
දළ ලාභය		23,078,389	684,943,531
එකතු කළා: වෙනත් ආදායම්	III	212,998,004	187,621,713
අඩුකළා: වියදම්			
පරිපාලන වියදම්	IV	(233,547,335)	(186,970,856)
විකුණුම් හා බෙදාහැරීමේ වියදම්	V	(1,235,349)	(1,402,122)
මූල්‍ය පිරිවැය			
මූල්‍ය හා වෙනත් වියදම්	VI	(1,231,355,118)	(1,146,296,587)
		(1,230,061,410)	(462,104,320)

විස්තීර්ණ ආදායම් පිළිබඳ සවිස්තරාත්මක ප්‍රකාශය
2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා

1 ප්‍රකාශය	**2018**	**2017**
අය භාරය	**රු.**	**Rs.**
විකුණුම් - වී	22,463,171	7,309,376,814
වී විකිණුම් (සුන් සහල්)	4,068,728	-
සහල් විකිණීම් - ලෝක ආහාර වැඩසටහනට	-	115,600,000
වී.අ.ම. සහල් වැඩසටහන - 2018	4,488,987	-
	31,020,886	7,424,976,814

II ප්‍රකාශය	**2018**	**2017**
විකිණුම් පිරිවැය	**Rs.**	**Rs.**
විකිණුම් පිරිවැය - වී	(52,979,448)	6,584,997,456
පොදුකාර්ය	59,442,747	134,527,100
වී නිකුත් කිරීම පිළිබඳ ඍජු පොදු කාර්ය වියදම්	1,479,198	3,007,916
සහල් විකිණුම් පිළිබඳ ඍජු පොදු කාර්ය වියදම්	-	17,500,811
	7,942,497	6,740,033,282
විකිණුම් පිරිවැය		
ආරම්භක තොගය	3,089,833,136	9,692,405,242
වී මිලදී ගැනීම්	254,122,400	-
වී තොග විවලනය (හිඟය) - 2008 to 2018	(3,047,107,163)	-
තොග හිඟ	(75,769,257)	(17,574,650)
(-) අවසාන තොගය	(274,058,564)	(3,089,833,136)
	(52,979,448)	6,584,997,456
පොදුකාර්ය		
ඍජු පොදුකාර්ය		
Driage 3%	-	92,694,994
කම්කරු පිරිවැය	985,840	1,087,000
නාවිටාම් ගාස්තු	1,292,104	2,026,000
පොලිසැක් බෑග් වියදම්	40,772,515	-
තෙතමන මීටර් සහ තුලා අළුත්වැඩියා කිරීමේ ගාස්තු	-	-
වී තොග සතාහපන වියදම්	-	644,293
තුලා අළුත්වැඩියා කිරීමේ ගාස්තු	-	221,843
ගබඩා කුලී වියදම් *	-	7,220,122
වීපීඑන් සම්බන්ධතා ගාස්තු - තොග පාලන පද්ධතිය	-	1,824,210
වාහන කුලී ගාස්තු V	-	2,996,000
කිරන පාලම සඳහා සේවා ගාස්තු	-	-
	43,050,459	108,714,462
වක්‍ර පොදුකාර්ය		
පුවත්පත් දැන්වීම් ගාස්තු	1,478,399	45,080
පාරිභෝජ්‍ය අයිතම - ගබඩා	26,615	-
වෙනත් වියදම්	194,812	325,461
වී තොග නඩත්තු වියදම්	312,194	78,160
වී මිලදී ගැනීම් - විමර්ශන ගාස්තු	133,000	-
වී රක්ෂණය	-	315,651
වී අන්තර් ප්‍රවාහණය	229,020	1,307,261
මුද්‍රණ කටයුතු සහ ලිපිද්‍රව්‍ය	1,846,591	507,423
ආරක්ෂක ගාස්තු - ගබඩා	7,170,250	18,911,050
ගබඩා නඩත්තු වියදම්	927,276	2,235,272
ගබඩා පරිශ්‍ර පවිත්‍ර කිරීම්	3,660,412	1,811,300
ප්‍රවාහණ ගාස්තු	33,200	71,480
වැටුප්	210,860	204,500
අබලි වී ප්‍රවාහණ ගාස්තු	169,660	-
	16,392,288	25,812,638
	59,442,747	134,527,100
වී නිකුත් කිරීම පිළිබඳ ඍජු පොදු කාර්ය වියදම්		
පුවත්පත් දැන්වීම්කරණය	-	188,004
පාරිභෝගික අයිතම	3,895	-
කම්කරු ගාස්තු	783,480	1,084,990
නාවිටාම් ගාස්තු	679,480	464,080
වෙනත් වියදම්	3,543	20,622
වී නිකුත් කිරීම - විමර්ශන ගාස්තු	-	691,500
වී නිකුත් කිරීමේ වියදම්	-	558,720
පොලිසැක් බෑග් සඳහා වියදම්	8,800	-
	1,479,198	3,007,916
සහල් විකිණීම් පිළිබඳ ඍජු පොදු කාර්ය වියදම්		
සහල් කෙටීම් සහ ප්‍රවාහණ ගාස්තු	-	17,500,811
	-	17,500,811

* මූල්‍ය වාර්තාකරණ රාමුවේ ඉදිරිපත් කිරීමේ මාර්ගෝපදේශවලට අනුව, මෙම අයිතම පරිපාලන වියදම් යටතේ අනාවරණය කරන ලදී.

විස්තීර්ණ ආදායම් පිළිබඳ සවිස්තරාත්මක ප්‍රකාශය
2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වසර සඳහා

III ප්‍රකාශය	2018 රු.	2017 රු.
වෙනත් ආදායම්		
ආපදා ණය පොළිය	442,437	190,103
ලාභාංශ ආදායම	20,000	33,694
ස්ථාවර තැන්පතු පොළී ආදායම	48,690,201	45,293,343
පොළී ආදායම - ඉතිරි කිරීම්	10,618,483	425,855
ආපසු නොගෙවනු ලබන ටෙන්ඩර් ආදායම	204,500	178,500
විවිධ ආදායම්	1,026,028	31,548
වී මෝල් ලියාපදිංචි කිරීමෙන් ලැබෙන ආදායම	412,000	893,196
පොලිසැක් බෑග් විකුණුම් ආදායම	951,575	36,969,296
කුලී ආදායම	7,742,510	6,021,100
සැපයුම්කරුවන් ලියාපදිංචි කිරීමේ ආදායම	415,000	412,875
තොග හිඟ ආපසු අය කර ගැනීමේ ආදායම්	10,424,310	1,172,204
සහල් නියැදි විකිණුම් ආදායම	300,960	-
මහා භාණ්ඩාගාර ප්‍රදාන	131,750,000	96,000,000
	212,998,004	187,621,713

IV ප්‍රකාශය	2018 රු.	2017 රු.
පරිපාලන වියදම්		
විගණන ගාස්තු	717,425	1,537,661
විගණන සහ කළමනාකරණ කමිටු සාමාජික ගාස්තු	153,000	136,000
නවාතැන් ගාස්තු	165,828	79,540
පද්ධති පරිපාලක සඳහා දීමනාව	560,000	-
සමීක්ෂණ මණ්ඩල වියදම්	596,012	-
සභාපති දීමනාව	1,220,000	960,000
උපදේශන සහ වෙනත් ගාස්තු - වී මිලදී ගැනීම සැසඳීම	-	1,560,025
පාරිභෝජ්‍ය අයිතම	495,860	267,617
ජීවන වියදම් දීමනාව	17,716,140	18,008,380
ක්ෂය කිරීම්	62,621,557	49,450,627
අධ්‍යක්ෂ ගාස්තු	331,500	416,500
විනය පරීක්ෂණ ගාස්තු	791,980	1,018,365
විදුලිය වියදම්	2,626,307	1,789,598
සේවක අර්ධසාධක අරමුදලේ වියදම්	10,578,366	11,842,147
සේවක භාරකාර අරමුදලේ වියදම්	2,645,143	2,960,537
ඉන්ධන ගාස්තු	3,589,161	3,153,282
පාරිතෝෂික වියදම්	3,210,427	3,750,900
විමර්ශන ගාස්තු	290,590	105,500
දිරි දීමනා	491,000	-
පවිත්‍ර කිරීමේ වියදම	2,027,321	1,770,398
කම්කරු ගාස්තු	1,139,099	665,990
නෛතික වියදම්	234,000	5,000
වෛද්‍ය වාර්තා ගාස්තු	2,000	11,000
තෙතමන මීටර් සහ තරාදි අළුත්වැඩියා කිරීම	51,675	-
පුවත්පත්	124,595	120,615
වෙනත් දීමනා	12,010,512	21,600,891
වෙනත් වියදම්	184,911	651,609
අතිකාල දීමනා	1,025,128	793,092
වී තොග සත්‍යාපන වියදම්	2,132,797	-

විස්තීර්ණ ආදායම් පිළිබඳ සවිස්තරාත්මක ප්‍රකාශය
2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වසර සඳහා

විශ්‍රාම වැටුප් අරමුදල් වියදම්	76,194	27,730
තැපැල් වියදම්	194,592	217,841
මුද්‍රණය සහ ලිපිද්‍රව්‍ය	2,915,702	1,992,426
වෘත්තීය ගාස්තු	87,370	1,490,000
දේපළ ණය වියදම්	45,541	19,659
සුළු කෑම සහ බීම ගාස්තු	759,987	540,731
අළුත්වැඩියාව සහ නඩත්තුව	2,978,375	1,322,716
කුලී, වරිපනම් සහ බදු	16,708,262	2,403,955
වැටුප්	61,484,893	47,843,908
තරාදි අළුත්වැඩියා කිරීමේ ගාස්තු	1,068,179	-
ආරක්ෂක ගාස්තු	1,457,600	1,369,633
කාර්ය මණ්ඩල පුහුණු වියදම් සහ ඒ හා අදාළ වෙනත් වියදම්	2,604,227	681,340
කාර්ය මණ්ඩල සුබසාධන වියදම්	454,168	429,211
මුද්දර ගාස්තු	450	150
ගබඩා කුලී වියදම්	543,953	-
තාක්ෂණික වාර්තාව සඳහා ගාස්තු	-	176,800
දුරකථන වියදම්	1,402,012	1,665,221
පරිවර්තන ගාස්තු	91,632	92,140
ප්‍රවාහණ ගාස්තු	585,653	157,033
පරීක්ෂණ ගාස්තු	243,275	-
අභ්‍යාසලාභී දීමනා	173,500	73,500
තක්සේරු ගාස්තු	276,287	145,105
වාහන හා වෙනත් උපාංග ආදායම් බලපත්‍ර	52,460	28,651
වාහන රක්ෂණය	310,644	688,212
වාහන කුලී ගාස්තු	5,583,322	-
වාහන නඩත්තුව	2,255,186	2,409,813
වීපීඑන් සම්බන්ධතා ගාස්තු - තොග පාලන පද්ධතිය	2,430,848	-
ජල වියදම්	677,500	539,808
පාලම් තරාදි සේවා ගාස්තු	353,190	-
	233,547,335	186,970,856

විස්තීර්ණ ආදායම් පිළිබඳ සවිස්තරාත්මක ප්‍රකාශය
2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වසර සඳහා

V ප්‍රකාශය	2018	2017
	රු.	රු.
විකුණුම් හා බෙදාහැරීම් වියදම්		
දැන්වීම් සහ ප්‍රචාරණය	681,910	1,238,453
ගමන් ගාස්තු	181,439	92,709
යැපීම් දීමනා සහ රාත්‍රිය පිටත ගත කිරීමේ දීමනාව	372,000	70,960
	1,235,349	1,402,122

VI ප්‍රකාශය	2018	2017
	රු.	රු.
මූලාා වියදම්		
බැංකු ගාස්තු	60,279	23,325
ණය පොළිය - ලංකා බැංකුව	890,044,701	923,590,600
ණය පොළිය - මහජන බැංකුව	328,048,622	218,027,379
බැංකු අයිරා ගාස්තු	9,596,599	125,749
රැඳවුම් බද්ද	3,604,917	4,529,534
	1,231,355,118	1,146,296,587

VII ප්‍රකාශය	2018	2017
	රු.	රු.
වෙනත් වියදම්		
නියෝජිතයන් සඳහා කොමිස් සහ ප්‍රවාහණය - 2015/16 මහ කන්නය	7,750,220	-
පරිගණකගත කළ ජාල පද්ධතිය	3,591,046	-
ගම් පෙරළිය වැඩසටහන	24,776	-
	11,366,042	-

අතිරේක සටහන්

2018 වර්ෂයේ මූලාා ප්‍රකාශන තුළ පවතින සටහන් අංක 04ට අදාළව 2017 වර්ෂයට අදාළ සංසන්දනාත්මක අගයන්හි කෙරී ගෙන යන වැඩ ගිණුමේ ශේෂය රු.78,891,620 ක් ලෙස දන්වා තිබීම හා ආරම්භක ශේෂය රු. 86,024,585 ක් ලෙස දන්වා තිබීම නිවැරදි වේ. එහෙත් එහි විශ්ලේෂනය ඉදිරිපත් කිරීමේදි සිදු වූ ඉදිරිපත් කිරීමේ දෝෂය පහත ආකාරයෙන් නිවැරදි විය යුතුය.

	2017
ආරම්භක ශේෂය	86,024,584.62
අඩු - ඉඩම් හා ගොඩනැගිලි ගිණුමට මාරු කළා	(45,615,616.55)
එකතු - කාලවිශේදය සඳහා ලබා දෙන ලද අත්තිකාරම්	55,317,342.75
ගැලපීම්	(16,834,691.36)
	78,891,619.46

විගණකාධිපති වාර්තාව - 2018

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය எனது இல. My No. } ටීසීඑම්/ඩී/පීඑම්බී/1/18 ඔබේ අංකය உமது இல. Your No. } දිනය திகதி Date } 2020 පෙබරවාරි 03 දින.

සභාපති,

වී අලෙවි මණ්ඩලය.

වී අලෙවි මණ්ඩලයේ 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සහ වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 වන වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාව

---

1. මූල්‍ය ප්‍රකාශන

1.1 මතය ව්‍යාවනය

වී අලෙවි මණ්ඩලයේ 2018 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශන වලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (6) ව්‍යවස්ථාව ප්‍රකාරව මාගේ වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලැබේ.

මණ්ඩලයේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මම මතයක් ප්‍රකාශ නොකරමි. මතය ව්‍යාවනය සඳහා පදනම කොටසේ සාකච්ඡා කර ඇති කරුණුවල වැදගත්කම හේතුවෙන් මෙම මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් විගණන මතයක් සඳහා පදනමක් සැපයීමට ප්‍රමාණවත් හා උචිත විගණන සාක්ෂි ලබා ගැනීමට මා හට නොහැකි විය.

1.2 මතය ව්‍යාවනය සඳහා පදනම

(අ) සමාලෝචිත වර්ෂයේ බිම් රාක්ක (පැලට්) මිලදී ගැනීම වෙනුවෙන් මණ්ඩලය විසින් මුදලින් ගෙවා තිබුණේ රු.11,010,650 ක් වුවද මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ ආයෝජන ක්‍රියාකාරකම්වල රු.5,395,090 ක්වූ ගෙවිය යුතු ශේෂයද ඇතුළුව පැලට් මිලදී ගැනීම් ලෙස රු.16,405,740 ක් ලෙස දක්වා තිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂයේ කෙරීගෙන යන වැඩ සඳහා රු.63,335,231 ක් ගෙවා තිබුණද එය මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ රු.44,101,692 ක මුදල් ගලා යාම් ලෙස දක්වා තිබුණි.

(ඇ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 16 හි 51 ඡේදය අනුව ජංගම නොවන වත්කම් සඳහා ඵලදායී ජීවිත කාලය වාර්ෂිකව සමාලෝචනය නොකිරීම හේතුවෙන් පිරිවැය රු.4,654,646 ක්වූ ලොරි රථය 2014 වර්ෂය වන විට සම්පූර්ණයෙන්ම ක්ෂය කර තිබුණද තවදුරටත් ප්‍රයෝජනයට ගනිමින් පැවතුනි. ඒ අනුව වූ ඇස්තමේන්තුගත දෝෂය ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 08 ප්‍රකාරව ප්‍රතිශෝධනය කිරීමට කටයුතු කර නොතිබුණි.

(ඈ) 2018 වර්ෂයේ මණ්ඩලය විසින් සිදු කළ නොග සත්‍යාපනයේදී හඳුනාගත් රු.3,047,107,163 ක්වූ නොග ඌණතාවය විස්තිරණ ආදායම් ප්‍රකාශනයට ගැලපිය යුතු වුවද, එය මූල්‍ය තත්ත්ව ප්‍රකාශයේ වෙළඳ ණයගැතියන් යටතේ සටහන් කිරීම හේතුවෙන් ලාභය එම වටිනාකමින් අඩුවෙන් දැක්වුනි.

(ඉ) රු.353,190 ක්වූ පාලම් තරාදි සේවා ගාස්තු සෘජු පොදුකාර්ය වියදම් ලෙස ගිණුම්ගත කළ යුතු වුවද එය පරිපාලන වියදම් යටතේ ගිණුම් ගත කර තිබුණි.

(ඊ) මණ්ඩලය විසින් පවත්වාගෙන යන එක් බැංකු ජංගම ගිණුමක ශේෂය රු.153,792,930 ක් වුවද එයට අදාලව බැංකු ශේෂ සනාථ කිරීම් අනුව ශේෂය රු.45,000 ක් වූයෙන් රු.157,747,950 ක වෙනසක් පැවතුනි.

(උ) මූල්‍ය තත්ත්ව ප්‍රකාශයේ වෙනත් ලැබීම් යටතේ දක්වා තිබුණු රු.6,615,555 ක්වූ නොග ගාරකරුවන්ගෙන් ලැබිය යුතු - නොග ඌණතාවය සඳහා විගණනයට ඉදිරිපත් කර තිබුණු උපලේඛනයේ වටිනාකම රු.5,903,501 ක් වූයෙන් රු.712,054 ක වෙනසක් නිරීක්ෂණය විය.

(ඌ) 2018 දෙසැම්බර් 31 දිනට වෙළඳ ණය ගැනි ශේෂ යටතේ දක්වා තිබුණු ආහාර කොමසාරිස් දෙපාර්තමේන්තුවෙන් ලැබිය යුතු රු.425,951,745 ක් හා රු.10,591,838 ක ශේෂ සහ තල් සංවර්ධන අධිකාරියෙන් ලැබිය යුතු රු.700,000 ශේෂය සම්බන්ධයෙන් ලැබී තිබුණු ශේෂ සනාථ කිරීම් අනුව එවැනි ණය ගැනි ශේෂ නොමැති බව එම ආයතනවලින් ලිඛිතව තහවුරු කර තිබුණි.

(එ) 2018 දෙසැම්බර් 31 දිනට වෙළඳ ණයගැනි ශේෂ යටතේ දක්වා තිබුණු සමුපකාර නොග වෙළඳ සංස්ථාවෙන් අයවීමට පවතින රු.1,467,190,102 ශේෂය එම ආයතනයේ ශේෂ සනාථ කිරීම් අනුව රු.1,070,666,192 ක් බව තහවුරු කර තිබුණු අතර ඒ අනුව එම ශේෂ අතර රු.396,523,910 ක වෙනසක් පැවතුනි.

(ඒ) 2018 දෙසැම්බර් 31 දිනට වෙනත් ගෙවිය යුතු ශේෂ යටතේ දක්වා තිබුණු සමුපකාර තොග වෙළඳ සංස්ථාවට ගෙවිය යුතුව පවතින රු.1,202,897 ක ශේෂය එම ආයතනයේ ශේෂ සනාථ කිරීම් අනුව රු.85,711,719 ක් බව තහවුරු කර තිබුණු අතර ඒ අනුව එම ශේෂ අතර රු.84,508,822 ක වෙනසක් පැවතුනි

(ඔ) **විගණනය සඳහා සාක්ෂි නොවීම**

පහත සඳහන් ගිණුම් විෂයයන් ඉදිරියෙන් දක්වා ඇති සාක්ෂි ඉදිරිපත් නොකිරීම නිසා ඒවා විගණනයේදී සතුටුදායක ලෙස සන්නිරීක්ෂණය කිරීමට නොහැකි විය.

	ගිණුම් විෂයය	වටිනාකම	ඉදිරිපත් නොකළ සාක්ෂි
		රු.	
i.	හදුනා නොගත් වී මිලදී ගැනීම	63,980,963	විස්තරාත්මක තොරතුරු ශේෂ සනාථ කිරීම්
ii.	ගැනුම් පාලන ගිණුම	49,743,530	
iii.	Rice Millers ණයට විකුණුම්	44,399,804	
iv.	ලංකා බැංකුවෙන් ලැබිය යුතු ශේෂය	3,282,807	
v.	මහජන බැංකුවෙන් ලැබිය යුතු ශේෂය	1,691,330	
vi.	ලංකා සතොස	77,526,708	ශේෂ සනාථ කිරීම්
vii.	අම්පාර දිස්ත්‍රික් ලේකම් කාර්යාලයෙන් ලැබිය යුතු	2,458,086	
viii.	හම්බන්තොට දිස්ත්‍රික් ලේකම් කාර්යාලයෙන් ලැබිය යුතු	18,351,743	
ix.	අමාත්‍යාංශයෙන් ලැබිය යුතු	296,842,875	

(ඕ) 2018 දෙසැම්බර් 31 දිනට විවිධ ණය හිමියෝ යටතේ දක්වා තිබුණු රු.6,684,554,538 ක්වූ භාණ්ඩාගාරයට ගෙවිය යුතු ශේෂය භාණ්ඩාගාර පොත්පත් අනුව තහවුරු කර දෙන මෙන් ලිඛිතව ඉල්ලීම් කළද, එම ශේෂය තහවුරු කිරීමේ ලේඛණ විගණනයට ඉදිරිපත් නොවීය.

1.3 **මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්**

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය

ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, මණ්ඩලය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරිත්වය මණ්ඩලය ඇවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා මණ්ඩලයේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

මණ්ඩලයේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම්,පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16 (1) උප වගන්තිය ප්‍රකාරව, මණ්ඩලයේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව පවත්වනු ලබන විගණනය මත පදනම්ව මණ්ඩලයේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ වගකීම වේ. කෙසේ වුවද, මතය ප්‍රකාශනය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණු හේතුවෙන් මෙම මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් විගණන මතයක් සඳහා පදනමක් සැපයීමට ප්‍රමාණවත් හා උචිත විගණන සාක්ෂි ලබා ගැනීමට මා හට නොහැකි විය.

2. වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුලත් වේ.

- 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 (අ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවන් අනුව, විගණනය සඳහා අවශ්‍ය සියලු තොරතුරු සහ පැහැදිලි කිරීම් මා හට ලබා ගැනීමට නොහැකිවූ අතර, මාගේ පරීක්ෂණයෙන් පෙනී යන ආකාරයට නිසි මූල්‍ය වාර්තා මණ්ඩලය පවත්වාගෙන ගොස් ඇති බව නිශ්චය කිරීමට මා හට නොහැකි විය.
- 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 6 (1) (ඇ) (III) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව මණ්ඩලයේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප බව.

- 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 6 (i) (ඇ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව මෙම වාර්තාවේ 1.2 (ඇ), (උ) සහ 3 (අ), (ආ), (ඌ) නිරීක්ෂණ හැර ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව.

අනුගමනය කරන ලද ක්‍රියාමාර්ග සහ ලබා ගන්නා ලද සාක්ෂි මත හා ප්‍රමාණාත්මක කරුණුවලට සීමා කිරීම තුල, පහත සඳහන් ප්‍රකාශ කිරීමට තරම් කිසිවක් මාගේ අවධානයට ලක් නොවීය.

- 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ12 (ඊ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව පහත සඳහන් නිරීක්ෂණ හැර යම් අදාල ලිඛිත නීතියකට හෝ මණ්ඩලයේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානවලට අනුකූල නොවන ලෙස ක්‍රියා කර ඇති බව.

නීති, නීතිරීති, රෙගුලාසි හෝ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද විධිවිධානවලට යොමුව	විස්තරය
(ඇ) 2016 සැප්තැම්බර් 19 දිනැති අංක 1/2016/(i) දරන ජාතික අයවැය වක්‍රලේඛය	සභාපති නිල රාජකාරී සඳහා කුලී රථ සම්බන්ධයෙන් උපරිම මාසික කුලිය ලෙස රු.200,000 ක් ලෙස දක්වා තිබුණද,සමාලෝචිත වර්ෂයේ මාස 06 ක් සඳහා එම උපරිම මාසික කුලී සීමාව ඉක්මවා අනුමැතියකින් තොරව රු.848,800 ක් ගෙවා තිබුණි.
(ආ) 2015 මැයි 25 දිනැති රාජ්‍ය ව්‍යාපාර වක්‍රලේඛ අංක PED 1/2015	සභාපති නිල වාහනය සඳහා මාසික ඉන්ධන දීමනාව ප්‍රමාණවත් නොවන විශේෂ අවස්ථාවකදී අධ්‍යක්ෂ මණ්ඩලයේ නිර්දේශ සහිතව අදාල රේඛීය අමාත්‍යාංශයේ ලේකම්ගේ අනුමැතිය ලබාගත යුතු වුවත් එසේ අනුමැතියෙන් තොරව රු.482,285 ක් ගෙවා තිබුණි.

(ඇ)	2003 ජූනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර වක්‍රලේඛය	2016, 2017 හා 2018 වර්ෂයන්ට අදාල වාර්ෂික වාර්තා විගණිත දින වන විටත් පාර්ලිමේන්තුවේ සභාගත කර නොතිබුණි.

- 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 (ඌ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව මණ්ඩලයේ සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ අදාළ නිතිරීති වලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර නොමැති බව

3. වෙනත් විගණන නිරීක්ෂණ

(අ) 2018 දෙසැම්බර් 31 දිනට රු.2,748,583,551 ක්වූ ණයගැති ශේෂය තුල වසර 5 කට වැඩි රු.1,526,262,593 ක්, වසර 3 ත් වසර 5 ත් අතර රු.409,217,648 ක්, වසර 1 ත් වසර 3 ත් අතර රු.813,103,310 ක ශේෂ විය. මෙම ශේෂ අයකර ගැනීමට මණ්ඩලය විසින් ප්‍රමාණවත් ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

(ආ) 2018 දෙසැම්බර් 31 දිනට රු.6,971,705,394 ක්වූ ණයහිමි ශේෂය තුල වසර 4 කට වැඩි රු.281,665,114 ක්, වසර 3 ත් වසර 4 ත් අතර රු.6,434,633,563 ක්, වසර 1 ත් වසර 3 ත් අතර රු.5,378,637 ක් හා අවුරුදු 1 ට අඩු රු. 250,028,080 ක ශේෂ විය. මෙම ශේෂ තුළ භාණ්ඩාගාරයට ගෙවිය යුතු රු.6,684,554,538 ක් වූ අතර එම ශේෂ 2019 නොවැම්බර් 30 දින දක්වාම නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි.

(ඇ) 2012 වර්ෂයේදී ක්‍රියාත්මක වූ ඝන්ල් අපනයන වැඩසටහන සඳහා මණ්ඩලය විසින් මිලදී ගන්නා ලද වී තොග පෞද්ගලික වී මෝල් හිමියන්ට ලබා දී ඝන්ල් කර නැවත මණ්ඩලයට ලබාදීමේ කොන්දේසි වලට යටත්ව වී තොග නිකුත් කර තිබුණි. කොන්දේසි ප්‍රකාරව ඝන්ල් හාර නොදුන් මෝල්හිමියන් 06 දෙනෙකුගෙන් අයවිය යුතු රු. 143,735,794ක් අයකර ගැනීම සඳහා අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව වෙත 2014 නොවැම්බර් 21 දින පැමිණිලි කර තිබුණද විගණිත දිනය වන විටත් එම මුදල් අයකර ගැනීමට මණ්ඩලය අපොහොසත් වී තිබුණි. තවත් මෝල්හිමියන් 04 කුගෙන් අයවිය යුතු රු.2,545,126 ක් වාරික වශයෙන් අය කර ගැනීමට 2017 හා 2018 වර්ෂවලදී ගිවිසුම්වලට එළඹ තිබුණද එම

එකහ වූ පරිදි එම මුදල් අයවී නොතිබුණි. ගිවිසුම්වල හා ලිපිලේඛනවල අඩුපාඩුකම් හේතුවෙන් මෝල්හිමියන් 25 කුගෙන් අයවිය යුතු රු.45,485,788 ක් අයකර ගැනීමට එම මෝල්හිමියන්ට විරුද්ධව නඩු පැවරීමට නොහැකි වී තිබුණු අතර තවත් මෝල්හිමියන් 06 කු වෙනින් අයවිය යුතු රු.16,181,975 ක් අය කර ගැනීම සම්බන්ධයෙන් කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි.

(ඇ) පෞද්ගලික වී මෝල් හිමියන් වෙත ණය පදනම් මත වී තොග නිකුත් කිරීමට සමූපකාර හා අභ්‍යන්තර වෙළඳ අමාත්‍යාංශයේ අතිරේක ලේකම්ගේ 2011 අගෝස්තු 22 දිනැති හා CTT/5/6/1/1 අංක දරන ලිපියෙන් අනුමැතිය ලබා දී තිබුණි. වී මෝල් හිමියන්ට වී තොග නිකුත් කිරීමේදී එළඹ තිබුණු ගිවිසුමහි 2.1 වගන්තිය ප්‍රකාරව වී තොග නිකුත් කළ දින සිට දින 60 ක් ඇතුළත මුදල් ගෙවිය යුතු බව සඳහන් වුවද. වී තොග නිකුත් කර මේ වන විට වසර 09 කට අධික කාලයක් ගත වී ඇතත් මෝල්හිමියන් 9 දෙනෙකුට නිකුත් කළ වී කිලෝ 2,900,000 ක් සඳහා රු. 69,955,341ක් අයවීමට පැවතුනි. විගණිත දින වන 2019 නොවැම්බර් 15 දින වන විටත් මෙම මුදල් අයකර ගැනීමට මණ්ඩලය අපොහොසත් වී තිබුණි.

(ඉ) 2017 වර්ෂයේදී මණ්ඩලය විසින් රු.8,970,000 ක් වැය කරමින් කිලිනොච්චිය, නිකවැරටිය හා අම්පාර ප්‍රදේශවල පාලම් තරාදි 03 ක් ඉදිකර තිබුණි. 2019 නොවැම්බර් 15 දින වන විට පාලම් තරාදි ඉදිකර වසර 02 අධික කාලයක් ගත වුවද මෙම පාලම් තරාදි බර කිරීම සඳහා යොදාගෙන නොතිබුණි. ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 2 වැනි පරිච්ඡේදය 2.3.1 (අ) අනුව ආරම්භක පාරිසරික හා සමාජීය බලපෑම් සලකා බැලිය යුතු බව දන්වා තිබුණද එම කරුණු ගැන අවධානය යොමු නොකිරීම හේතුවෙන් කිලිනොච්චිය ආර්ථික මධ්‍යස්ථානය තුල ඉදි කර තිබුණු පාලම් තරාදිය එම ආර්ථික මධ්‍යස්ථානය ක්‍රියාත්මක නොවීම හේතුවෙන්ද, අම්පාර ඉදිකර තිබූ පාලම් තරාදියට පිවිසෙන මාර්ගයේ ලොරිරථ ගමන් කිරීමට නොහැකිවීම නිසා භාවිතයට ගැනීමට නොහැකි වී තිබුණි.

(ඊ) මණ්ඩලය සතුව පැවති ගබඩා 11 ක් සි/ස ලංකා පොහොර සමාගම වෙතද ගබඩා 05 ක් සි/ස කොළඹ කොමර්ෂල් පොහොර සමාගම වෙතද දෙපාර්ශවය අතර බදු ගිවිසුම්කින් තොරව ලබා දී තිබුණු අතර එම සමාගම් වෙතින් කිසිදු බදු මුදලක් විගණිත දින වන විට අයවී නොතිබුණි. තවත් ගබඩා 07 ක් පෞද්ගලික ආයතන වෙත බදු පදනම් මත ලබාදී තිබුණු අතර අදාල බදු කාලසීමාව 2007, 2009, 2010 හා 2011 වර්ෂ වලදී අවසන්ව පැවතියද නව බදු ගිවිසුම්වලට එළඹ නොතිබුණි. එසේ වුවද, එම ආයතන තවදුරටත් ගබඩා පරිශ්‍ර භාවිතා කරමින් පැවති අතර 2019 නොවැම්බර් 15 දිනට එම ආයතනවලින් ලැබියයුතු නිහ කුලිය රු.3,749,288 ක් විය.

(උ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට මණ්ඩලය විසින් ප්‍රධාන රාජ්‍ය බැංකු දෙකක් වෙත ගෙවිය යුතු ණය ශේෂය රු.11,419,664,165 ක් හා එම පොලිය රු.1,227,689,922 ක් වූ අතර බැංකු අයිරාව රු.269,849,649 කි. එවැනි ණය ශේෂ පැවතියදී සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට මණ්ඩලය සතුව රු.377,702,910 ක්වූ ඉතිරි කිරීමේ ශේෂයක්ද, එකතුව රු.283,674,369 ක්වූ බැකු ජංගම ගිණුම් 02 ක ශේෂයක්ද පැවති අතර එම ශේෂ වලින් රාජ්‍ය බැංකු වෙතින් ලබාගෙන තිබුණු ණය පියවීම සඳහා කටයුතු කර නොතිබුණි.

(ඌ) මණ්ඩලය විසින් ඉදිරිපත් කළ 2018 මූල්‍ය ප්‍රකාශන අනුව 2018 දෙසැම්බර් 31 දිනට මණ්ඩලයේ සමුච්චිත අලාභය රුපියල් මිලියන 1,185.1 ක් විය. 2018 වර්ෂයේ මණ්ඩලයේ ඍණ ශුද්ධ වත්කම් ප්‍රමාණය 2017 වසරට සාපේක්ෂව රුපියල් මිලියන 13,266.65 දක්වා එනම් රුපියල් මිලියන 717.96 කින් වැඩිවී තිබුණි. ඒ අනුව භාණ්ඩාගාරයේ මූල්‍ය අනුග්‍රහයක් නොමැතිව ආයතනය අඛණ්ඩව පවත්වාගෙන යාමට නොහැකි තත්ත්වයක් පැවතුනි.

(එ) 2015 වර්ෂය සඳහා මණ්ඩලයේ වාර්ෂික වාර්තාව හා ගිණුම් පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් කෘෂිකර්ම, පශු සම්පත් සංවර්ධන, වාරිමාර්ග යහ ධිවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යවරයා විසින් 2019 ජූලි 05 දින ඉදිරිපත් කළ අමාත්‍ය මණ්ඩල සංදේශයට අංක MF/PE/CM/2019/145 දරන හා 2019 අගෝස්තු 05 දින මුදල් අමාත්‍යවරයා විසින් ලබාදී තිබුණු නිර්දේශ අනුව ක්‍රමානුකූල තොග පාලන පද්ධතියක් කඩිනමින් සථාපිත කළ යුතු බව දක්වා තිබුණද මණ්ඩලය විසින් 2013 වර්ෂයේදී ආරම්භ කළ තොග පාලන පද්ධතියේ කටයුතු තවමත් අවසන් කර නොතිබුණි. 2019 නොවැම්බර් 15 දින වන විට මෙම පද්ධතිය ස්ථාපිත කිරීමේ කටයුතු සඳහා රු.18,328,337 ක් හා ඒ වෙනුවෙන් වූ VPN (Vertical Private Network) ගාස්තු සඳහා 2016, 2017 හා 2018 වර්ෂවලදී එකතුව රු.4,792,595 ක්ද වැය කර තිබුණි. 2019 අගෝස්තු 20 දින මණ්ඩලය විසින් නැවත පරිගණකගත තොග පාලන පද්ධතියක් සථාපිත කිරීම සඳහා ශ්‍රී ලංකා පදනම් ආයතනය සමඟ ගිවිසුම්ගතවී තිබුණු අතර ඒ සඳහා අත්තිකාරම් වශයෙන් රු.360,000 ක් ගෙවා තිබුණි. ඒ අනුව 2013 වර්ෂයේ සිට 2018 වර්ෂය දක්වා වැය කළ රු.23,120,932 නිශ්කාර්ය වියදමක් බව නිරීක්ෂණය විය.

(ඒ) 2018 වර්ෂයේ සිදුකළ වී තොග සත්‍යාපනයේදී හඳුනා ගත් තොග ඌණතාවය කිලෝ ග්‍රෑම් 85,933,454 ක්වූ අතර එහි වටිනාකම රු.3,047,107,163 කි. ඉන් ඉඩදිය හැකි තොග අඛ්‍යමාන ප්‍රමාණය හැර ඉතිරි ඌණතාවයන්ට සම්බන්ධ තොග භාරකරුවන් හඳුනාගෙන අදාල වටිනාකම් ඔවුන්ගෙන් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

ඩබ්ලිව්.පී.සී.වික්‍රමරත්න

විගණකාධිපති